

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 අප්‍රේල් 27 වන බදාදා
දෙවන කාණ්ඩය විසි එක්වන කලාපය
මිල රු. 50 යි

## මේ වෙලාවේ මේ ආණ්ඩුවට හැර සක්කරයටවත් රට ගොඩ දාන්න බැහැ

සංස්කෘතික හා ප්‍රසංග කලා රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ

## කෝටි අලිමංකඩ අල්ලපු දවසේ LTTE ලොක්කියෙකුට හමුදාවේ අයගේ එක දේකට ආස හිතිලා

## බලන්ගොඩ පෙරහැර බලන්න රක්ෂණ නිලධාරීන්ට එන්න කියපු ප්‍රසිද්ධ ඇතා කවුද?

## ඒරොප්පේ අයගේ ගැලවුම්කාරයා අපෙත් ගැලවුම්කාරයා කරගන්න හැටි

ධරණී
ශ්‍රී ලංකාවේ
අංක එකේ
කාන්තා
පුවත්පත

නිරූපණ උපදේශිකා
ත්‍රිකලා ධරණී

■ ඡායාරූපය -
ක්‍රිෂාන් කාරියවසම්

# සම්ප්‍රදායික උඩරට මනාලියක ලෙසින් හැඩවූ පිරිපුන් යුවතියක්

**සාරි ජැකට් එක පවා අපි නිර්මාණය කර ගත්තේ සම්ප්‍රදායික බව රැකෙන ආකාරයට. මෙතැනදී ඔසරියට වඩාත් ගැළපෙන ආභරණ කට්ටලයක් තමයි භාවිත කළේ**



පිරිපුන් සිරුරකින් යුක්ත යුවතියට ගැළපෙන විදියට සාම්ප්‍රදායික උඩරට මනාලියක් තමයි මේ හැඩගන්වලා තියෙන්නේ.

පිරිපුන් සිරුරක් හිමි ඇයට පැහැපත් සමකුත් තියනවා. මේ නිසා ඕනෑම විලාසිතාවකට ඇගේ රූපය ඉස්මතු කරලා ගන්න පුළුවන්.

ඇගේ පැහැය, උස සියල්ලටම ගැළපෙන විදියට ඇයව හැඩ කරන්නට අවශ්‍ය වූ නිසා ඔසරිය නිර්මාණය කරන්න අරගෙන තියෙන්නේ බ්‍රොකේට් මෙටිරියල් එකක්. සාරි ජැකට් එක පවා මෙතැනදී අපි නිර්මාණය කර ගත්තේ සම්ප්‍රදායික බව රැකෙන ආකාරයට. මෙතැනදී ඔසරියට වඩාත් ගැළපෙන ආභරණ කට්ටලයක් තමයි භාවිත කළේ.


ඒ වගේම මේ මනාලියට බ්‍රවුන් පැත්තට බර මේකප් එකක් තමයි යොදා ගත්තේ. එහෙම කළේ ඇයගේ ඔසරිය, ආභරණ හා මල් කළඹට උචිත අන්දමින්.

එමෙන්ම මනාලියගේ සරල බව රැක ගැනීමට උත්සාහ කළා. හැබැයි ඇගේ ඇස් දෙක තරමක් කැපී පෙනෙන විදියට ඉස්මතු කරන්නත් අමතක කළේ නැහැ.









මනාලිය හැඩගැන්වීම - රූපලාවන්‍ය ශිල්පිනී
**මල්ෂි ජයතිලක**
සැලෝන් මල්ෂි - පොලොන්නරුව



ඡායාරූප -
**කසුන් අබේසිංහ**

සම්බන්ධීකරණය -
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**
0763113839






# මනාලියන් හැඩගැන්වීමට පෙළපොතක්

විවාහය කියන්නේ මනුස්සයෙක්ගේ ජීවිතේ දෙවැනි උපතයි කියලා කතාවක් තියෙනවනේ. ඉතින් පති පතිනියන් දිවි ඇතිතුරා එකට ජීවත් වීමට බැඳෙන ඒ වගේම පරම්පරා දෙකක් එකට එක්කාසුවෙන මේ දවස මංගලශ්‍රීයෙන් සමරන්නේ අදක ඊයෙක ඉඳලා නෙමෙයි. අනාදිමත් කාලෙක ඉඳලා සිංහලයෝ සිරිත් විරිත් චාරිත්‍ර මැද්දේ මංගල උත්සව මහ ඉහළින් සමරලා තියෙනවා. ඒ නිසාම ලාංකික අපිටම ආවේණික වෙච්චි මංගල සිරිත් විරිත් සහ ඇඳුම් පැළඳුම් අපිට උරුම වෙලා තියෙනවා. තමාටම ආවේණික වෙච්චි මඟුල් සිරිත්, ඇඳුම් පැළඳුම් තියෙන රටවල් අතේ ඇඟිලි ගාණටත් අඩුයි. ඒ වගේ අනන්‍යතා බිහිවෙලා තියෙන්නේ දීර්ඝ ඉතිහාසයක් එක්ක බිහිවුණු ශිෂ්ටාචාරගත රටවලට විතරයි කියන එක මහ ආඩම්බරෙන් කියන්න ඕන කාරණාවක්.

ඉස්සර මඟුල් ගෙදරක මනමාලිව ලකලෑස්ති කරන්න ගමේ වැඩිහිටි නැන්දලා අත්තම්මලා උදෑහැනැක්කේම මනමාලිගෙ ගෙදරට ගොඩවෙනවලු. පස්සේ මනමාලිට ඔසරිය අන්දලා, හංසපූට්ටු මාලේ, පදක්කම් මාලේ, අගස්ති මාලේ ඇතුළු ආභරණ ටික පළඳවලා ඇයව හැඩකරන්නේ ඔවුන්. ඔය හැම ආභරණයකින්ම යුගදිවියේ සාර්ථකත්වය ගැන සංකේතවත් කෙරෙන බව දැන් කාලේ ගොඩක් අය දන්නෙත් නැහැ. සාම්ප්‍රදයානුකූල විදිහට පාවඩ එළලා, ජයසක්වල හඬකරලා කරන මඟුල් තුළා දැන් හරි අඩුයි. විවාහක යුවළ පෝරුමස්ථක කරන චාරිත්‍රය නම් අදටත් බොහෝ තැන්වල සිද්ධවෙනවා. හැබැයි යුවළක් පෝරුගත වෙන්නේ ඇයි කියන එක වගේම ඒ චාරිත්‍ර ආශ්‍රිත සංකල්පමය තේරුම් ගැනත් ගොඩදෙනා නොදැනුවත්.




මංගල පාර්ශව විතරක්ම නෙමෙයි මනාලියන් හැඩගැන්වීමේ ක්ෂේත්‍රය තුළ ඇතැම් අයත් මේ බොහෝ දේවල් ගැන නොදැනුවත්. ඒ නිසාම දැන් මනාලියන් හැඩගැන්වීමේ ක්ෂේත්‍රයේ පදනම් විරහිත නවීකරණයවීම් දකින්නට ලැබෙනවා. ඉතින් සංස්කෘතික අංගයන් රැකගන්න ගමන් රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවට රුකුලක් වෙන්න ඕනේ කියලා අපේ රටේ ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනියකට අදහසක් පහළ වෙනවා. ඒ වෙනුවෙන් ඇය කරන්නේ මනාලියන් හැඩගැන්වීමේ ක්ෂේත්‍රයේ අයනු ආයනු ගළපලා පොතක් ලියන්න හිතන එක. ඇය ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී හසිනි ගුණසේකර.

මීට දශක කිහිපයකට කලින් මනාලියක් හැඩගැන්නුවේ මනාලියගේම පිරිස කියලා කිව්වානේ. ලංකාවේ මෙන්න මේ සම්ප්‍රදය වෙනස් කරලා රූපලාවණ්‍ය ක්ෂේත්‍රයට මනාලියන් හැඩගැන්වීමේ අංශය හඳුන්වලා දෙන්නේ ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පී හැරිස් විජේසිංහ. එවැනි දැවැන්තයකු සමඟ අත්වැල් බැඳගනිමින් තමයි ඇය මේ පොත රචනා කරන්නේ.

ඔවුන් දෙදෙනාට අමතරව ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී දීපිකා ගුණසේකර සහ ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පී ධනංජය බණ්ඩාරත් මේ පොතේ කර්තෘවරුන්. මනාලියක් වෙන්න ඉන්න යුවතියකට සහ රූපලාවණ්‍ය ඉගෙනගන්න අයට විතරක්ම නෙමෙයි සම්ප්‍රදයන්, සිරිත් විරිත් ගැන දැනුම එකතු කරගන්න කැමති අයට සහ ඡායාරූප ක්ෂේත්‍රයට පිවිසෙන්න ඉන්න එයටත් මේ ග්‍රන්ථය බොහොම වටිනවා. 2022 අප්‍රේල් 21 සිනමන් රෙඩ් හෝටල් පරිශ්‍රයේදි 'මනාලියන් හැඩගැන්වීමේ පෙළ පොත' කියන මේ වටිනා කියන පොත එළිදැක්වුණා. පිරුණු කලේ දිය සැලෙන්නේ නැහැනේ. ඉතින් රූපලාවණ්‍ය ක්ෂේත්‍රයට එන්න බලාපොරොත්තු වෙන කෙනෙක් නම් මේ පොත කියවන එක වටීවි. ඉගෙනගැනීම, ආයතනයක් ආරම්භ කිරීම, මූල්‍ය කළමනාකරණය වගේ හැම දෙයක්ම අන්තර්ගත නිසා මේක රජයේ NVQ පාඨමාලා සඳහා අත්පොතක් විදියටත් තෝරාගෙන තියෙනවා.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# මේ වෙලාවේ මේ ආණ්ඩුවට හැර සක්කරයටවත් රට ගොඩ දාන්න බැහැ



**සංස්කෘතික හා ප්‍රසංග කලා රාජ්‍ය අමාත්‍ය ගීතා කුමාරසිංහ**

**ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ මහත්මිය පසුගියදා සංස්කෘතික හා ප්‍රසංග කලා රාජ්‍ය අමාත්‍ය ධුරයේ දිවුරුම් දුන්නාය. වත්මන් ආර්ථික අර්බුදය හමුවේ රට පත්ව ඇති අභියෝග ගැනත්, එවන් අවස්ථාවක ලැබුණු රාජ්‍ය අමාත්‍ය ධුරය ගැනත් ඇය හා කළ කතාබහක් ඇසුරින් මෙම ලිපිය සැකසේ.**

**ඔබ කාලයක් තිස්සේ අමාත්‍ය ධුරයක් ලැබෙනකල් බලා හිටියා. දැන් එය ලැබිලා. මොනවද ඒ ගැන හිතෙන්නේ?**

ඇත්තටම මෙය කටු ඔටුන්නක් විතරයි. මේ ඇමතිකම දවසද දෙකද, මාස හයද, අවුරුද්දද කියන්න මම දන්නේ නැහැ. හැබැයි මට කළ හැකි දෙයක් තියෙනවා. ඒ වෙනුවෙන් මැරීගෙන වැඩ කරන්න මට පුළුවන්. සමහරු කියනවා ඇමතිකමකට අඬ අඬා හිටියා කියලා. ඔව් ඒක ඇත්ත. මොකද මට විතරයි ලැබෙන්න ඕන වුණත් ඇමතිකමක් නොලැබුණේ. මම මගේ ද්විත්ව පුරවැසිභාවය අයින් කරගත්තේ දේශපාලනයේ පෙරට තිබ්බ පය පස්සට ගන්න නෙවෙයි. මම වැඩ කරන්න කැමැතියි. ඒ මට පෞද්ගලිකව මුදල් උපයන්න නෙවෙයි. දේශපාලනයෙන් මට හම්බකරගන්න දෙයක් නැහැ. කලාව සම්බන්ධ අමාත්‍ය ධුරයක් ලැබුණට සතුටුයි.

**ඒ වුණාට ඔබ ඇතුළු පිරිසට අමාත්‍ය ධුර ලැබුණේ මුදලට කියලත් චෝදනාවක් නැගුණා?**

ඔව්. ඔය චෝදනාව පාර්ලිමේන්තුවේදී කළේ මගේ හිතවත් මන්ත්‍රීවරයෙක් වන නලින් බණ්ඩාර මහත්තයයි. ඩොලර් මිලියන දෙකක් දීලා කියලා ඔහු කිව්වා. ඒක පට්ටපල් බොරුවක්නේ. රටේ ඩොලර් නැති වෙලාවක එහෙම කතාවක් කිව්වේ ඇයි මල්ලි කියලා මම පස්සේ ඔහුගෙන් ඇහුවා. ඔහු හිනාවෙලා කිව්වා නිකමට කිව්වේ කියලා.

ඇත්තම කිව්වොත් ඇමතිකමට දිවුරුම් දුන් වෙලාවේ ලැබුණු කේක් කෑල්ලයි, ප්ලේන්ටියයි හැර මුකුත් ලැබුණේ නැහැ. අපි එහෙම දේවල් බලාපොරොත්තු වුණෙත් නැහැ. මේ වෙලාවේ මේ වැටුණු වලෙන් රට ගොඩදාන්න පුළුවන්ද කියලා බලනවා ඇරෙන්න තව වෙන මොනවද? සමහරුන්ට වගේ මේ අභියෝගාත්මක මොහොතේ අහක බලන්න මට බැහැ. ඒක මනුස්සකම නෙවෙයි. වැටුණු තැනින් රට ගොඩදාන්න පුළුවනුත් මේ ආණ්ඩුවට විතරයි.

**ඔබ එහෙම කිව්වට ජනාධිපතිවරයා, අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවට ගෙදර යන්න කියලා නැගෙන විරෝධතා එන්න එන්නම වැඩිවෙනවා?**

එහෙම ගෙදර යවලා මේ රට මේ තියෙන තැනිනුත් අගාධයට තල්ලුකර හරින්න පුළුවන්ද? කාටද ඊටපස්සේ රට බාරදෙන්නේ? තරුණ ප්‍රජාව, ප්‍රජාතන්ත්‍රවාදී විදියට තමන්ගේ අරමුණ පාර්ලිමේන්තුව තුළින් දිනාගැනීම හැර වෙන විකල්පයක් නැහැ. ඊට ඔවුන්ට ටික කලක් බලා ඉන්න වෙනවා.

**ඒ වගේම ආණ්ඩුව උත්සාහ කරන්නේ මේ අර්බුදවලට කෙසේ හෝ විසඳුම් සොයන්නයි. ඒ අර්බුදයේ තරම හොඳින් දන්නේ ඔවුනුයි. මේ මොහොතේ ඊට විසඳුම් සෙවිය හැක්කේත් මේ ආණ්ඩුවට පමණයි.**

අයි.එම්.එෆ්. එකේ සහාය ලබාගැනීමට අපි මේ දිනවල සාකච්ඡා කරමින් ඉන්නේ.

රඹුක්කන සිදුවීම වැනි සිදුවීම් ඉතාම කණගාටුදායකයි. එවැනි දේ දැක්කම ජාත්‍යන්තරය අපේ රට ගැන ගන්න චිත්‍රය සුබවාදී නැහැ.

ජනාධිපතිතුමා කියලා තියෙන්නේ සාමකාමීව විරෝධතා දක්වන්න අයිතිය ඕන අයෙකුට තියෙනවා කියලයි. සමහරුන්ට අවශ්‍ය රටේ බරපතළ තත්ත්වයන් නිර්මාණය කරලා, ඒවා ජාත්‍යන්තරයට යවලා අමාරුවෙන් ගොඩදාගන්න හදන ආර්ථිකය තවත් පොළොවට සමතලා කරලා දාන්නයි. මැති ඇමතිවරු හොරකම් කළා කියලා චෝදනා කරනවා.

**මේ ඇමතිකමේ ආයුෂ දවසද, දෙකද, අවුරුද්දද කියනෙක මට වැදගත් නැහැ. මම වැඩ කරනවා**

**සල්ලිවලට ඇමති ධුර ගත්තා කිව්වට අපිට ලැබුණේ කේක් කෑල්ලයි ප්ලේන්ටියයි විතරයි**

**මටත් ස්වාධීන වෙන්න කතා කළා. මම බෑ කිව්වා**

**සර් ඕක කරන්න එපා කියලා මම එදත් ජනාධිපතිතුමාට කිව්වා**

මම නම් කියන්නේ එහෙම චෝදනාවක් ආවොත්, ඒ ඇමතිවරයාව පහුවදාම ගෙදර යවන්න ඕන. එහෙම ප්‍රතිපත්තියකට එන්න ඕන. අද තරුණයෝ හඬ නගලා ඉල්ලන්නෙත් ඒකයි.

**තරුණයෝ අද පාර්ලිමේන්තුවේ 225ටම ගේන්නේ එකම චෝදනාව. හැමෝටම හොරු කියලයි ඔවුන් කියන්නේ?**

මම නම් මගේ වත්කම් බැරකම් පිළිබඳ වාර්තාවක් පසුගියදා කතානායකවරයාට දුන්නා. මේ ඇමතිකම් නිසා අයථා ලෙස රුපියලක්වත් උපයාගන්න මට ඕන නැහැ. අපි හරි විදියට වැඩ කළොත් අපායත් සුරලෝකයක් කරන්න පුළුවන්. මට දේශපාලනයේ වසර දහතුනක අත්දැකීම් තියෙනවා.

ඇගලුම් ආයතන කිහිපයක් බොහොම සාර්ථකව මම පරිපාලනය කළා. ආයතන පරිපාලනය ගැන දෙස් විදෙස් පුහුණුව ලැබුවා. මට ඕන මේ රට වැටිලා තියෙන තැනින් නැගිටිනවා දකින්නයි. චෝදනා ඇතත් නැතත් තමන්ගේ වත්කම් බැරකම් ගැන ප්‍රකාශයක් දෙන්න හැටෝම්ට පුළුවන් වෙන්න ඕන. හරි වැරදි හදන් අපි යමු.

**හරි වැරදි හදාගෙන යනවා කිවවත්, එතකොට රට වැටෙන්න ඕන කණගාටුදායක තැනට වැටිලා. පොහොර ප්‍රශ්නයත් එවැන්නක්?**

මම නම් එදත් කිව්වා. අදත් කියනවා. ගොවියට රසායනික පොහොර ටික ලබාදිය යුතුයි. ජනාධිපතිතුමාට කාබනික පොහොර ගැන විවිධ අය උපදෙස් දෙද්දිත් මම කිව්වේ සර් ඔය තීරණේ නම් ගන්න එපා කියලයි.

දැන් හරි, ගොවියට පොහොර ටික ලබාදෙන තීරණයට ආ එක හොඳයි. මොකද බත් ටිකක් කන්න නැත්නම් කැඳ ටිකක් බීලා හරි ජීවත්වෙන්න අපට සහල් ටික තියෙන්න ඕන. ගොවියගේ දුක ගමේ ගොඩේ ඇවිදිද්දි මම හොඳින් දැක්කා.

මෙතැනදි ජනාධිපතිතුමාට විතරක් චෝදනා කරලා තේරුමක් නෑ. එහෙමනම් අමාත්‍ය මණ්ඩලයක් ඉන්නේ මොකටද? මහබැංකු අධිපති කෙනෙක් ඉන්නේ මොකටද? ඒ අයත් මේ රටේ කඩාවැටීමට සම්පූර්ණයෙන් වගකිව යුතුයි. දුෂ්කර තත්ත්වයක් එද්දි ඇඟ බේරාගැනීම නෙවෙයි වැදගත් වෙන්නේ.

**ඇඟ බේරාගැනීම කියලා අදහස් කරන්නේ මොකක්ද?**

රට ගිනි ගනිද්දි ඒ ගින්න තවත් අවුළුවන්න අපට බෑ. මටත් කිව්වා අපේම අය පාර්ලිමේන්තුවේ අපි ස්වාධීන වෙමු කියලා. මම කිව්වා නෑ එහෙම වෙන්න අවශ්‍ය නෑ කියලා. බැරෑරුම් මොහොතේ අතහැරලා දාන එක නෙවෙයි වෙන්න ඕන අභියෝගයට මුහුණ දෙන එකයි. මේ වැටුණු තැනින් රට ගොඩදාන්න ශක්‍රයාටවත් බෑ මේ ආණ්ඩුවට හැර.

කවුද ඉන්නේ රට බාරගන්න? එහෙම ඡායාවක්වත් පේනවානම් බය නැතුව අපිට රට බාර කරලා ගෙදර යන්න පුළුවන්. ආණ්ඩුවට තව ටික කාලයක් දෙන්න. මගේ රටේ ගෘහනියෝ ගෑස් ටික නැතුව, විදුලිය නැතුව විඳින දුක මටත් දැනෙනවා. මමත් කළුවරේ ඉන්නවා. මම මේ ඇමතිකම ගත්තෙත් මගේ සහෝදර කලාකරුවන් වෙනුවෙන් යමක් කරන්න.

**ඒ කලාකරුවන්ගෙන් සෑහෙන පිරිසක් මේ වෙනකොට ඉන්නේ අරගල භූමියේ?**

ඔව්. හැමදෙනාටම රටේ ප්‍රශ්න අඩු වැඩි ලෙස බලපානවා. කලාකරුවෝ කියලත් වෙනසක් නැහැ. සාමකාමීව අරගල කරන්න තමන්ගේ මතය ප්‍රකාශ කරන්න ඔවුන්ටත් අයිතිය තියෙනවා. ඔවුන් දන්නවා, ගොල්ෆේස් එකේ අරගල කළාට ජනාධිපතිවරයා ඉවත් කරන්න බැහැ කියලා. ඊට පාර්ලිමේන්තුව තුළින් විසඳුමක් ලබාගත යුතුයි. එහෙම නැතුව මේ යාන්තමට හරි අල්ලගෙන ඉන්න ආර්ථිකය කඩාකප්පල්කාරී වැඩ කරලා පොළාවටම සමතලා කරලා දාන්න රට ගැන ආදරයක් තියෙන කාටවත් බැහැ.

**දීපා වසන්ති එදිරිසිංහ**

අද ලිපියට හොඳ මාතෘකාවක් ගැන කල්පනා කරනකොට විවාහ ජීවිත ඇතුළේ බොහෝදෙනා පීඩාවට පත්කරන සංකීර්ණ ගැටලුවක් ගැන මගේ මතකයට ආවා. කියන්න උදහරණ ඕන හැටියට තිබුණත් මීට වසරකට දෙකකට පෙරාතුව මට මුණගැහුණු සඳමාලිගේ කතාව ඒකට වඩා සුදුසුයි කියලා හිතුණා.

සැමියා නිසා ඇතිවෙච්චි මානසික පීඩාවකට උපදේශනය ලබාගන්න කියලයි ඇය මගේ ළඟට ආවේ. හැබැයි කතා කරපු පළවෙනි වචනෙන් දෙකෙන්ම ගැටලුව තියෙන්නේ සැමියාට නෙමේ ඇයට කියන එක මට පැහැදිලි වුණා. ඒ නිසා සැමියාත් එක්කම ඇවිල්ලා දවසක මාව මුණගැහෙන්න මම යෝජනා කළා. ඒ අනුව මේ යුවළ නැවතත් පසුදිනෙක මාව මුණගැහෙන්න ආවා. එතැනදි මම මුලින්ම කතා කළේ සඳමාලිගේ සැමියත් එක්ක.

**පරණ කුණු ගොඩවල් අදින්න ගියොත් දික්කසාදෙන් නෙවෙයි මරණෙන් කෙළවර වෙන්නත් පුළුවන්**

ඔහුගේ නම වසන්ත. යෝජිත විවාහයකින් මුණගැහුනට මේ යුවළ විවාහයට කලිනුත් මාස පහ හයක් කතාබහ කළාලු. ඉතින් ඔය කාලේදි දෙන්නා සෑහෙන දේවල් ගැන කතාබහ වෙලා තියෙනවා. සඳමාලිට ඊට කලින් ප්‍රේම සම්බන්ධතා තිබිලා නැහැ. හැබැයි වසන්තට අවුරුදු ගණනාවක සම්බන්ධයක් තිබුණාලු. නමුත් ඒ යුවතිය පස්සෙ ගෙදරින් හොයලා දීපු මංගල්‍යයකට කැමති වෙලා. ඉතින් ඒ සම්බන්ධය ගැන සඳමාලි නිතරම හාරවුස්සමින් විස්තර අහලා. බොහොම සුහදශීලී විදිහට ඇහැව්ව නිසා ඔහුත් පැකිළීමක් නැතිවම විස්තර කියලා. ඒ සම්බන්ධය ඇතුළේ ලිංගික සබඳතා තිබුණද කියලත් ඇය ඔහුගෙන් අහලා තියෙනවා. තමන් විවාහ වෙන්න ඉන්න කෙනාට බොරු කියන්නේ මොකටද කියලා හිතුව වසන්ත කලින් සබඳතාවය ඇතුළේ ලිංගික එක්වීම් පවා තිබුණු බව ඇයට කියලා.

විවාහ වෙන්න කලින් සඳමාලි ඒ ගැන වසන්ත එක්ක නැවත කතා කරලා නැහැ. ප්‍රශ්න සේරම ඇති වුණේ විවාහයෙන් පස්සෙලු. විවාහයෙන් පළවෙනි දවසේත් සඳමාලි වසන්ත එක්ක ලිංගිකව එකතු වුණේ කැමත්තකින් නොවන බව ඔහුට තේරුණාලු. ඒ ගැන ඇහුවම ඇය ඔහුගේ පරණ සම්බන්ධය ගැන මතක් කරලා තියෙනවා. එතැන ඉඳලා නිතර නිතර ඇය වසන්තගේ පරණ ලිංගික සම්බන්ධතා ගැන කියෙව්වලු.

ඔහු එක්ක එකතු වෙන වාරයක් පාසා ''අරයත් එක්කත් ඔයා මෙහෙම ඉන්න ඇති නේද?'' කියලා ඇය අහනවලු. සමහර අවස්ථාවලදි මේ කාරණාව ගැන කියලා ඇය එක්වීම් මගහැරලා. එක්වීම්වලදි බිරිඳ මේ කාරණාව මතක් කරන එක වසන්තටත් මානසික පීඩාවක් වෙලා. ඒ නිසාම පස්සේ පස්සේ ඔහුත් ලිංගික එක්වීම්වලට ලොකු උනන්දුවක් දක්වලා නැහැ. මගේ ළඟට පැමිණෙනකොටත් මේ යුවළ ලිංගික සබඳතා සම්පූර්ණයෙන්ම වගේ නතර කරලයි තිබුණේ.


මේ බිරිඳ මගේ ළඟට ආවේ ඇගේ ගැටලුවකට උපදේශන ගන්න කියලා මම කිව්වනේ. සැමියා එක්ක එකතු වෙනකොට පරණ පෙම්වතිය එක්කත් ඔහු මෙහෙම ඉන්න ඇති නේද කියලා විවිධ දේ හිතෙන එක තමා ඇයට තිබුණු ගැටලුව. ඇත්තටම ඒක ඇයටත් පීඩාවක් වෙලයි තිබුණේ. ඉතින් දෙන්නා එක්කම ටික වෙලාවක් කතාබහ කරලා කරුණු පැහැදිලි කරලා ඒ ප්‍රශ්නේ විසඳන්න මට පුළුවන් වුණා.

# ඉඟනෙරියේ රැලි සැදුවේ හිමි සඳුනේ මගෙ විතරද
# කියලා අහන්න එපා

සැමියගේ නැත්තම් බිරිඳගේ පරණ ලිංගික සම්බන්ධකම් ගැන මතක් කර කර ඒ අයව මානසිකව පීඩාවට පත් කරන උදවිය මේ සමාජයේ සුලබයි. ''මම බොහොම විවෘත කෙනෙක්, සුහද කෙනෙක්'' කියන ප්‍රතිරූපය මවලා තමයි ගොඩක් අය ඔය කාරණාව දැනගන්නේ. ඒත් ඉතින් කෙනෙක් ඇත්ත කිව්වට පස්සේ විනාශයි. නිසි වයසට ආවට පස්සේ තරුණ යුවළක් ලිංගික සබඳතාවයක් පවත්වනවා කියන්නේ දරුණු අපරාධයක් නෙමෙයි. සමහරවිට ඔය ප්‍රශ්නේ අහලා අනිත් කෙනාව පීඩනයට ලක්කරන කෙනාත් එවැනි සබඳතා පවත්වලා තියෙන්න පුළුවන්. හැබැයි ඔහුට හෝ ඇයට ඕනේ අනිත් කෙනාගේ වරදක් හොයාගන්න විතරයි. ඒක හරියට වීදුරු ගෙවල්වල ඉඳන් ගල් ගහනවා වගේ වැඩක්. ''මුදු මුහුණේ සුව දැනුණේ පිය ළඳුනේ මට විතරද - ඔබේ සුසුමේ සුව වින්දේ හිමි සඳුනේ මං විතරද'' කියන සිංදුවෙන් කතා කරන්නෙත් අන්න ඒ ගැනනේ.

මනෝ උපදේශිකාවක් විදිහට මම නම් කියන්නේ තමන් විවාහ වෙන්න ඉන්න කෙනාගෙන් වුණත් ඒ වගේ අතිශය පෞද්ගලික කාරණා ගැන අහන එක අශීලාචාරයි. ඉතින් කෙනෙක් එහෙම අහන එක ඇතුළෙම ප්‍රශ්නයක් තියෙනවා කියන එක තේරුම් ගන්න බුද්ධිමත් වෙන්න.

ගැහැනු පාර්ශවයට වඩා මේ වැඩේ කරන්නේ පිරිමි. විවාහයෙන් පළමු එක්වීමෙදි කන්‍යාභාවය ඔප්පු කරන්න බැරි වුණා කියලා පහුවෙනිද දික්කසාදෙට පිඹුරුපත් හදන මහත්වරු ඉන්නවා. මේ කාරණාව නිසාම බිරිඳගේ මුළු ජීවිතේම අපායක් කළ සැමියන් මට මුණගැහිලා තියෙනවා. සැමියා/බිරිඳ සම්බන්ධ මේ වගේ කාරණා යාළු මිත්‍රයින්ට නෑදෑ හිතවතුන් එක්ක කිය කිය ඒ අයට අපහාස කරන අයත් ඔය ඕනතරම් ඉන්නේ. ඒ වගේ ගැටලු ඇතිවෙද්දි විවාහයට කලින් ලිංගික සබඳතා පැවැත්වුවාය කියලා ඇතැම් කාන්තාවන් වරදකාරී හැඟීම් ඇති කරගන්නවා. ඒ නිසා සැමියගෙන් ලැබෙන අඩත්තේට්ටම්වලට ඔවුන් සුදුසුයි කියලාත් ඒ සමහර අය පිළිගන්නවා.




මේවා සරල ගැටලු නෙමෙයි, සමාජයේ තියෙන සංකීර්ණ ප්‍රශ්න, මානසික අපයෝජන. පරණ දේවල් මතක් කර කර මානසිකව බලපෑම් කරන එකෙන් විවාහ ජීවිතේ අවුල් වෙනවා විතරක් නෙමේ විශාදය, කාංසාව වගේ තත්ත්වයක් ඇතිවෙලා පීඩනයට ලක්වෙන කෙනා සියදිවි නසාගන්න වුණත් බැරි නැහැ. අනික පීඩනයට ලක් කරන කෙනාටත් මේක පීඩනයක්. ඔහු සහකරුවාව පීඩනයට ලක්කරන්නෙම සහකරුවගේ පෙර ලිංගික සබඳතා මහා අපරාදයක් කියලා ඇති කරගන්න පීඩනය නිසාමයි.

**වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා**

අනික හිතන්නකෝ කෙනෙක් තමන්ගේ සහකරුවව විශ්වාස කරලා ඒ වගේ දෙයක් කිව්වම ඔහු හෝ ඇය කරන්නේ ඒක හෝද හෝද මඩේ දන එක නම් අර බිරිඳ හෝ සැමියා ආයෙත් අර පුද්ගලයව විශ්වාස කරලා දෙයක් කියයිද? එතැනින් එහාට ඒ සම්බන්ධය ඇතුළේ ඇති වෙන්නෙම බොරුව, බය, අවිශ්වාසය වගේ දේවල් විතරනේ.

මේ ලිපියෙන් මට මතු කරන්න ඕනේ මෙච්චරයි. ලිංගිකත්වය කියන්නෙත් ස්වභාවික මනුස්ස අවශ්‍යතාවයක්. හරියට කනවා බොනවා වගේ. ඉතින් තමන්ගේ සහකරුවගේ සහකාරියගේ යල් පැනගිය පරණ කතා හාරවුස්සන එක වර්තමාන ජීවිතේ විනාශ වෙන්න හේතු වෙනවා. අතීතයේ කතා අතීතයේම වළදන්න. ඉස්සරහට යද්දි ඕවා පොදි ගහන් ඔලුවේ තියාගෙන යන එක ඔලුවට මහ බරක්. ඒත් කෙනෙක් එහෙම යන්න හදනවා නම් හැකි ඉක්මනට ඔහුට හෝ ඇයට මනෝ උපදේශනය ලබාදෙන්න. ඒ හරහා එවැනි දේ පහසුවෙන්ම යටපත් කරන්න පුළුවන්.



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
රත්නා පුෂ්ප කුමාරී

සෙව්වන්දි හෙට්ටිආරච්චි



OTTO®
BATHWARE
පවතී සැමදා
දිවයින පුරා ප්‍රදර්ශනාගාර හා අලෙවි නියෝජිතයන්
ක්ෂණික ඇමතුම්: 0706 570 570
info@ottobathware.com | ottobathware.com



# “වන්දි එපා! තාත්තා වෙනුවෙන් සාධාරණයක් කරන්න”

මෙවර සිංහල අලුත් අවුරුද්ද ගෙවී ගියේ හිත්වල එහෙමට සතුටක් නැතිවය. ඊට හේතුවූයේ ජීවන බරට එරෙහිව රටපුරා හිස ඔසවමින් තිබූ විරෝධතා රැල්ලයි. මේ නිසාම අවුරුදු නොතිබුණත් අවුරුදු උදාවෙද්දී ඇතැමුන් සිටියේ ඉන්ධන පෝලිම්වල හෝ විරෝධතා බිමේය.

අප්‍රේල් 19 වැනිදා රඹුක්කනට හිරු පහන් වූයේද එවන්ම ඉන්ධන ගැටලුවක් නිසා ප්‍රදේශයම රත් කරමිනි. ඒ රස්නය එදින සවස් වෙද්දී ජීවිතයක් අහිමි කරමින් තවත් පිරිසක් රෝහල් ගත කරමින් නිමාවූයේ බලාපොරොත්තු නොවූ ලෙස රට කළඹමිනි. ඉන් දරු දෙදෙනකුට ආදරණීය පියෙක් අහිමි වූයේ තැන තැන ආන්දෝලනාත්මක කතාබහක් ඉතිරි කරමිනි.

**“මගේ තාත්තා වරදක් කරපු කෙනෙක් නෙමෙයි. තාත්තා උදේම ෂෙඩ් එකට ගියේ බයික් එකට පෙට්‍රල් ගහගෙන එන්න. එතන කලබලයක් තිබුණට තාත්තා ඒවට මැදිහත් වෙන කෙනෙක් නෙවෙයි. කලබල වෙලාවේ තාත්තා බයික් එක අරන් එන්න හදලා තියෙන්නේ. ඒත් ඊට කලින් තාත්තට වෙඩි තියලා.”**

ඒ රඹුක්කන විරෝධතාව අතරතුර පොලිස් වෙඩි තැබීමෙන් ජීවිතක්ෂයට පත්වූ නාරම්බැද්ද, හිරිවඩුන්නේ පදිංචිව සිටි චමින්ද ලක්ෂාන් (42) ගේ දියණියයි.

**“මම තාත්තට එදා කිහිප වරක් කෝල් කළා. හවස කතා කළාම තාත්තා කතා කළේ නැහැ. කලබලේ ගැන දැනගත් නිසා මගේ හිතට බයක් දැනුණා. ඉස්පිරිතාලෙට ගියාමයි දැනගත්තේ තාත්තා නැතිවෙලා කියලා. මගේ තාත්තා පාඩුවේ ජීවත් වුණ කෙනෙක්. මට තාත්තා වෙනුවෙන් ඕන මිල මුදල් නෙමෙයි, සාධාරණය. මටයි, මල්ලිටයි තාත්තා ගොඩාක් වටිනවා.”**

ඒ තම පියා නමින් දුවකගේ හදවතේ නැගෙන දුක්ගින්නය. දහඅට හැවිරිදි ඇයට එක් සහෝදරයෙකි. ඔහු පහළොස් හැවිරිදිය. දියණිය මෙවර උසස් පෙළ විභාගයට මුහුණ දී බලා සිටියේ ප්‍රතිඵල එනතුරුය. එහෙත් ඊට පෙර ඇයට දැනගන්නට ලැබුණේ පියාගේ මරණය ගැන අසුබ පුවතයි. එය



මියගිය චමින්ද

**රඹුක්කන සිද්දියෙන් මියගිය චමින්දගේ දියණිය ඉල්ලයි**

ආදරණීය දියණියකට දැරිය හැකි තරමේ පුවතක් නොවේ.

සැබෑවටම එදින සිදුවූයේ කුමක්ද? දවසින් දවස ඉහළ යන ජීවන බර හමුවේ චමින්දටද ඒ බර එලෙසම දැනෙන්නට ඇත. ඔහු රැකියාව ලෙස කළේ අතු කපන එකය. තම ලොරි රථයෙන් එම අතු පින්නවලට ගෙනයන ඔහු, සත්ත්ව උද්‍යානයේ සැපයුම් ආයතනයකට ඒවා බාරදීම කරන්නේ සතුන්ගේ ආහාරය පිණිසය. ඊට පෙර ඔහු දේශපාලනයටද කැමැත්තක් දැක්වූ අයෙකි. ඒ නිසාම කලක් එක්සත් ජාතික පක්ෂයේ යොවුන් පෙරමුණු සාමාජිකයකු ලෙසද ඔහු කටයුතු කර ඇති බව සඳහන්ය. එදා රඹුක්කන නගරයේ කෝලාහලය මැද චමින්දත් සිට තිබේ. ඔහුද ප්‍රදේශවාසීන් සමග එක්ව පෙර මිලට ඉන්ධන දෙන්නැයි කෑ ගැවේය. එසේ කෑ ගසන්නට තිබූ හේතු සාධාරණය.

**දවස් තුනක් පෝලිමේ ඉඳලා තෙල් ගහගෙන කතරගම ගිහින් ආවේ ඊට කලින් දවසේ**

**“මිනිස්සු පාරට ආවේ පාන්දර දෙකට විතර. පෝලිමේ දවස් දෙක තුනක් ඉඳලා දහඅට වෙනිදා රෑ එන්න තිබුණු ඉන්ධන බවුසරය එන්නේ නැහැ කිව්වා. එදා රෑ ඉන්ධන මිල වැඩි කළා. පස්සේ දැනගත්තා වැඩි මිලට අලෙවි කරන්න පුළුවන් නිසා හිතාමතාම තෙල් බවුසරය මග නතර කරලා කියලා. මේක ආරංචි වුණාම දවස් ගණන් පෝලිමේ හිටපු මිනිස්සුන්ගේ කෝපය සාධාරණයි. පැය පහලොවක් විතර මිනිස්සු විරෝධතා කරමින් ඉල්ලුවේ ජීවත් වෙන්න සහනයක්. කලින් මිලට තෙල් ටික දෙන්න කියලයි ඔවුන් ඉල්ලුවේ. කවුරුත් කලබල කළේ නැහැ.”**

බොහෝ සාමකාමීව විරෝධය ඇරඹුණත් සවස් වෙද්දී එය බලාපොරොත්තු නොවූ පරිදි ප්‍රචණ්ඩ ස්වරූපයක් ගනිමින් තිබුණි. පැය පහලොවක් ප්‍රධාන මාර්ගය වසා දමා තිබුණෙන් පාසල් දරුවන් සේම ගමන් බිමන් යන්නට මගට ආ පිරිස් අසරණව මහමග හිරවූහ. මේ අතර පිරිසක් ඉන්ධන බවුසරයට ගිනි තබන්නට උත්සාය කළ බව පොලිසිය පවසයි. කඳුළු ගෑස්, ජල ප්‍රහාර මෙන්ම බැටන් ප්‍රහාරද උද්ඝෝෂකයන්ට එල්ල වෙන්නේ මෙවන් පසුබිමක් තුළය. උද්ඝෝෂකයෝද පොලිසියට ගල්මුල්වලින් පහර දෙන්නට වූහ. ඉන්ධන බවුසරයට ගිනි තබන්නට විරෝධතාකරුවන් උත්සාහ කරද්දී පොලිසිය ඔවුනට වෙඩි තැබූ බව කියයි. වෙඩි හඬත් සමග පිරිස හිස්ලුලූ අතර දුවද්දී චමින්දගේ පිටකොන්දට වෙඩි වැදිණි. එම උණ්ඩය උදරයද පසාරු කරගෙන ගොස් ලේ විලක් මැද ඔහු වැටී සිටියේය. අනතුරුව ඔහු රෝහල් ගත කෙරිණි.

**“චමින්ද මට ඥාති සහෝදරයෙක් වෙනවා. මේ මරණෙත් එක්ක එක එක කතා ඇහෙනවා. එයා කලකට කලින් එක්සත් ජාතික පක්ෂ යොවුන් පෙරමුණේ සාමාජිකයෙක් හැටියට හිටියා. නඩු තියෙන කතාවත් ඇත්ත. ඒ 2017 ට කලින්. ඔහු කලකෝලාහලවලට සම්බන්ධ වෙන කෙනෙක් නෙවෙයි. ගමේ අයත් එක්ක, නෑදෑයොත් එක්ක හොඳින් ඉන්නවා. අවුරුද්දට අපි කතරගම ගිහිල්ලත් ආවා. ඒ ගියෙත් එයාගෙ ලොරියේ. දවස් තුනක් පෝලිමේ ඉඳලා තෙල් ගහගෙන ගිහින් ආවේ. කාලයක් ඉඳන් කතරගම යන්න ඔහුට බලාපොරොත්තුවක් තිබුණා. මේ පාර ගිහින් එමු කියලා පුතයි, යාළුවෝ හතර පස් දෙනකුයි එක්ක ගියේ. ඒ ගිහින් ආවේ දහත් වෙනිදා. දහනව වෙනිදා ඔහු ජීවිතය හැර ගිහින්. බිරිඳට, දරුවන්ට ඔහු නැති අඩුව දැනේවි. පුතා තාම ඉගෙන ගන්නවා.”**

ඒ ඉන්දික දිනේෂ්ය. එම සිද්ධියෙන් බරපතළ තුවාල ලැබූ කිහිප දෙනෙක් තවමත් දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටී. සිද්ධියෙන් පොලිසියේ විසිදෙනකුද තුවාල ලබා රෝහල් ගතකරනු ලැබිණි. ඒ අනුව රෝහල් ගතවූ පිරිස තිස්හයකි. ඒ අතරින් චමින්ද මියගියේය.

**තාත්තා කලබලවලට සම්බන්ධ නැහැ. එයා වැරදිත් නැහැ**

සිද්ධිය සම්බන්ධයෙන් අංශ කිහිපයක් ඔස්සේ පරීක්ෂණ සිදුකරන අතර, මියගිය චමින්දගේ දේහය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණය කෑගල්ල මහ රෝහලේදී ඉකුත් 21 වැනිදා පැවැත්විණි. සිද්ධිය සම්බන්ධයෙන් ඒ වාර්තාවක් මගින් පොලිසිය කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු දැක්වූ අතර එහිදී මහෙස්ත්‍රාත් වාසනා නවරත්න මහත්මිය බී වාර්තාවක් මගින් අධිකරණයට කරුණු දක්වන ලෙස එහිදී පොලිසියට නියෝග කළාය.

**“මගේ තාත්තා වෙනුවෙන් මට පුංචිම හරි සාධාරණයක් ඕන.”**

ඇයගේ හිත යාන්තමට හෝ හැදෙන්නට ඇය ඉල්ලන සාධාරණය දිනක හිමිවිය යුතුමය. ඒ වාගේම රටපුරා නැගෙන විරෝධතා රැල්ල හමුවේ අපට සිහිපත් කරන්නටද දෙයක් ඇත. ඒ සාමය හා මිනිසත්කම ආරක්ෂා කරගනිමින් කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට උඩගෙඩි දෙන්නන්ට හසුනොවී විරෝධතා දක්වන ලෙසය.

**දීපා වසන්ති එදිරිසිංහ**




15 YEARS ★★★★★ WARRANTY


Delux නාන කාමර උපාංග, වසර 15ක වගකීමක් සහිතව, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිපදවනු ලබන 100% ශ්‍රී ලාංකේය නිෂ්පාදනයකි. වර්ණ සහ මාදිලි රැසකින් පහසු මිලට උසස්ම ප්‍රමිතියෙන් යුක්තව නිෂ්පාදනය වන Delux නාන කාමර උපාංග, දිවයින පුරා අළෙවි නියෝජිතයන්ගෙන් මිල දී ගත හැක.

1992 වර්ෂයේ ආරම්භ වන Delux සන්නාමය වසර 30ක් පුරා ලාංකේය ජනයාගේ විශ්වාසය දිනාගෙන සිටින අතර, ඉදිරියටත් එලෙසින්ම අප උසස් සේවාව නොවෙනස්ව ලබා දීමට පොරොන්දු වන්නෙමු.



වර්ණ රැසකින්:


White, Pink, Apple Green, Ivory
Beige, Light Blue, Raspberry, Denim Blue



ඔබ මිල දී ගන්නා සෑම Delux බාත්වෙයා නිෂ්පාදනයකින්ම දිවයින පුරා පාසල්වල සනීපාරක්ෂක පහසුකම් ඉහළ නැංවීම සඳහා මුදල් පරිත්‍යාගයක් කෙරේ.

RSL ප්‍රජාසත්කාරය

**RSL CERAMICS (PVT) LTD.**
486, ශ්‍රී සුමන මාවත, ලෙනගල, දැඩිගමුව.
දුරකථන: 0115 744 626/0115 643 087 ඊ-මේල්: info@rslceramics.com
www.rsl.lk



**රත්නපුරේ බලංගොඩ මහවෙලතැන්න වලව්වේදී සිරිමා රත්වත්තේ ඉපදුණේ හරියටම මීට අවුරුදු 106කට කලිනි. ඇය ඉපදුණේ 1916.4.17 වැනිදාය. මේ ලිපිය සම්පාදනය වන්නේ ඇගේ 106 වන ජන්ම දිනය නිමිතිකොටගෙනය.**

## අරලියගහ මන්දිරේ දානෙකට ගිහින් ආපහු එද්දී

# මැතිනි මුලින්ම ඇහුවේ පොලොස් හට්ටිය ගැනලු

නොබැඳි ජාතීන්ගේ සමුළුව එක්දහස් නවසිය හැත්තෑ හයේදී කොළඹදී පැවැත්වූයේ මැතිනිගේ සභාපතිත්වයෙන්. එම සමුළුවට ලිබියාවේ ගඩාෆිත් ආවා. ඔහු බලසම්පන්න අප්‍රිකානු නායකයෙක්. ඉතින් පූර්ව පරීක්ෂාවකට ගඩාෆි ඔහුගේ ආරක්ෂකයින් ගුවන්යානයකින් කොළඹට එව්වලු. එවෙලේ අගමැතිනි සිරිමාවෝ ඉඳල තියෙන්නෙ හෝටලයක අමුත්තන් පිරිසක් සමග ආහාර ගනිමින්. ලේකම්වරයෙක් ඇවිත් අගමැතිනිගෙ කනට කරලා කිව්වලු **"ගඩාෆිගෙ ආරක්ෂකයන් ප්ලේන් එකකින් ඇවිත්. ඔවුන්ට රටට ඇතුළු වෙන්න ඉඩ දෙනවද?"** කියලා. සිරිමාවෝ කිව්වලු **"වහාම ඔවුන්ට පැමිණි යානයෙන්ම සියරට යන්න කියන්න"** කියලා. සිරිමාවෝ කියන්නේ එහෙම නායිකාවක්.

ඇයට හැම රටකින්ම ලැබුණේ ගෞරවයක්. ආදරයක්. ඒ ගෞරවය කොච්චරක්ද කියනවා නම් ඉන්දු - චීන යුද්ධය නතර කිරීමට සාම දූතිකාව ලෙස මැදිහත් වුණෙත් ඇය. ඉස්සර ලංකාව ලෝකේ ප්‍රසිද්ධ රටක් නෙවෙයි. ශ්‍රී ලංකා කියනවාට වඩා අපේ රට ප්‍රසිද්ධ වුණේ බණ්ඩාරනායක නමටයි. පිටරට ගියාම ලංකාවේ කීවාම එරට වැසියන් කීවේ බණ්ඩාරනායක කියලා. මැතිනිය මේ සියල්ල කළේ උපාධි තියාගෙන නෙවෙයි. ඇය දේශපාලනයට එන්නට පෙර ගෘහණියක් පමණයි.

ඇය අගමැතිනිය වුවත් බොහෝ සකසුරුවම් විදියට ගෙදර දොරේ වැඩ කටයුතු සොයා බැලුවා. වරක් අරලියගහ මන්දිරයේ පැවැති දානයකට ඇය හොරගොල්ල වලව්වේ සිට පොළොස් ව්‍යංජනයක් හදන් ගියා.

අරලියගහ මන්දිරයේ සිට ගෙදර යන්න වාහනයට ගොඩවෙන ගමන් ඇය ආරක්ෂක නිලධාරීන්ගෙන් ඇහුවලු පොළොස් ගෙනා හට්ටිය ගත්තද කියලා. මේ කතාව ඇත්තේ මැතිනියගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා ලියපු පොතක.

වතාවක් රුසියාවේ සංචාරයක නිරත වුණු වෙලාවේ එරට නියෝජිතයන් අගමැතිනි සිරිමාවෝ පිළිගත්තේ ආසියාවේ දෙවැනි දියුණුම රටේ රාජ්‍ය නායිකාව පැමිණි බව කියමින්. සිරිමාවෝ කියන්නේ යකඩ ගැහැනියක්. හැමෝම ඇයව හැඳින්වුවේ මැතිනි කියලා. මැතිනිලා කොච්චර හිටියත් අපිට ඒ වචනය ඇහුණු ගමන් මතකයට එන්නේ සිරිමාවෝ මැතිනිය. සිරිමාවෝ යනුවෙන් කීවාට ඇගේ උප්පැන්නේ එහෙම නමක් නෑ. ඇගේ නම සිරිමා. ඒ නමට "වෝ" එකතු කළේ රටේ ජනතාව. ඒ ඈට තියෙන ආදරයට.

ඇය දේශපාලනයට ආවේ සිය අගමැති සැමියා ඝාතනය වුණාට පස්සේ පක්ෂ සාමාජිකයන්ගෙන් ලැබුණු ඉල්ලීම මත. එහෙම ඇවිත් ලෝකෙ පළමුවැනි අගමැතිනිය ලෙස පත් වෙන්න ඇය සමත්වුණා. ඇය සෘජු තීරණ ගත්ත නායිකාවක්.

1962 රජය පෙරලීමේ හමුදා කුමන්ත්‍රණයට වගේම 1971 ජවිපෙ සන්නද්ධ අරගලයටත් මුහුණ දෙන්න සිරිමාවෝට සිදුවුණා. ඒ අවස්ථා දෙකේදීම කැබිනෙට්ටුවේ හිටපු එකම පිරිමියා මැතිනිය කියල තමයි හැඳින්වුණේ. මොකද පිරිමින් අභිබවා තීරණ ගැනීමට තරම් ශක්තියක් ඇයට තිබුණා.

**1962 රජය පෙරලීමේ හමුදා කුමන්ත්‍රණයට වගේම 1971 ජවිපෙ සන්නද්ධ අරගලයටත් මුහුණ දෙන්න සිරිමාවෝට සිදුවුණා. ඒ අවස්ථා දෙකේදීම කැබිනෙට්ටුවේ හිටපු එකම පිරිමියා මැතිනිය කියල තමයි හැඳින්වුණේ. මොකද පිරිමින් අභිබවා තීරණ ගැනීමට තරම් ශක්තියක් ඇයට තිබුණා**

සිරිමාවෝට පවුල් පසුබිමින් ලැබුණු ඉඩම් අක්කර එක්දහස් ගණනක් තිබුණා. ඒත් ඇය පාර්ලිමේන්තුවට ඉඩම් පනතක් ගෙනත් පුද්ගලයකුට උපරිම හිමිකම තබාගත හැකි ඉඩම් ප්‍රමාණය අක්කර පනහකට සීමා කළා.

ඒ වගේම 1972 ජනරජ ව්‍යවස්ථාව ගෙනත් ශ්‍රී ලංකාව පූර්ණ නිදහස් ස්වෛරී රාජ්‍යයක් ලෙස ස්ථාපිත කළා. ඇය නිතරම හිටියේ දේශීය කර්මාන්තවලට ප්‍රමුඛත්වය දෙන්න ඕන කියන ප්‍රතිපත්තියේ.

ඇය නිතර විශ්වාස කළ දෙයක් තමයි දේශීය නිෂ්පාදන කර්මාන්ත මුල් කරගත් ආර්ථිකයක් මත ඉදිරියට යා යුතුයි කියන එක. ඇය 70 දශකයේදී ආනයන සීමා පනවමින් දේශීයත්වය මුල් කරගත් ආර්ථික ක්‍රමයකට ගියේ ඒ නිසා. කොණ්ඩ කට්ටෙ පටන් රෙදිපිළි, වතුර බෝතල්, ක්‍රීඩා භාණ්ඩ, විදුලි උපකරණ, ගුවන් විදුලි යන්ත්‍ර, නිදන කාමර භාණ්ඩ, මුළුතැන්ගෙයි මෙවලම්, වානේ උපකරණ ආදී භාණ්ඩ රැසක් මේ කාලයේ මෙරටම නිෂ්පාදනය කෙරුණු අතර දේශීය කර්මාන්ත දිරිගන්වන සංස්ථා, මණ්ඩල හා දෙපාර්තමේන්තු රැසක් සක්‍රීයව පැවතුණා. සිරිමාවෝගෙ අභිප්‍රාය වුණේ දේශීය නිෂ්පාදන, දේශීය කර්මාන්තවලට මුල්තැන දීලා ඒ ව්‍යාපාර පුළුල් කරන්න. ආනයන සීමා කරමින් අපනයන දිරිගන්වන්න. නමුත් මේ ප්‍රතිපත්ති නිසා ඒ කාලේ හාල් පොල්, මිරිස් පොලු වගේ දේවල් වගේම බොහෝ දෑ මිල දී ගන්න පෝලිම්වල ජනතාවට ඉන්න වෙන වාතාවරණයක් නිර්මාණය වුණා. ඒ තත්ත්වය ජනතාව අතර අසහනය වැඩි කරන්න ඉවහල් වුණා.

ඒ වගේම සිරිමා ආණ්ඩුවේ මුදල් ඇමතිකම දැරූ ඇයගේ ඥාතියෙකු වූ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකගේ ඒකාධිපති ක්‍රියාකලාපය මෙන්ම රජයේ විවිධ ඉහළ තනතුරු දැරූ බණ්ඩාරනායක පවුලට සම්බන්ධවූවන් නිසා 'පවුල් ගස' පිළිබඳ කතාව නිර්මාණය වුණා. එයත් සිරිමාවෝ මැතිනිය ගැන අපහැදීමක් ඇති කරන්න හේතුවුණා. මේ සියල්ලේ වාසිය ගත් ජේ.ආර්. 1977 දී සිරිමා මැතිනිය පරාජය කළේ 5/6 ක බලයක් දිනාගනිමින්.

පසුව බලයට ආ ජේ.ආර්. සිරිමා මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්න පියවර ගත්තේ තම කැබිනට් මණ්ඩලයේම කිහිපදෙනකුගේ විරෝධය මැදයි. කෙසේ වෙතත් 1994 දී එ.ජා.ප ආණ්ඩුව පෙරළමින් බලයට පත් පොදුජන පෙරමුණු ආණ්ඩුවේ අගමැති ධුරයට ඇය පත්වූයේ තෙවන වරටයි. ඇය අගමැති ධුරය භාර ගත්තේ ජනපති දූ ගෙන්. එය අපූර්ව සිද්ධියක්. ඇය මැරෙන තුරා දේශපාලනය අතහැරියේ නෑ. 2000.10.10 ඇය මිය ගියේ මහ මැතිවරණයේ ඇගේ ඡන්දය පාවිච්චි කර ගෙදර යන ගමන්.

මැතිනිගේ පාලනය යටතේ ශ්‍රී ලංකාව ලබාගත් ජයග්‍රහණ බොහෝමයක් තියෙනවා. ඇය රට පාලනය කළේ සෘජු තීරණ ගත් හැබෑම යකඩ ගැහැනියක් විදිහට. ඒත් ගොඩක් මිනිස්සුන්ටනම් අදටත් මතක මැතිනිගේ කාලේ තිබ්බ පෝලිම් ටික විතරයි.

**දර්ශන එරංග**




# බොස්ට ගිනි තියන්න මගේ ගානේ පෙට්‍රල්

පිංකි ඔෆිස් ගියේ දිගු නිවාඩුවකින් පසුව හිනා කටක් පුරවාගෙන. ආයතනයට ඇතුළු වුවත් කාගේවත් මුහුණේ සිහිනවක් නෑ. සියල්ලෝම බුම්මාගෙන.

කොණ්ඩ කිරිල්ලී සිය ආසනයෙහි වාඩිවී සෑඩ් මූඩ් එකෙන් බුකවාගෙන සිටිනු ඇය දැක්කේ ඔය අල්ලපනල්ලේ. පිංකි සෙමින් සෙමින් ඇය වෙත ඇදුණා.

**"මොකද බං තෙල් ගණන් ගිය, ගෑස් හිඟ වුණ වෙලාවේ, ලයිට් කපපු වෙලාවේ වගේ හැමෝම අඤ්ඤකොරොස් වෙලා? බුම්මාගෙන?"**

පිංකි විමසුවේ ළෙංගතු සිනහවක් පාමින්.

**"උඹ නම් කියයි. අපිටනේ පාඩු!"**

කොණ්ඩි ගස්සා අඬමින් ඉවත බලාගත්තා.

දැන් පිංකි කරකවා අතහැරි ගානයි.

**"ඉතින් මොකද වුණේ කියලා කියපන්කෝ? ලබන සැරේ බෝනස් කපනවා කිව්වද?"**

**"බෝනස් කැපුවොත්, කොල්ලෙක් රවට්ටලා හරි ඒ සල්ලි හොයාගන්න එක සිම්පල්. අනේ! අපේ ලොක්කා!"**

කොණ්ඩි විලාප දුන්නා.

**"මළාද?! දෙයියන්ගේ පිහිටයි!"**

පිංකිට කියවුණේ නිරායාසයෙන්. මොකද පිංකිට බොස් වැඩිය රුස්සන්නේ නෑ.

**"නෑ! කප්පංකාරයෝ බොස් පැහැරගෙන ගිහිල්ලා. බේරන්න නම් ලක්ෂ විස්සක් ඉල්ලනවා. නැත්නම් පෙට්‍රල් දලා ගිනි තියනවාලු."**

ඒ සමඟම එතැනට පැමිණියේ චීෆ් ක්ලාක්.

**"පිංකි! බොස් බේරගන්න අපි හැමෝගෙන්ම කීය කීය හරි එකතු කරනවා. පිංකිත් කීයක් හරි දුන්න."**

ඔහු කොළයක් දිගු කළා.

**"බොස් ගිනි තියනවා කිව්වලු නේද?"**

පිංකි විමසුවේ කට උල් කරමින් දුකෙන්.

**"ඔව්."**

චීෆ් ක්ලාක් හීල්ලුවා.

**"පෙට්‍රල් දලා නේද?"**

**"ඒකනේ පිංකි."**

**"මේක හරිම අමාරු කාලයක් තමයි. ඒත් බොස්ට මොනවාහරි නොකරත් බෑනේ. මං ගානේ පෙට්‍රල් ලීටර් තුනක් ලියාගන්නකෝ"**

පිංකි කොළය ආපසු චීෆ් ක්ලාක්ට දෙමින් පැවසුවේ ඇඟපතට නොදැනී.










ආචාර්ය පබිලිස් සිල්වා බිරිඳ වෙනුවෙන් ඉදිකරවන ලද නවරියන් පිළිම වහන්සේ

# අහස උසට පිළිම නෙලුවත් ඇය කරපු දේවල් ඉස්සරහා ඒවා

## බිරිඳ වෙනුවෙන් නවරියන් බුද්ධ ප්‍රතිමාවක් ඉදිකර සසුනට පූජා කළ

ආචාර්ය පබිලිස් සිල්වාට ගල්කිස්ස මහ හෝටලයේ දොරගුලු විවර වන්නේ 1956දීය. ඒ ද බිරිඳගේ නෑ හිතවතෙකු මාර්ගයෙනි. ලිපට ගල් අඟුරු දමන කම්කරුවෙකු ලෙසින් එදා ඔහුට ලැබුණු මාසික වැටුප රුපියල් 40කි. අද වනවිට ඔහු ගල්කිස්ස මහ හෝටලයේ සූපශාස්ත්‍ර සබඳතා ප්‍රවර්ධන අධ්‍යක්ෂවරයාය.

නමුත් ඇය නොහිටින්නට ඔහුට මෙතරම් සාර්ථක ගමනක් එන්නට ලැබෙන්නේ නැත. ආදරණීය බිරිඳක්, සෙනෙහෙබර මවක් ලෙසින් ඇය ඔහු වෙනුවෙන් කළ කැපකිරීම් අපමණය. එපමණක් නොව පබිලිස් සිංඤෝ හට දේශබන්දු ආචාර්ය පබිලිස් සිල්වා ලෙස වෙනස් වන්නට කමටහන් දුන්නේද ඇයයි.

**“අපි එදාවේල කන්න නැතුව හිටපු පවුලක්. මට මතකයි ඒ කාලේ මම අම්මත් එක්ක ගාල්ල මාර්කට් එකට ගිහිල්ලා විසිකරන කුණු වට්ටක්කා ගෙනල්ලා තම්බගෙන කෑවා. ඊටපස්සේ අම්මා ගාල්ල මාර්කට් එකෙන් විසිකරන එළවලු අහුලගෙන ඇවිල්ලා ගමේ අයට විකුණලා සුළු මුදලක් හොයාගත්තා. මට කොහොමත් ඉස්කෝලෙ ගියත් ඉගෙනගන්න උනන්දුවක් තිබුණ නෑ. අඟහිඟකම් නිසාම දෙමව්පියොත් ඒකට වැඩිය බල කළේ නෑ. ඔහොම කාලයක් ඉන්නකොට හාමුදුරු කෙනෙක් මාව මහණ කරන්න කියලා එක්කගෙන ගියා. මම ඒ පන්සලෙන් පැනලා ආවා. ඊටපස්සේ වත්තල මහත්තයෙක් මාව දරුකමට හදාගන්න කියලා අරන් ගියා. අන්තිමට මට වුණේ ඒ මහත්තයගෙ ළමයින්ගේ දැලි කුණු හෝදන්න. අන්තිමේ තාත්තා ඇවිත් එතැනිනුත් මාව ගෙදර අරන් ගියා. ඊටපස්සෙ ගෙදර ගිහිල්ලා කරන්න දෙයක් නැතිකමට, ලුණු අඹරන්නයි, මාළු දැල් අදින්නයි ගියා.”**

ඒ වනවිට දොළොස් හැවිරිදි වියේ පසු වූ පබිලිස්ට දස හැවිරිදි විමලාව මුණ ගැහෙන්නේ ගමේ කොහු මෝලක ලුණු අඹරන්නට ගිය විටය. ලුණු අඹරන අතුරතුර දැන හැඳිනගත් මේ පොඩි උන් දෙන්නා ගජ මිතුරන් බවට පත්වන්නට වැඩි කලක් ගියේ නැත. සමනල් පැටවුන් මෙන් ළමා කාලය ගෙවිය යුතු වයසක සිටියද දෙදෙනාම හරි හරියට ලුණු ඇඹරුවේ සවසට ගෙදර යද්දී සතයක් හෝ වැඩිපුර අතමිට මොලවාගෙන යාමටයි. එහෙත් වැඩි කලක් නොගොස්ම මේ කොලු ගැටයා කාටත් හොරා රැකියාවක් හොයාගෙන මඩකලපුවට පැන ගියේය. නමුත් මඩකලපුවේ මුහුදු රැකියාව කිරීමත්, ජීවත්වීමත් ඔහු සිතූ තරම් ලෙහෙසි පහසු නොවුණි. අනතුරුව නැවතත් ගමට පැමිණ රැකියාවක් හොයාගෙන ඔහු කොළඹ ගියේය.

**“කොළඹ පාරවල් ගානේ ඇවිදලා රස්සාවල් හොයද්දී මට තේ කඩේක රස්සාව ලැබුණා. නමුත් මොන අහේතුවකටද මන්දා පැය විසිහතරක් යන්නත් කලින් කඩේ මුදලාලි මාව ගහලා පන්නගත්තා. ඊටපස්සේ පිටකොටුවෙ හරස්වීදියේ තියාගෙන ලොසින්ජර වික්කා. කාලයක් යද්දි පිටකොටුවත් මට ගෙදර තරමටම හුරුපුරුදු තැනක් වුණා. ඊටපස්සේ ඉතින් නානාප්‍රකාර මිනිස්සුන්ගේ ආශ්‍රයට එකතු වුණා. ඒ වෙද්දි මට අවුරුදු දසයක් විතර. ඒක නිසා හොඳ නරක තෝර බේරගන්න දැනුම් තේරුමක් තිබුණෙත් නෑ. ඒ නිසාම කොටුවෙදි අඳුනගත්ත මනුස්සයෙක් මාව හෙට්ටිවීදියෙ මංකොල්ල කන්න පුරුදු කරන්නත් අරන් ගියා. ඔහොම ඉද්දි දවසක් හෙට්ටිවීදියෙ සිද්ධ වුණු මිනීමැරුමක් නිසා පොලිසියෙන් අපිටත් අවවාද කරලා ගමට පිටත් කළා.”**

නැවතත් ගමට ගියද පබිලිස්ට කරන්නට රැකියාවක් තිබුණේ නැත. කාලයත් සමඟ විමලාද හිරිමල් තරුණියක වී සිටියාය. විමලාගේත් පබිලිස්ගේත් ආදර අන්දරය දළු ලන්නට පටන්ගත්තේ ඔය කාලයේදීය. පසුව පබිලිස්ට රස්සාවකට කලින් පරස්තාව ඉස්සර වූ නිසා ආදර කතාව මඟුලකින් කෙළවර විය.

**“කසාද බැන්දට පස්සෙ තමයි සිහිවුණේ තනියමවත් ලුණුයි බතුයි කන්න විදියක් නැති මට දැන් තවත් කෙනෙක්ට කන්න අඳින්න දෙන්න තියෙනවා නේද කියලා. පුදනකොටම කාපි යකා කියලා වැඩිකල් යන්නත් කලින්ම හාමිනේට දරුවෙකුත් ලැබෙන්න ආවා. පස්සේ ඉතින් ආපහු ගාල්ල පොළේ කරෝල කරත්ත තල්ලු කරන්නයි මුදලාලිලාගෙ අත්උදව්වටයි ගියා.”**

කාලය ගෙවී ගියේ කිසිසේත්ම සුබවාදී අයුරෙන් නොවීය. උදේ පටන් රෑ වනතුරුම කරත්ත සමඟ ඔට්ටු වුණ පබිලිස්ගේ අත්වල තිබූ කරගැටවලට තෙල් බෙහෙත් බෝතල් ගණන් ගෑවේ විමලාය. පසුව ඇය ගල්කිස්ස මහ හෝටලයේ සේවය කළ ඇගේ සොයුරෙකුට කීවේ කෙසේ හෝ තම සැමියාට එහි රැකියාවක් ලබාදෙන ලෙසය. ඒ ඔහු විඳි දුක් කන්දරාව තවදුරටත් බලාසිටිය නොහැකි තැනදීය.

**“අන්න ඒ විදියට තමයි මට ගල්කිස්ස මහ හෝටලේ රස්සාව ලැබුණේ. නමුත් එහෙමයි කියලා හැමදේම විසඳුනේ නෑ. මම හෝටලේ ගල් අඟුරු අදින රස්සාව කරද්දිත් පුදුමාකාර දුකක් වින්දා. නමුත් කොයිතරම් දුක් වින්දත් මගේ හිතේ හැම වෙලාවෙම තිබුණෙ මොකක් හරි අලුත් දෙයක් ඉගෙනගන්න ඕන කියන පරමාර්ථය. මගේ ඒ චේතනාව තව තවත් වැඩි වුණේ හොටලේ වැඩ කරපු ජෝන් මාමා කියන සූපවේදියා හදපු සුදු අරලිය දළු ව්‍යංජනයක් නිසා. දවසක් ඔහු හදපු සුදු අරලිය දළු ව්‍යංජනයකින් මටත් ටිකක් රස බලන්න කිව්වා. මට අද වගේ මතකයි ඒකේ පුදුමාකාර රසයක් තිබුණෙ. අන්න එතැන තමයි මගේ ජීවිතේ හැරවුම් ලක්ෂය වුණේ.”**

> **ජීවිතේ නැති බැරි කාලේ ඒ විදියේ කැපකිරීම් කරන බිරිඳකට අඩුම තරමේ අපිට පුළුවන් කාලෙදිවත් කෘතගුණ සලකන එක නේද කළගුණ දන්න උතුම් පිරිමියෙකුගෙන් වෙන්න ඕන? මම කියන්නේ නෑ සෑම ස්වාමිපුරුෂයෙක්ම බිරිඳ වෙනුවෙන් වෙහෙර විහාර හදවලා පූජා කරන්න ඕන කියලා. නමුත් ජීවිතේ අන්තිම හුස්ම යන්න කලින් තමන්ට පුළුවන් ප්‍රමාණයට හරි ඒ උත්තමාවියට උපහාරයක් කරන්න පුළුවන් නම් වටිනවා**

සුදු අරලිය දල්ලක් තමාගේ ඉරණම මේ තරම්ම උඩුයටිකුරු කරාවි යැයි පබිලිස් සිල්වා එදා කිසි ලෙසකින් නොසිතන්නට ඇත.

**“මම මුළු ජීවිතේම කැප කළේ මේ රස්සාව වෙනුවෙන්. ගල්කිස්ස මහ හෝටලේ තමයි එදා ඉඳන් මගේ මහගෙදර වුණේ. මම රස්සාව වෙනුවෙන් කැපවෙලා ඉන්නකොට හාමිනේ තමයි දරුවන්ගේ හැම බරක්ම දැරුවේ. මේ රස්සාවට ආපු මුල් කාලේ ඉඳලම මට මාස හතේ අටේ ගෙදර යන්න බැරිවුණ අවස්ථා තිබුණා. එහෙම කාලෙට ඇය රත්ගම ඉඳලා හතිදාගෙන මාව හොයාගෙන ඇවිල්ලා ගල්කිස්ස මහ හෝටලේ ගේට්ටුව ළඟ හිටගෙන ඉන්නවා. ඒ වෙලාවට මම කරන්නේ පඩි සල්ලි ටික දීලා ආපයින්ම ඇයව ආපහු හරවලා යවන එක.”**

පබිලිස් විමලා දෙපළට අද වනවිට පුතුන් දෙදෙනාත්, දියණියන් තිදෙනාත් සමඟ දරුවන් පස්දෙනෙකි. මුණුපුරු මිණිපිරියන් එකොළහකි. තුන්මුණුපුරු මිණිපිරියන් හතකි.

**“මට මතකයි අපේ දරුවෝ පස්දෙනාගෙන් එක්කෙනෙක් ලැබෙන්න අමාරුවෙනකොට විතරක් අහම්බෙන් වගේ නිවාඩුවකට ඇවිත් මම ගෙදර හිටියේ. අනිත් දරුවො හතරදෙනාම ලැබිලත් මාස තුන හතරකට පස්සේ තමයි මම ගෙදර ගියේ. නමුත් ඇය මහ පුදුමාකාර දරාගැනීමේ ශක්තියකින් ඒ හැමදෙයක්ම දරාගත්තා. කවදාවත් මට දෙස් නැගුවේ නෑ. දික්කසාද වෙන්න ඕන කිව්වේ නෑ. අද ලැබිලා තියෙන කිසිම දෙයක් ලේසියෙන් ලැබුණ දේවල් නෙවෙයි. ඒ වෙනුවෙන් මටත් වඩා හාමිනේ ලොකු කැපකිරීම් කරලා තියෙනවා. මට නැතිබැරි කාලේ මගේ ළඟ හිටපු ඇය වෙනුවෙන් මට ඇතිහැකි කාලේ ඒ ණය පියවන්නයි මම මේ නවරියන් බුදුපිළිම වහන්සේ නෙලුවේ.”**

ඔහු එසේ කියද්දි ඒ ආදරය ගැන තවත් කුමක් කියන්නද කියා අපට සිතුණි. සසර පුරා පතාගෙන එන ආදර කතා මේවා නොවේ දැයි සිතන තරමට ඒ කතාව අව්‍යාජය.

**“ඒ පුණ්‍යකර්මයට ගොඩක් අය මුදලින් දායක වෙන්න අවස්ථාව ඉල්ලුවා. ඒත් මට ඕන වුණ් කාගෙන්වත් රුපියලක්වත් නොගෙන මගේම මුදලින් ඇය වෙනුවෙන් ඒ දේ කරන්න. ඒ වගේම ඉදිරියේදී ඇය වෙනුවෙන් වෙහෙර වහන්සේ නමක් ඉදි කරනනත් මගේ බලාපොරොත්තුවක් තියෙනවා.”**

සාජහාන් රජු ටජ්මහල ඉදිකළේ මුම්ටාස් දේවිය ගැන තිබූ ප්‍රේමය ලොවට කියන්නටය. ආචාර්ය පබිලිස් සිල්වා සිය බිරිඳට ආදරය, ගෞරවය ප්‍රකාශ කරන්නේ රත්නපුර සිංහරාජ ගම්මානයේ බුදුගල්ලෙන චන්ද්‍රාරාම විහාරස්ථානයේ විහාර ගෙය පිහිටි ගල්ලෙන තුළ අඩි 12කුත් අඟල් දෙකක (නවරියනක්) සැතපෙන බුද්ධ ප්‍රතිමාවක් නෙලා සසුනට පූජා කිරීමෙනි.

එමෙන්ම ඇය වෙනුවෙන් තවත් බොහෝ දේ කළ බවත්, කරන්නට ඇති බවකුත් ඔහු කියා සිටියේය.

**"අපි විවාහ වෙලා දැනට අවුරුදු 64ක්. ඒ කාලය තුළ මම ඇයට අඩුවක් නැතුව මගේ සෙනෙහස දුන්නා. මට නැතිබැරි කාලේ කන්න අඳින්න දෙන්න බැරිවුණ හැම දෙයක්ම මට තියෙනකොට අඩුවක් නැතුව දුන්නා. ලෝකයේ රටවල් 21ක සංචාරය කෙරෙව්වා. ගුවන්යානා, නැව්, සබ්මැරීන්වලින් පවා ගමන් බිමන් එක්කගෙන ගියා. ඒත් ඇය මං වෙනුවෙන් කරලා තියෙන කැපකිරීම් දිහා බැලුවම මං නිසා ජීවිතය දරාගෙන තියෙන විදිය බැලුවම මේවා සුළු දේවල් කියලයි මට හිතෙන්නේ.**

**අවසාන වශයෙන් මට මේ ලෝකේ සෑම ස්වාමි පුරුෂයෙකුටම කියන්න දෙයක් තියෙනවා. මගේ බිරිඳ වගේම තවත් බහුතරයක් බිරින්දෑවරුන් තමන්ගේ මුළු ජීවිත කාලයම කැප කරන්නේ ස්වාමියාගේ, දරුවන්ගේ දියුණුවට. ඒ අය තමන්ගේ ජීවිතවලින් බොහොම පොඩි කාලයයි දෙමව්පියෝ ළඟ ඉන්නේ. විවාහ වෙලා ආවට පස්සේ ජීවිතේ මැරෙනකන්ම ඉන්නේ අපි ළඟ. ඔවුන්ටත් අපිට වගේම ලස්සන හීන තියෙනවා. ඒත් සමහරක් වෙලාවට ඒ හීන සේරම දියවෙලා යන්නේ කුස්සිය මුල්ලට. ආස කරන කෑමක්, ඇඳුමක් අරන් දෙන්න ගියත් එයාලා මුලින්ම කරන්නේ ඒකෙ ගාණ කීයද කියලා බලන එක.**

**ඊටපස්සේ ගාණ වැඩි නම් අපෝ ඕවට මම ආස නෑ, අනේ ඕවා මම කන්නේ නෑ කියලා නිකන් ඉන්නවා. ඒත් ඇය හිත යටින් ඒවාට ආසයි. ඉතින් අපේ ජීවිතේ නැති බැරි කාලේ ඒ විදියේ කැපකිරීම් කරන බිරිඳකට අඩුම තරමේ අපිට පුළුවන් කාලෙදිවත් කෘතගුණ සලකන එක නේද කළගුණ දන්න උතුම් පිරිමියෙකුගෙන් වෙන්න ඕන? මම කියන්නේ නෑ සෑම ස්වාමිපුරුෂයෙක්ම බිරිඳ වෙනුවෙන් වෙහෙර විහාර හදවලා පූජා කරන්න ඕන කියලා. නමුත් ජීවිතේ අන්තිම හුස්ම යන්න කලින් තමන්ට පුළුවන් ප්‍රමාණයට හරි ඒ උත්තමාවියට උපහාරයක් කරන්න පුළුවන් නම් වටිනවා."**

ඉතින් ප්‍රවීණ සූපවේදී ආචාර්ය පබ්ලිස් සිල්වාටත්, ඔහුගේ ආදරණීය බිරිඳ විමලා රාජකරුණා මහත්මියටත්, තවත් සුවහසක් කාලයක් සතුටින්, ආදරයෙන් ජීවත්වීමට වාසනාව ලැබේවායි අපිද සුභාෂිංසන එක් කළෙමු.

**ලිහිණි මධුෂිකා**

# මං වෙනුවෙන් හරි පුංචියි

## ආචාර්ය පබ්ලිස් කියන කතාව



**බිරිඳ වෙනුවෙන් චෛත්‍යකුත් හදලා පූජා කරනවලු**

ඡායාරූපය - ක්‍රිෂාන් කාරියවසම්



ඉන්දිරාජා

# බලංගොඩ පෙරහැර බලන්න ඉන්දි රාජා රක්ෂණ සමාගම් කිහිපයක් ගෙන්නපු හැටි

ඉන්දිරාජා ශ්‍රී දළදා මාළිගාවට ත්‍යාග කරනු ලැබූයේ ඉන්දීය හිටපු අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි විසිනි. ඒ 1989 දීය. මේ පැටවා ක්‍රමයෙන් වැඩෙත්ම පෙරහැරවලට ආගන්තුකයෙක් නොවීය. එය කෙසේ වුව ද ඉන්දිරාජා තරමක දඩබ්බරයෙකි. බලංගොඩ පෙරහැරේ දී වරක් එය දැකගත හැකිවිය.

බලංගොඩ රාත්‍රී පෙරහැර දින පහක් පුරා පැවැත්වේ. ඉන්දිරාජා ද ඊට සහභාගී කරවීමට ගෙනැවිත් තිබිණ. නිර්වින්දන වෛද්‍යවරයා ලෙස එහි පැමිණ සිටියේ මහාචාර්ය අශෝක දංගොල්ලයි. ඉන්දිරාජා කෙරෙහි ඔහුගේ වැඩි අවධානය යොමුවූයේ ඇතා තරුණ සමය ගත කරමින් සිටි බැවිනි.

රාත්‍රී 11 ට පමණ වීථි සංචාරය ඇරඹෙන පෙරහැර සඳහා අලි ඇතුන් සූදානම් කිරීම රාත්‍රී හතේ පමණ සිට සිදු කෙරේ. එය වේලාසන වැඩියැයි වැටහුණ ද රාත්‍රී දහයට පමණ මහාචාර්ය දංගොල්ල අලි ඇතුන් පරීක්ෂා කළේ ය. පසුව හෙතෙම රාත්‍රී ආහාරය ගැනීමට පිටත් විය. ඒ, බස්නායක නිළමේවරයාගේ නිළ නිවසටයි.

වෙහෙසකර දවසක ඉදිරි පැය කිහිපයට සූදානම් විය යුතුය. මහාචාර්යවරයා ආහාර බෙදාගත්තේ ලද විරාමය දී නිදහසේ එය අනුභව කිරීමටයි. ඒ, අතරතුර හෙතෙම අසල වූ ජනේලයෙන් පිටත බැලීය. මහා ඝෝෂාවක් ද ඇසේ. එපමණක් ද? පියාසර කරන ත්‍රි රෝද රථයකි. එය තිබෙන්නේ පොල් ගස්වල කරටිය මට්ටමේ ය. මහාචාර්ය දංගොල්ල අන්ද මන්ද වූයේ ය. මද වේලාවකින් පියවි සිහිය ලද හෙතෙම කෑම පිඟාන පසෙක තබා පිටතට ගියේය.

බෙරකරුවන්, නලා කරුවන්, අයිස්ක්‍රීම් වෙළෙඳුන් මෙන්ම ශබ්ද විකාශන යන්ත්‍රවලින් නැගෙන හඬ මිනිසුන්ගේ කෑ ගැසීම් සමග එකට මුසු වී ඇත. කිසිවක් පැහැදිලි කරගැනීම අසීරුය. ඒ අතරින් වෛද්‍යවරයා කෑම කාමරයේ සිට දුටු දර්ශනය වෙත සමීප වූයේ ය. කලබලයේ මහ මොළකරු ඉන්දිරාජා ය. ඇතාගේ දළ යුගලේ ත්‍රි රෝද රිය පැටලී තිබේ. එය ගලවා ගත නොහැකිව ඉන්දිරාජා හිස දෙපසට වනයි.

කිසිවක් සිතාගත නොහැකි වූ මහාචාර්යවරයාට ඇත් ගොව්වා සිද්ධිය පැහැදිලි කළේය. යම් හේතුවකට කලබල වූ ඉන්දිරාජා දම්වැල් ගලවාගෙන ත්‍රි රෝද රථ ගාලට පැමිණ ඇත. පසුව එහි වූ වාහනවලට පහර දී තිබේ. ත්‍රි රෝද රථයක් දළෙහි පැටලී ඇත්තේ එවිටයි. දළ යුගලය වක්‍රව පිහිටා ඇති බැවින් එය ඉවත් කරගැනීමට ඇතා අපොහොසත් වූයේ ය. ඒ අනුව රථය සමගම හිස ඔසවා ඒ මේ අත වනා තිබේ. මහාචාර්යවරයා ආහාර බෙදගනිද්දී දුටුවේ එම දසුනයි.

**අලි කතා**

මේ කලබලය පැය තුනක පමණ කාලයක් පැවතිණ. ඉන්දිරාජා අල්ලා ගැනීමට හැකිව ඇත්තේ ඉන් අනතුරුව ය. ඒ වන විට හානියට පත් ත්‍රි රෝද රථ ගණන විස්සක් පමණ විය. මේ ගාලගෝට්ටිය හේතුවෙන් එදින රාත්‍රී පෙරහැර ද නවතා දැමීමට සිදුවිය. මහාචාර්ය අශෝක දංගොල්ල පසු ද උදෑසන දුටුවේ රක්ෂණ නිලධාරීන් කිහිපදෙනෙකුම අදාළ ස්ථානයට පැමිණ සිටින අයුරුය. ඒ ඉන්දිරාජාගේ හපන්කම තක්සේරු කිරීමටයි.



තොරතුරු -
**මහාචාර් අශෝක දංගොල්ල**
**(පේරාදෙණිය විශ්වවිද්‍යාලය)**

**රජනිකා ලියනගේ**

# සකුරා මල් පිපෙනකන් බලන් ඉඳපු ජපන්නුන්ට පිස්සු කියලා ඉස්සර මම හිනාවුණා

ඉස්සර මම හැමවෙලේම හැමදෙයක් ගැනම අඩුපාඩු හොයපු කෙනෙක්. ලස්සනයි කියන කිසිම දේක ලස්සනක් දකින්න මගේ ඇස්වලට පුළුවන්කමක් තිබ්බේ නෑ. ඇත්තටම හැඩට පිපුණු මලකවත් මහ ලොකු ලස්සනක් දැකපු කෙනෙක් නෙවෙයි මම. ජපානේ දැන් සකුරා මල් පිපෙන කාලේ. එකදිගට බලන් ඉන්න හිතෙන තරමට ඒවා හරිම ලස්සනයි. ඒත් ඉස්සර මට ඒවා ගැන ලොකු උනන්දුවක් තිබුණෙ නෑ. ජපන් මිනිස්සු සකුරා මල් පිපෙන කාලේ එනකන් ඇඟිලි ගැන ගැන බලන් ඉන්නවා. ඒ දවස්වල මං හිතුවේ, මේ ජපන් මිනිස්සුන්ට පිස්සු, හැම අවුරුද්දෙම පුංචි දවස් ගාණකට පිපෙන මලක් වෙනුවෙන් නැහෙන්න හදනවා කියලා. ඒත් පස්සේ මම තේරුම් ගත්තා ප්‍රශ්නෙ තියෙන්නෙ සකුරා මල්වලවත්, ජපානෙ මිනිස්සුන්ගෙවත් නෙවෙයි කිසිම දේක ලස්සනක් දකින්න බැරි මගේ හිතේ කියලා. ඒක හදාගන්න ඕනෙ කියලත් මං තේරුම් ගත්තා. දැන් මම සීත කාලේ උපරිමෙන් විඳලා වසන්ත කාලේ පිපෙන මල්වල ලස්සන විඳින්න ආසාවෙන් බලන් ඉන්නවා. එහෙම බලන් ඉන්න එකත් දැන් මගේ හිතට ලොකු සතුටක් ගේනවා.

ඉතින්, හරි අසතුටෙන්, තරහෙන්, වේදනාවෙන් ඉඳපු මගේ ජීවිතේ වෙනස් වුණ විදිය ගැනයි මට අදත් ලියන්න හිතුණේ. ජපානෙට එන්න කලින් ලංකාවේ ඉද්දී මම හිතුවේ ජපානෙට ගියාම මම නිදහස් කියලා. හිතපු විදියටම දහම් මට ලොකු නිදහසක් දුන්නා. ඒත් ටික දවසකින් මට හැමදේකම හරි ඒකාකාරී බවක් දැනෙන්න ගත්තා. මොකක් හරි දෙයක් හින්දා ඒක ටිකකට මගහැරුණත් ආයෙ ආයෙමත් ඒ ඒකාකාරී බව මගේ ඔලුවම අවුල් කළා. මට එතැනින් හිත හදාගන්න තේරුණේම නෑ. කියලා තේරුම් කරන්න කෙනෙක් හිටියෙත් නෑ. ඇත්තටම මට එතැනින් එළියට එන්න උවමනාවක් තිබුණෙත් නෑ.

පස්සේ දරුවෝ ලැබුණාමත් හැමදේම දවස ගානේ අලුත් වෙනවා වගේ නෙවෙයි මට දැනුණේ ඒකාකාරී වෙනවා වගේ. දහම්ට මං හරියට බණිනවා **“මට මේ ජීවිතේ එපාවෙලා. උදේට නැගිටිනවා, ගෙදර වැඩ කරනවා, උයනවා, දරුවෝ බලනවා, එළියට ගියත් ළමයි එක්ක තැන විතරයි වෙනස් වෙන්නෙ, ඔයාට එහෙමද? ඔයා මාසෙකට දෙතුන් වතාවක් බිස්නස් ට්‍රිප් යනවා, හොටෙල්ස්වල නවතිනවා, වෙනස් කෑම ජාති කනවා, අලුත් අය මුණගැහෙනවා මට වගේ ඒකාකාරී නෑ. මට දැන් ජීවිතේම තිත්තයි”** වගේ දරුණු දේවල් කියලා බැන්නා. හැබැයි පිරිමියෙකුට කලාතුරකින් පිහිටන ඉවසීමක් සහ කොන්දේසි විරහිත ආදරයක් තිබුණු නිසාද මන්දා දහම් ඒ හැමදේම ඉවසුවා. පුළුවන් හැම විදියටම මට උදව් කරලා, වචනෙකින්වත් මට මොකුත් නොකිය හිටියා. ඔය කාලෙදිම තාත්තා නැති වුණාම මම තවත් අවුල් වුණා. ඊටපස්සෙ අපේ පවුල් ජීවිතේ හැම ප්‍රශ්නයක්ම ඇතිවුණේ මගෙම වැරදි නිසා. මට හැමදේම ගැනම කළකිරුණා. හැබැයි මාව ආපහු අලුත් විදියට හිතන්න හුරුකළේ මගේ ජීවිතේ සිදුවුණ දේවල්ම කියලා දැන් මං දන්නවා.

දැන් හැම දවසකම ගෙවෙන විනාඩියට වඩා එළැඹෙන විනාඩිය මට අලුත්. දවස ගානේ ගෙවල් අස් කරන එක මට ඒකාකාරී නෑ කියලා දැනෙන්නෙ.

ගෙදර අස් කරන විදියෙත් දවසින් දවස වෙනසක් මට තියෙනවා. අන්තර්ජාලයෙන් ලිපි කියවලා, යාළුවන්ගෙන් අහගෙන මං ගෙදර පුංචි පුංචි තැන් ලස්සන කරනවා. මල්වලට ලොකු ආසාවක් නැති මං දැන් හැම සුමානෙම මල් පොකුරක් ගේනවා. ගෙනත් මට ආස තැනකින් තියනවා. මේ පින්තූරේ තියන්නෙත් එහෙම යාළුවෙක්ගෙන් අහගෙන Coffee Table එකට කරපු පොඩි සැරසිල්ලක්. මගේ මේ වෙනස දැකපු දහම් ඉඳලා හිටලා මට මල් පොකුරක් අරන් ඇවිත් මාව සතුටු කරනවා.

මං ආසම උයන්න, දවස ගානේ උයන එක මට දැන් ඒකාකාරී නෑ. ඒ මං දවස ගානේ උයන්නේ වෙනස් කෑම. පරිප්පු ගත්තොත් මං එක එක විදියට උයන්න දැන් දන්නවා. සුමානෙකට පාරක් අලුත් කෑමක් හදන්න උත්සාහ කරලා බලනවා. දවස ගානේ මට කොච්චර අලුත් වැඩ, සතුටු වෙන්න අලුත් කාරණා තියෙනවද කියලා හිතෙනවා විතරක් නෙවෙයි දැනෙනවා.

ජීවිතේ ඒකාකාරියි කියලා මගේ හිතට මම විසින්ම දාගෙන තිබුණු වැට මම විසින්ම කඩලා අයින් කරලා එතැනින් එළියට ආවා. ජීවිතේ දිහා ලස්සනට බලන්න පුරුදු වුණාම කොච්චර ලොකු වෙනසක් ජීවිතේ වෙනවද කියලා මං දැන් අත්දැකීමෙන් දන්නවා.

ඉතින් මට ජීවිතේ හැම දවසක්ම විශේෂයි. ඒකාකාරී කියලා හිතෙන දවසක පවා මං ලස්සන වෙනසක් දකිනවා. ඒක පුංචිම පුංචි දෙයක් වුණත් දවස පුරා මගේ හිත නැවුම්ව තියනවා. අපි කරන දේ අලුත් දේ විදියට දකින්න හුරුවුණාම අපි ඒකාකාරී කියන රාමුවෙන් ඉබේම එළියට එනවා කියන එක තමයි මම තේරුම් ගත්තු ලොකුම දේ.

ඉතින් මේ ලිපිය කියවන කෙනෙකුට මම කියන්නේ, ජීවිත ඒකාකාරී නෑ. අපි හිතනවා ඒකාකාරී කියලා. හැබැයි එහෙම හිතන එක වෙනස් කළාම හැමදාම හැමදේම අලුත්. මාත් මං හිතන විදිය වෙනස් කළා. ඒ නිසා හැමදාම මං අලුත් දෙයක් කරනවා. අලුත් දෙයක් දකිනවා.

ඒක කාටවත් වැරැද්දක් නැති, කාටවත් වේදනාවක් නොදෙන තමන්ගේ සතුට හොයාගන්න පුළුවන් පුංචි පාඩමක් විතරයි. මං මගෙන්ම ඉගෙනගත්තු.

මට නම් හෙට දවස ගෙවුණ ඊයේ දවසට වඩා විශේෂයි. ඒ නිසා අදත් මං සතුටින්.

**හෂිණී මනමේන්ද්‍ර**



**දැන් හැම දවසකම ගෙවෙන විනාඩියට වඩා එළැඹෙන විනාඩිය මට අලුත්**

**පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි.**

**සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම ‘පවුල’ නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.**



**තාත්තා නැති වුණාම මම තවත් අවුල් වුණා. ඊටපස්සෙ අපේ පවුල් ජීවිතේ හැම ප්‍රශ්නයක්ම ඇතිවුණේ මගෙම වැරදි නිසා.**



විධායක සූපවේදී
**ප්‍රසාන් විතාරණ**
හොටෙල් ඔබිලු සිලෙක්ට්
මාලදිවයින



# කේරල ක්‍රමයට උණ අඹ ගැට අච්චාරු

### අවශ්‍ය ද්‍රව්‍ය

- උණ අඹ ගැට 200g
- කැලි මිරිස් මේස හැඳි 1
- මිරිස් කුඩු මේස හැඳි 1
- විනාකිරි මේස හැඳි 4
- සීනි මේස හැඳි 2
- අබ කුඩු මේස හැඳි 2
- තලාගත් ඉඟුරු මේස හැන්දක්
- තලාගත් සුදුළූණු බිකක්
- පොල් තෙල් මේස හැඳි 2
- ලුණු පදමට

### සාදන ක්‍රමය

- අඹ ටික කෑලිවලට කපාගෙන විනාඩි තුනක් විතර උණු වතුරින් තම්බා ගන්න.
- භාජනයක් අරන් ඒකට තෙල් මේස හැන්දක් එකතු කරන්න. තෙල් ටික රත්වීගෙන එනකොට මිරිස් කුඩු, මිරිස් කෑලි, විනාකිරි, සීනි, ලුණු සහ තම්බා ගත්තු අඹ ටික එකතු කරන්න. විනාඩි පහකට පස්සේ මිශ්‍රණය ලිපෙන් ඉවත් කරන්න.
- තවත් භාජනයක් අරගෙන ඒකට සුදුළූණු, ඉඟුරු සහ ඉතිරි තෙල් මේස හැන්ද එකතු කරලා හොඳින් මිශ්‍ර කරන්න. දැන් මේ මිශ්‍රණයට අපි හදාගත්තු අඹ මිශ්‍රණයත් එකතු කරලා පැය 24 ක් විතර වහලා තියන්න. මේ අඹ අච්චාරුව දවස් හතක් විතර තියාගෙන කෑමට ගන්න පුළුවන්.



# මොනරකුඩුම්බිය මිශ්‍ර එරබදු දළු සලාදය

### අවශ්‍ය ද්‍රව්‍ය

- ලපටි මොනරකුඩුම්බිය දළු 50g
- එරබදු දළු 100g
- රතු ළූණු 30g
- කෝරින් තෙල් ස්වල්පයක්
- තක්කාලි 50g
- ගාගත් පොල් 10g
- දෙහි යුෂ ස්වල්පයක්
- අයිස් වතුර කෝප්පයක්
- අවශ්‍ය පදමට ලුණු

### සාදන ක්‍රමය

- මොනරකුඩුම්බිය දළු ටික සිහින්වට ලියාගන්න.
- එරබදු දළු ටික අතින් පොඩියට කඩලා අයිස් වතුරට දාගන්න.
- භාජනයක් අරගෙන තක්කාලි, පොල්, දෙහි යුෂ, ලුණු, රතු ළූණු, තෙල් මේ සේරම දාලා හොඳින් මිශ්‍ර කරගන්න.
- අවසානයේදී කපාගත්තු මොනරකුඩුම්බියයි, මිශ්‍රණයට කඩා ගත් එරබදු දළුයි එකතු කරලා හැන්දකින් මිශ්‍ර කරන්න.



# බුත්සරණ අල කූලර්

**අවශ්‍ය ද්‍රව්‍ය**

- බුත්සරණ අල 100g
- ඉඟුරු 20g
- කුරුඳු කුඩු 5g
- අවර්ණ පැණි බීම වර්ගයකින් කෝප්පයක්
- සීනි 500g
- අයිස් වතුර කෝප්ප 1/2
- අයිස් කැට දෙක තුනක්

**සාදන ක්‍රමය**

- බුත්සරණ අල ටික සුද්ද කරලා කැබලිවලට කපාගන්න.
- බුත්සරණ අල ඉඟුරු සහ වතුර කෝප්ප 1/2 යි එකට හොඳින් බ්ලෙන්ඩර් කරගන්න.
- බ්ලෙන්ඩර් කරගත්තු මිශ්‍රණය පෙරාගන්න. එයට පැණි බීම, සීනි සහ කුරුඳු කුඩු එකතු කරලා නැවතත් බ්ලෙන්ඩර් කරලා අයිස් කැට එකතු කරලා පිළිගන්වන්න.



# පරණ පාන්වලින් පැටිස්

**අවශ්‍ය ද්‍රව්‍ය**

- දවස් දෙක තුනක් පරණ පාන් පෙති 5
- තක්කාලි 100g
- බැසිල් කොළ 25g
- කපාගත්තු ළූණු 50g
- අමුමිරිස් 100g
- දෙහි යුෂ ස්වල්පයක්
- පදමට ලුණු
- ඔලිව් තෙල් ස්වල්පයක්
- බැද ගැනීමට තෙල්
- බිත්තරයක්

**සාදන ක්‍රමය**

- පාන් පෙතිවල වාටි ඉවත් කරගන්න. වාටි කොටස් කුඩා කැබලවලට කපලා භාජනකට දාගන්න. ඒකට තක්කාලි, බැසිල් කොළ, ළූණු, අමුමිරිස්, දෙහි යුෂ, ලුණු, ඔලිව් තෙල් මිශ්‍ර කරලා මිශ්‍රණයක් හදාගන්න.
- කපාගත්තු පාන් පෙති රෝලින් පින් එකක් අරන් තුනී කරන්න. හදාගත්තු මිශ්‍රණයෙන් ටිකක් එකතු කරලා බිත්තර සාරු ස්වල්පයක් ආලේප කරලා පැටිස් එක අලවලා බැදගන්න.



# මල් පෙති පපඩම්

## අවශ්‍ය ද්‍රව්‍ය

- මුස්සැන්ද මල් පෙති 20
- බිත්තර දෙකක්
- බිස්කට් කුඩු
- බැද ගැනීමට තෙල්
- පදමට ලුණු
- ගම්මිරිස් ස්වල්පයක්

## සාදන ක්‍රමය

- බිත්තර දෙකට ලුණු, ගම්මිරිස් මිශ්‍ර කරලා හොඳින් කලවම් කරගන්න.
- පිරිසිදු කරගත්තු මුස්සැන්ද මල් පෙති බිත්තර සාරුවේ දවටාලා බිස්කටු කුඩුවල තවරාගෙන රන්වන් පාට වනතුරු බැදගන්න.



# ඕලු දළු කරිය

## අවශ්‍ය ද්‍රව්‍ය

- වීසි කරන ඕලු දළු 10
- ලුණු මේස හැඳි 2
- අඹරා ගත් ඉඟුරු, සුදුළූණු 10g
- අබ තෙල් මේස හැන්දක්
- ලුණු පදමට
- අමු මිරිස් කරල් 2 ක්
- කහ කුඩු 10g
- මිරිස් කුඩු 10g
- කොත්තමල්ලි පවුඩර් 10g
- සූදුරු කුඩු 10g
- කළු කුඩු 10g
- වතුර කෝප්ප 2

## සාදන ක්‍රමය

- ඕලු දඬු ටික සූරලා කැබලවලට කපාගන්න.
- භාජනයක් ලිපෙන් තියලා ඒකට තෙල් ස්වල්පයක් එකතු කරලා ළූණු, අමු මිරිස්, ඉඟුරු, සුදුළූණු එකතු කරගන්න. මිශ්‍රණය රන්වන් පැහැ ගැන්වුණාම ලුණු, කහ, මිරිස් කුඩු, කොත්තමල්ලි කුඩු, කළු කුඩ, සූදුරු කොඩි එකතු කරගන්න.
- විනාඩියක් විතර ගියාට පස්සේ කපාගත්තු ඕලු දඬු ටික එකතු කරලා වතුර කෝප්ප දෙකක් විතර එකතු කරලා හොඳට පිසගන්න. අවශ්‍ය නම් පොල් කිරි එකතු කරගන්නත් පුළුවන්.

# රස-ගුණ වගේම කෑම පිඟානේ පාටත් වැදගත්

ලංකාවේ අපේ ප්‍රධාන ආහාරය බත් නිසා තුන්වේලම බත් කන්න තමයි අපි හුරුවෙලා තියෙන්නේ. හැබැයි ගොඩක් අය බත් කද්දී බඩ පුරවගන්න විදිය ගැන හිතුවට පෝෂණය ගැන හිතන්නේ හරි අඩුවෙන්. ඉතින් ඒ වැරදි ආහාර රටාව නිසාම අද අපි අතර දියවැඩියාව, අධිරුධිර පීඩනය වගේ ලෙඩරෝගත් බහුල වෙලා. ඒ නිසා කෑම හදද්දී රස වගේම ගුණ ගැනත් හිතන්න පුළුවන් නම් සෞඛ්‍ය ගැටළු බොහොමයකට එතැනින්ම විසඳුම් හොයාගන්න පුළුවන්. අනිත් කාරණාව තමයි කෑම පිඟානේ තියෙන වර්ණ සංයෝජනය. කෑම රුචිය වඩවන්න කෑම එකේ පාටත් ඉතාම වැදගත්. ඒ නිසා කාට වුණත් කන්න හිතෙන විදියේ කෑම පිඟානක් පිළිගන්වන්නේ කොහොමද කියන එක ගැන අදහසක් ගන්න මේ කෑම පිඟන් ටික ඔබට උපකාර වේවි.



**01.**
රතු කැකුළු බත්
මුරුංගා කිරට
ගොටුකොළ සම්බෝලය
හාල්මැස්සන් බැදුම
තම්බපු බිත්තර



**02.**
නාඩු හාල් බත්
වැටකොළු කිරට
තම්බපු බෝංචි, තක්කාලි සලාදය
බිත්තර ඔම්ලට්



**03.**
සුදු කැකුළු බත්
පරිප්පු කිරට
සුදුළූණු මිශ්‍ර පොල් සම්බෝල
බැදපු පොඩි මාළු
වැරණිය මිරිස්



**04.**
නාඩු හාල් බත්
දෙල් කිරට
ඇඹරැල්ලා මාලුව
බෝංචි තෙලට
බණ්ඩක්කා සලාදය
බැදපු පොඩි මාළු



**05**
රතු කැකුළු බත්
එළබටු හාල්මැස්සන් හින්දුම
බීට් රූට් කිරට
කරවිල සම්බෝලය

සුරංජි උඩකන්ද



# එදා පත්තර පිටුවකින් කපලා බිත්තියේ අලවපු රෝස පාට රේන්ජ් රෝවර් එක අද තියෙන්නේ මගේ ගෙදර

## නිරූපන උපදේශිකා ත්‍රිකලා ධරණී

**"අහලා තියෙනවද මිනිස්සු කියනවා 'අපෝ සල්ලි නම් මොනවද නිකන් කඩදාසි කොළ කෑලිනේ' කියලා. හැබැයි දැකලා තියෙනවද කවදා හරි ඒ නිකන් කඩදාසි කොළ කෑල්ලක් කුණු කූඩයක තියෙනවා. ඒක නිසා එක තැන පල්වෙන මිනිස්සුන්ගේ කතාවලට රැවටෙන්නේ නැතුව පුලුවන් කාලේ උපරිමයෙන් හම්බකරගන්න. මොකද ජීවිතේ කියන්නේ සල්ලිම නොවුනට ජීවිතේ විඳින්න සල්ලි ඕනේ."**

ධරණී සමග කතාබහට මුලපුරමින් එසේ කියන්නී ත්‍රිකලා ධරණී ය. බොහෝ දෙනෙක් ඇයව දන්නේ රෝසපාට රේන්ජ්රෝවර් එකක් ඇති නිරූපණ ශිල්පිනිය කී විටය. ලංකාවේ රේන්ජ්රෝවර් රථ කොපමණ තිබුනත් රෝස පාට රේන්ජ්රෝවර් රථයක් ඇත්තේ ඇයට පමණි. ඒ නිසා සතුටින් ජීවිතය දරන මේ අපූරු රථයේ හිමිකාරියට මෙවර **"ධරණී"** කවරය දරා සිටින්නට අපි ඇරයුම් කළෙමු.

**"මම ඉපදුනේ හොරණ. මගේ අම්මයි තාත්තයි දෙන්නම ගුරුවරු. මට අක්කා කෙනෙක් සහ මල්ලි කෙනෙක් ඉන්නවා. ආර්ථික අතින් ලොකුවට ප්‍රශ්න නොතිබ්බත් අපි මහ ලොකු සල්ලිකාරයෝ නෙමෙයි. ඒත් අම්මලා අපිට පුළුවන් විදිහට හැමදේම දුන්නා. හැබැයි යමක් කමක් තේරෙන කාළේ ඉඳලම තනියම සල්ලි හොයාගන්න ඕනේ කියන හැඟීම තදටම මගේ හිතේ තිබුණා. ඉතින් අවුරුදු පහළොව විතර වෙද්දි ඉගෙන ගන්න ගමන්ම මම ටියුෂන් පන්තියක් පටන්ගත්තා. ඒ හොයපු මුදලින් මැහුම් ගෙතුම් ඉගෙන ගත්තා. මගේ පළවෙනි ෆෝන් එක ගත්තෙත් ඒ සල්ලි වලින්. පස්සේ මම අන්තර්ජාලය හරහා නොයෙකුත් දේවල් කියෙව්වා. රූපලාවණ්‍ය, ඇඳුම් නිර්මාණය කිරීම වගේම හොඳට උයන්න පිහන්න ඉගෙනගන්නත් අමතක කළේ නෑ."**

ඔය අතරවාරයේ සාමාන්‍යපෙළ ප්‍රතිඵල පැමිණි අතර කවදත් ඉගෙනුමට මුල්තැන දුන් ත්‍රිකලාගේ විභාග ප්‍රතිඵලය වූයේ A සාමාර්ථ 10 කි. පසුව ඇය ජීව විද්‍යා අංශයෙනුයි උසස් පෙළ විභාගයට පෙනී සිටියේ.

**"උසස් පෙළ විභාගය කරලත් ප්‍රතිඵල එනකල් මං නිකන් බලාගෙන හිටියේ නෑ. රසායන විද්‍යාව විෂයට ටියුෂන් පන්තියක් කරන්න පටන් ගත්තා. ඒ ලැබෙන මුදලින් කොටසක් ඉතුරු කළා. ඉතුරු කොටසින් පිටරටින් ඇඳුම්, ඔරලෝසු වගේ විසිතුරු බඩු මෙහෙට ගෙන්නගෙන ලංකාවේ කඩවලට දැම්මා"**

පුංචි සන්ධියේ සිට තමා කරන කියන හැමදේටම මුදල් හොයාගත්තේ ඇයමය. ඒත් ත්‍රිකලා තම සිහින හඹා ගියේ එක රැයකින් නම් නොවේ.

**"ඉතින් ඔය අතරේ උසස් පෙළ ප්‍රතිඵල ආවා. ඒත් මට වෛද්‍යවිද්‍යාලයට යන හීනය හැබෑ කරගන්න බැරිවුණා. එදා මං පුදුම විදිහට මානසිකව වැටුණා. ඔය අතරේ අහම්බෙන් වගේ මට ධනාත්මක චින්තනය, ආකර්ශණ නීතිය වගේ දේවල් දැනගන්න ලැබුණා. අන්තර්ජාලය හරහා ඒ ගැන මම හොඳ හැදෑරීමක් කළා.සිතුම් පැතුම් ධනාත්මක විදිහට වෙනස් කරගත්තා. හරි අරමුණක් හඳුගෙන ඒ දේවල් ගැන නිතරම හිතන්න පටන් ගත්තා. ඇත්තම කිව්වොත් මගේ හීන වලට යන්න පාර කැපෙන්නේ එතැනින්. ඒක තමයි මගේ ජීවිතේ හැරවුම් ලක්ෂය."**

බිංදුවටම වැටුනු පසු යලි නැගිටීම හිතන තරම් පහසු මෙන්ම අපහසුද නැත. නමුත් ත්‍රිකලා සතුව තිබූ ආත්ම ශක්තිය නිසාම ඇය තවත් පාරක් සොයා ගන්නීය. ඒ පොලවේ සිට නොව අහසින් ගොස් තම සිහින හඹා යාමටයි. ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ගුවන් සේවිකාවක් වශයෙන් සේවයට බැඳුනු ඇය කෙටි කලක් එහි සේවය කර විවාහය නිසා ගුවනට සමු දුන්නාය.

**" මං විවාහ වුණේ ගුවන් නියමුවෙක් එක්ක. එයා ඉනෝක පෙරේරා. විවාහයෙන් පස්සේ මං අවුරුදු කීපයක් ජීවත්වුනේ ඩුබායිවල. ඔය අතරේ ඒ රටේ "Mom and Daughter" කියලා ෆැෂන් ශෝ එකක් තිබුනා. මට එතකොට පුංචි දුවෙක් ලැබිලා හිටියේ. මං නිකමට වගේ ඒ තරඟයට සහභාගී වුණා. ඊට පස්සේ 2017 වසරේ ශ්‍රී ලාංකීය විශ්ව විවාහක රූ රැජින වෙන්නත් මට පුළුවන් වුණා. පස්සේ දකුණු අප්‍රිකාවේ පැවැත්වුණු මෙහි ලෝක තරගාවලියට ලංකාව නියෝජනය කරමින් සහභාගි වුණේ මමයි. එතැනදි මට පුළුවන් වුණා රටවල් අනුවක තරගකාරියන් අතරින් 'Mrs Universe Honestly' කියන කිරුළ දිනා ගන්න."**



ත්‍රිකලාට නිරූපණ ක්ෂේත්‍රයට මඟ විවර කළේද ඒ ජයග්‍රහනයයි. ඇය පවසන්නේ විවිධ සිදුවීම් නිසා මතුවුනු විවේචන තිබුනත් නිරූපණ ක්ෂේත්‍රය යනු ඉතා ගෞරවනීය එකක් බවය. එසේම නිරූපණ ශිල්පිනියකට තමාගේම අනන්‍යතාවයක් තිබිය යුතු බවය. ත්‍රිකලා මේ වනවිට නිරූපන උපදේශකවරියක් වශයෙන් කටයුතු කරමින් සිටින අතර නිරූපණ පාසලක් ආරම්භ කිරීමටද සූදානමින් සිටියි.

ත්‍රිකලා පිළිබඳව නොදැන සිටි බොහෝදෙනෙක් ඇය ගැන කතා කරන්නට පෙළඹෙන්නේ ඇගේ සුඛෝපභෝගී රේන්ජ්රෝවර් රථය නිසාය.

**"මම පොඩි කාලේ ඉඳලා ලොකුවට හීන දැක්ක කෙනෙක්. ලොකු වුණාම හොඳම වර්ගයේ කාර් එකක් ගන්නවා කියන එක මම පොඩි කාලේ ඉඳලා දැකපු හීනයක්.මම නිරූපණයට ආපු මුල් කාලේ දැක්කා පිටරට නිරූපණ ශිල්පිනියන්ට ලස්සන ලස්සන කාර් තියෙනවා. ඉංග්‍රීසි පත්තරක මං දැක්කා රෝස පාට රේන්ජ්රෝවර් කාර් එකක පින්තූරයක්.ඒ වගේ කාර් එකක් මම ලංකාවේ දැකලා තිබුණේ නෑ. එවෙලේම මම ඒක කපලා මට පේන තැනක බිත්තියකින් ඇලෙව්වා. එහෙමයි කියලා එක රැයින් රේන්ජ්රෝවර් ගන්න මට සල්ලි තිබුණේ නෑනේ. සල්ලි ටිකක් එකතු කරලා පාවිච්චි කරපු ලාන්සර් එකක් ගන්න තමයි මුලින්ම මම හිතාගෙන හිටියේ. ඔය කාලෙම තමයි මම ගුවන් සේවිකාවක් වුණේ. ඉතින් සල්ලි ටිකක් එකතු කරලා හොන්ඩා ස්පෝට්ස් කාර් එකක් ගත්තා.ඒක තමයි මගේ මුල්ම කාර් එක. පස්සේ ඒක වැඩි ගානකට විකුණලා වෙනත් වාහනයක් ගත්තා. ඔය වගේ පාවිච්චයට ගත්තු වාහන කීපයක්ම අළෙවි කරලා හොඳ ලාබයක් ලබාගත්තා. ඉතින් ඒ මුදල් සහ මම වෙහෙස මහන්සියෙන් හරිහම්බ කළ මුදල් එක්කාසු කරලා කාටවත් ණය නොවී ලංකාවට පළවෙනි වතාවට රෝස පාට රේන්ජ්රෝවර් එකක් ගෙන්නන්න මට පුළුවන් වුණා. ඉතින් මම එදා දැක්ක ඒ ලොකු හීනේ අද හැබෑ වෙලා. ඒ කාර් එක මගේ ගේ ඉස්සරහා නවත්තලා තියෙද්දි දැනෙන සතුට වචන වලින් නම් කියාගන්න බෑ. ඉතින් මම කාටත් කියන්නේ ලොකුවට හීන දකින්න.නිතරම ඒක කරන්න පුළුවන් කියලා හිතන්න."**

මේ අතර පසුගිය දිනෙක ඇය ඇගේම ගීතයක් එළිදැක්වූවාය. ඒ ගැන විමසද්දී ඇය පවසා සිටියේ තමන් වයස අවුරුදු පහළොවේදී ඉන්දියාවේ ලක්නව් විශ්වවිද්‍යාලයෙන් සංගීත විශාරද උපාධිය සම්පූර්ණ කර ඇති බවත් එය පවුල් පසුබිමෙන් එන හැකියාවක් බවත්ය.

ත්‍රිකලාට ජීවිතය පිළිබඳව පවතින දැක්ම ඇගේ වයසට වඩා මුහුකුරා ගිය එකක් වග දැනෙන්නේ ඇය අභියෝග වලට මුහුණ දීමට කල්තියා සූදානම් වී ඇති අයුරු දකිද්දීය.

**"මනුස්සයෙක් වුනාම ජීවිතේ එකම දෙයකට කොටු නොවී විෂය ක්ෂේත්‍ර කීපයක දැනුමක් ලබාගන්න ඕනේ. මං මේ කියන්නේ පොතපතේ දැනුම ගැන විතරක්ම නෙවෙයි. එතකොට කවදාවත් ජීවිතේ ෆේල් වෙන්නේ නෑ. දැන් මට ජීවිතේ ගැන බයක් නෑ. මට නිරූපණය නැතිවුනොත් ගුවන් සේවිකාවක් වෙන්න පුළුවන්. ඒක නැතිවුණොත් ගුරුවරියක් වෙන්න පුළුවන්. ඒකත් නැතිවුණොත් මැහුම් ගෙතුම් කරලා හරි ජීවත් වෙන්න පුළුවන්."**

සතුටින් ජීවිතය දරන්නියක් වෙන ඇය අවසානයේ ඔබ වෙනුවෙන් සුන්දර පණිවිඩයක් දෙන්නටද අමතක නොකළාය.

**"ප්‍රතිඵල නෑ කියලා කවදාවත් අරමුණක් වෙනුවෙන් යන ගමනක් අතරමඟ නතර කරන්න එපා. පතලක කැණීමක් කරන කෙනෙක්ට එකපාරම ඉල්ලමක් ලැබෙන්නේ නෑනේ. එයා නොපෙනෙන මැණිකක් වෙනුවෙන් තමයි දිවා රෑ කැණීම් කරන්නේ. එහෙම මහන්සි වෙන්න එයාට ශක්තිය ලැබෙන්නේ බලාපොරොත්තු සහ විශ්වාසය තුළින්. ඒ නිසා කිසිම වෙලාවක බලාපොරත්තු අත්හරින්න එපා. විශ්වාසය නැති කරගන්නත් එපා"**

ඇගේ කතාව ඇගේම හඬින් අහන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න

**රුවන් එස්.සෙනවිරත්න**

ඡායාරූප - **ක්‍රිෂාන් කාරියවසම්**

# ගම්පහ වලව්වේ තිඹිරිගෙයින් ඇසෙන අද්භූත විළිරුදා හඬ කාගේද?

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

ගම්පහ දිස්ත්‍රික්කයේ පිටිසරබද පෙදෙසක පිහිටි වසර සිය ගණනකටත් වඩා පැරණි වලව්වකින් ඇතැම් රාත්‍රී කාලයන්හි ඇසෙන අද්භූත කාන්තා විලාපයක් පිළිබඳව හිතවතෙකුගෙන් මට මුල්වරට අසන්නට ලැබුණේ මීට වසර පහකට පමණ කලිනි. ඔහු වැඩිදුරටත් කියා සිටියේ එය සියවසකට පමණ පෙර එහි ජීවත්ව සිට දරු ප්‍රසූතියකදී මියගිය වලව්වේ ළමාතැනීගේ විළිරුදු හඬ බවට ප්‍රදේශයේ ගම්මුන් පවසන බවයි. එමෙන්ම ඒ හඬ ඇසෙනුයේ වලව්වේ **'වැදුම් ගේ'** නමින් පොළොව යටට වන්නට තිඹිරි දැවයෙන් නිමවූ විශේෂ කුටියකින් බවද දැනගත හැකි විය. අතීතයේ ප්‍රභූ නිවෙස් හෙවත් වලව්වල මෙවැනි පෞද්ගලික සූතිකාගාර තනා තිබූ අතර ඒවා තිඹිරි දැවයෙන් තනා තිබීම මත **'තිඹිරි ගෙවල්'** යනුවෙන් හැඳින්වීය. ඒවායේ දරුවන් ප්‍රසූත කරන කාන්තාවන්ට ප්‍රසූතිය සිදුවන අවස්ථාවේ එල්ලී සිටීම පිණිස යහනට ඉහළ බාල්කයක එල්ලා ඇති සවිමත් වරපට හෙවත් කඹය හඳුන්වනුයේ **'විළි රැඳන'** යනුවෙනි.

මේ අතර එම කාන්තා විලාපය සම්බන්ධයෙන් එම ප්‍රදේශයේ පැතිර ගිය තවත් කටකතාවක්ද තිබේ. එනම් වලව්වේ තිඹිරිගෙය දෙසින් නැගෙන විලාප හඬ වලව්වේ තරුණ හාම්පුතෙකුගෙන් ගැබ්බර වූ රූමත් මෙහෙකාර තරුණියකගේ බවය. දරු ගැබ මෝරා එත්ම තරුණිය වලව්වේ සිරකොට තැබූ හාම්පුතුන් ඒ තිඹිරිගෙය තුළදී ඇය කෲර වධහිංසාවලට ලක්කොට මරා දැමූ බව කියනු ලැබේ. මේවායේ ඇත්ත-නැත්ත කෙසේ වෙතත් එම වලව්වට ගොස් අද්භූත විලාපයේ සුලමුල දැනගැනීමට මා තුළ ඇතිවූයේ නොනිමි කුතුහලයකි. නමුත් ඒ සම්බන්ධයෙන් විමසීමේදී මගේ හිතවතා කියාසිටියේ වලව්වේ මුල් හිමිකරුවන් විසින් විදේශ රටක පදිංචි ශ්‍රී ලාංකේය කෝටිපති පවුලකට එය විකුණා ඇති අතර ඔවුන් බාහිර කිසිවකුටත් එහි පිවිසීම තහනම්කොට ඇති බවකි.

ඒ දිනවල ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කළ මගේ හිතවත් ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරියෙක් සිටියේය. දිනක් මම ඔහුට මෙම කරුණ කියා ඒ සම්බන්ධ වැඩිදුර කරුණු විමසීමට වලව්ව පිහිටි වසමේ ග්‍රාම නිලධාරීවරයා සම්බන්ධ කර දෙන මෙන් ඉල්ලා සිටියෙමි. ඔහු මගේ ඉල්ලීම කොතරම් හොඳින් ඉටු කළේද යත් මම ඊළඟ ඉරුදින උදෙන්ම ගොස් එම වසමේ ග්‍රාම නිලධාරීවරයා හමුවීමි.

> **ඔය වලව් වත්තට කිසිම කෙනෙක් ඇතුල් කරගන්න මටවත් බෑ. මොකද ඔය වලව් වත්ත වටේටම දවසේ පැය විසිහතරේම සීසීටීවී වැඩ කරනවා. ඒ වගේම ඔය පවුලේ අය සැරින් සැරේ එහේ ඉඳලා ඒ සීසීටීවී දර්ශන බලනවා**

ඔහු කී අන්දමට එම වලව්වේ වර්තමාන හිමිකරුවන් විදේශ පුරවැසිභාවයක් හිමි ශ්‍රී ලාංකික පවුලක් වන අතර, ඔවුන් රුපියල් කෝටි ගණනක් වටිනා එම දේපල මිලට ගෙන ඇත්තේ මීට වසර දහයකට පහළොවකට කලිනි. මේ වනවිට ඒ වලව් භූමිය තුළ උද්‍යාන කම්කරුවෙකු සහ වලව්වේ අභ්‍යන්තර සේවයට තලතුනා යුවළක් රැඳී සිටිති. එමෙන්ම මේ වනවිට වලව්වේ සියලු වගකීම් පවරා ඇත්තේ එම ප්‍රදේශයේ තරමක පිළිගැනීමක් සහිත ගැමියෙකුටය.

**"ඔය වලව් වත්තට කිසිම කෙනෙක් ඇතුල් කරගන්න මටවත් බෑ. මොකද ඔය වලව් වත්ත වටේටම දවසේ පැය විසිහතරේම සීසීටීවී වැඩ කරනවා. ඒ වගේම ඔය පවුලේ අය සැරින් සැරේ එහේ ඉඳලා ඒ සීසීටීවී දර්ශන බලනවා. කොහොමහරි ඔය කියන විලාප සද්දේ ඔය වලව්වේ රැයක් ගත කරපු සමහරුන්ට ඇහිලා තියෙනවා නම් තමයි. ඒක මෙලෝ යකෙකුට අහගෙන ඉන්න බැරි ඇඟ කිළිපොලා යන විලාපයක්ලු."**

ග්‍රාම නිලධාරීවරයාද සමඟ වලව්වේ වත්මන් භාරකරුගේ නිවසට ගියවිට ඔහු එය කීවේ රහසක් ලෙස තබාගන්නා ලෙස අපව දිවුරා පොරොන්දු කරවා ගනිමිනි.

**"ඕක මේ පැත්තේ මිනිස්සු අතරේ පැතිරෙන කතාවක්. නමුත් පුදුමේ කියන්නේ පහුගිය ටිකේ ඔය වලව්වේ රෙපයාර් වැඩකට මම මාතරින් බාස්උන්නැහේලා කට්ටියක් ගෙන්නවා ගත්තා. මොකද බස්නාහිර පළාතේ කිසිම කෙනෙක් ඔය වලව්වට ගන්න එපා කියලා ඒ අයිතිකාර මහත්තයා එකහෙළාම කියලා තියෙන හින්ද. ඒ මාතර මිනිස්සු ඔය විලාපේ ගැන හාංකවිසියක් දන්නේ නෑ. ඒත් ඒ මිනිස්සු ඔය වලව්වේ හිටපු මුල් දවසේ රෑම ඔය මර විලාපේ ඇහිලනේ."**

> **ඒ මාතර මිනිස්සු ඔය විලාපේ ගැන හාංකවිසියක් දන්නේ නෑ. ඒත් ඒ මිනිස්සු ඔය වලව්වේ හිටපු මුල් දවසේ රෑම ඔය මර විලාපේ ඇහිලනේ**

එම වලව්වේ භාරකරු කියා සිටියේ බොහෝදෙනෙකුට අගමුල වටහාගත නොහැකි ප්‍රහේළිකාවක් මතු කරමිනි. ඒ අනුව එම අද්භූත විලාප හඬ පසුපස තවදුරටත් ලුහුබැඳ යාමට සිතූ මම දැනට ඒ වලව්ව තුළ ජීවත්වන වියපත් යුවළේ පිරිමියා මඳකට මුණගස්වන මෙන් භාරකරුට කන්නලව් කළෙමි. එහි ප්‍රතිඵලය වූයේ ඊළඟ සතියේ දිනයක ඒ යුවළේ පිරිමියා **'විනාඩි පහකට'** ඉන් බැහැර ස්ථානයකදී මුණගැසීමට මට හැකිවීමයි.

**"ඔය ඉස්සර මැරුණාය කියන ළමාතැනීගේ විලාපය නිකම්ම ඇහෙන්න විදියක් නෑනේ. හුඟක් වෙලාවට ඕක මතුවෙන්නේ ඔය වලව්වේ ඉන්න ගෑනු කෙනෙකුගෙන්. ඉතින් මුර උන්නැහේගේ හාමිනේ විතරයි නේද දැන් ඔය වලව්ව ඇතුළේ ඉන්න එකම ගෑනු කෙනා?"** මම ඔහු හා සුහද පිළිසඳරකින් පසු ඇසීමි.

**"ඇත්තටම ඒකම තමයි මහත්තයෝ සිද්ධ වෙන්නේ. හිටපු ගමන් දවසක රෑට අපේ ගෑනි මහ රෑ යටිගිරියෙන් බෙරිහන් දෙන්න පටන් ගන්නවා. බැරි වෙලාවත් වලව්වට පිටින් කවුරුහරි ආවොත් එද රෑට අපේ ගෑනි නොවරදවාම ඔහොම යටිගිරියෙන් බෙරිහන් දෙනවා."**

මුරකරු කීය. ඔහු වැඩිදුරටත් කියා සිටියේ, ඒ බව හෙළිකිරීම මත තමන්ගේ රැකියාව සහ ඒ වාසස්ථානය අහිමි වන නිසා එය රහසක්ව තබාගන්නා බවය.

නමුදු එය ඒ මුරකරුගේ බිරිඳ තුළ පවතින මායාකාරී පෞරුෂය (Hysterical Personality) නම් වන තත්ත්වය සහ ඔවුන් ජීවත්වන නිහඬ පාලු පරිසරය මුල්කොට ඇගේ උප විඥානයෙන් මතුවන මනෝ කායික ක්‍රියාකාරීත්වයක් මුල්කොට සිදුවන්නක් මිස අතීත සිද්ධියක් සම්බන්ධ කිසිඳු ගුප්ත ක්‍රියාකාරීත්වයක් නොවන බව මම ඔහුට පහදා දුනිමි.

**පසුවදන -**

**මේ සම්බන්ධයෙන් ඉකුත් සතියේ එම වලව්ව භාරකරුගෙන් කළ විමසීමකදී මට තහවුරු කරගත හැකිවූයේ මේ වනවිට ඒ වලව්වේ හිමිකාරිත්වය වෙනත් පුද්ගලයෙකුට පැවරී ඇති අතර වලව්ව, එහි සේවය කළ යුවළ, උද්‍යාන කම්කරුවා සහ තමන්ගේද කිසිඳු සම්බන්ධයක් ඔවුන්ට නොමැති බවකි.**



# ශිෂ්‍යත්වය ලෙහෙසියෙන් ජය ගන්න



# කිරණ
## මාසික අධ්‍යාපනික පුවත්පත්

## අප්‍රේල් කලාපයන් දැන් වෙළෙඳපොළේ

## 5 කිරණ පත්තරෙන් ශිෂ්‍යත්වයට ඉලක්ක ප්‍රශ්න පත්තර හතරක්...



### අරුණින් උදාවූ කිරණ

පුංචි දරුවන්ගේ දැනුම පරාසය පුළුල් කිරීම සඳහා "කිරණ" පුවත්පත දරුවන් අතට පත් කිරීම සම්බන්ධව සතුටුවෙමි. විෂයනුබද්ධ මෙන්ම විෂයබාහිර දැනුම, නවීන තාක්ෂණය ද මුසු කරමින් කියවීමට මෙන්ම සවන්දීමට ද හැකි පුවත්පතක් දරුවන් අතට පත්විම දරුවන්ට මෙන්ම දෙමාපියන්ට ද නව අත්දැකීමක් වනු ඇත. පුළුල් අත්දැකීම සහිත ප්‍රවීන ඇදුරු මඩුල්ලක් සමගින් දැයේ දරුවන්ගේ දැනුම් නිම්වළලු පුළුල් කිරීමට "කිරණ" දරන උත්සාහය සාර්ථක වේවායි පතමි.

**උදය වික්‍රමසිංහ**
විදුහල්පති
මාර/වෙහෙරගම්පිට
ඕල්කට් ආදර්ශ විදුහල, මාතර



වසර පහකින් සමන්විත ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රධාන අවධි තුනේ ම අවශ්‍යතා මැනැවින් අවබෝධ කර ගනිමින් "කිරණ" 3,4,5 ශ්‍රේණි සඳහා වෙන වෙන ම දරුවන්ට මග කියාදීමට ගත් වෑයම මහත් සේ අගයමි. එසේ ම ගුරු සේවයේ හසල අත්දැකීම් ඇති ලේඛක මඩුල්ලකගේ සහාය ලබා ගනිමින් දැනුම, ආකල්ප, කුසලතා සහ නිර්මාණශීලී චින්තනයට ද රසවින්දනයට ද දරුවා යොමු කිරීම "කිරණ" පුවත්පත් ත්‍රිත්වයේ විශේෂත්වයකි.
අභියෝගවලට සාර්ථකව මුහුණ දිය හැකි දරු පරපුරක් තැනීමට "කිරණ" පුවත්පත යාත්‍රාවක් වනු ඇත.

**පියතිස්ස රන්දෙනිගල,**
විදුහල්පති,
මාබිම විද්‍යාකර ප්‍රාථමික විද්‍යාලය,
මාකෙවිට



"කිරණ" ශිෂ්‍යත්ව පුවත්පත් අතර නව පෙරළිකාර පුවත්පතක් ලෙස සඳහන් කළ හැකි ය. එමෙන් ම ශිෂ්‍යත්ව විභාගයට අවශ්‍ය සියලුම විෂය කරුණු ආවරණය වන සේ කිරණ පුවත්පත නිර්මාණය කර තිබීම කාලෝචිත ක්‍රියාවකි. විශේෂයෙන් ම අත්දැකිම් බහුල සුදුසුකම් ලත් ගුරු මණ්ඩලයක් ලේඛක මණ්ඩලයට යොදා ගෙන තිබීම පැසසුම් සහගත ය.

දරුවන්ගේ දැනුම, සතුට, හැකියාව දියුණු කරන පුවත්පතක් ලෙස "කිරණ" පුවත්පත හැඳින්විය හැකි ය. එම නිසා ලංකාවේ ගුරුවරුන් දෙමාපියන් හා දරුවන් අතරේ කෙටි කාලයක් තුළ "කිරණ" අධ්‍යාපනික සඟරාව ව්‍යාප්ත වී ඇති බව දැකීම සතුටට කාරණයකි.

**සමිතා ද සිල්වා**
විදුහල්පතිනි
බප/මීග/ගොන්සාලෙස් මහා විදුහල, පමුණුගම, ජාඇල



## දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් හා පොත්හල්වලින් දැන් මිලදී ගත හැක




මැයි 21 වැනිදා සිට
සෑම සෙනසුරාදාවකම
පෙරවරු 8.00 සිට 12.00 දක්වා

කිරණ
ශිෂ්‍යත්ව පුවත්පත හා සමගාමීව පැවැත්වෙන
fm දෙරණ ශිෂ්‍යත්වය හරි ලේසියි
පාඩම් මාලාව
සෑම සතියේ දිනකම
පෙරවරු 6.00 සිට 7.00 දක්වා

# කොලැජන් එක්ක තරහා වෙලා බියුටි සැලෝන් යාම

## දෙවියොත් එක්ක තරහ වෙලා දේවාලෙට යනවා වගේ වැඩක්

දන්නවද ලියු යෙලින් කියන්නේ කවුද කියලා? ඇය තමයි ලෝකයේ ළාබාලතම පෙනුම තියෙන වැඩිහිටි කාන්තාව. මෙයා විශ්‍රාමික චීන කතක්. පනහ පැන්නට මොකද ඇයට තියෙන්නේ අවුරුදු දහතක පොඩි කෙල්ලෙක්ගේ පෙනුමක්. ලියුගේ සමේ රැළි, ලප, පැල්ලම් ඔය කිසිම දෙයක් නෑ. අහලා දැනගත්තොත් මිසක බැලූ බැල්මට ඇගේ වයස කියන්න අද වෙනකල් කිසිම ජගතෙක් සමත් වෙලා නැහැයිලු. ඔන්න ඉතින් දවසක් රූපවාහිනී නිවේදිකාවක් ලියුගෙන් මෙහෙම අහනවා.

**"ලියූ ඇත්තටම ඔබේ ලස්සන වීමේ රහස මොකද්ද?"**

**"කොලැජන්... සුන්දරත්වය පිටිපස්සේ තියෙන එකම රහස කොලැජන් බව මම පුංචි කාලෙදිම තේරුම් ගත්තා. ඒ නිසා අවුරුදු විස්සේ ඉඳලාම මම කොලැජන් ගැන සැලකිමත් වුණා."**

ඒ තමයි ඇගේ උත්තරය. කතාව ඇත්ත. සමහරුන්ට වයසට වඩා වයසට ගිය පෙනුමක් තියෙන්නෙත්, තව කාණ්ඩෙකට වයසට වඩා ළාබාල පෙනුමක් තියෙන්නෙත් කොලැජන්වල ආනුභාවයෙන් තමයි. **'ධරණී'** රූපලාවණ්‍ය පිටුව කියවන අපේ ආදරණීය ලලනාවන්ට නම් කොලැජන් කියන එක අමුතු වචනයක් නෙමෙයි. මොකද මීට කලින් අපි කොලැජන් පුනර්ජනනය කරන රූපලාවණ්‍ය සත්කාර ඇති පදමට කියලා දීලා තියෙනවනේ.

රූපලාවණ්‍ය සත්කාරවලින් විතරක්ම නෙමේ එදිනෙදා ඇවතුම් පැවතුම්, ආහාරපාන වගේ දේවලිනුත් කොලැජන් වැඩිකරගන්න වගේම ඒවා රැකගන්නත් පුළුවන්. ඉතින් ඒ ගැන ටිකක් කතා කරන එක තමයි අද ලිපියේ අරමුණ.

ඇත්තටම මොනවද මේ කොලැජන් කියන්නේ? කොලැජන් කියන්නේ ස්වාභාවිකවම අපේ ශරීරයේ තියෙන ප්‍රෝටීන වර්ගයක්. සම ආශ්‍රිතව විතරක් නෙමෙයි අස්ථි, කණ්ඩරා, හිසකෙස් මේ ගොඩක් ස්ථානවල සම්බන්ධක පටක ආශ්‍රිතව තන්තු විදිහට මේ කොලැජන් ප්‍රෝටීනය පිහිටලා තියෙනවා. අපේ ශරීරයේ වැඩිපුරම තියෙන ප්‍රෝටීනය තමයි කොලැජන්.

අපේ චර්ම සෛල තට්ටුවට යටින් කොලැජන් තට්ටුවකුත් තියෙනවා. මෙතැන තියෙන කොලැජන්වල ප්‍රමාණය වැඩියි නම් මේ තට්ටුව ශක්තිමත් වෙනවා. එතකොට නිතැතින්ම වගේ අපේ සමේ පිරිපුන්බව, නීරෝගීබව සහ ඇදෙනසුළු බව වැඩිවෙලා සම තරුණ වෙනවා. හැබැයි කොලැජන් තට්ටුවේ තිබෙන කොලැජන් ප්‍රමාණය අඩු නම් ඒ වගේම ඒවා ගුණාත්මක බවින් අඩු නම් සම ඉක්මනින්ම වියපත් වෙනවා. ඒ නිසා ඉතින් නිතරම මේ කොලැජන් ස්ථරය ශේප් එකේ තියාගන්න එක තමයි හමට ගුණ.

කොලැජන්වලට හානි වෙන්නේ කොහොමද? ඔන්න ඊළඟට මතුවෙන ප්‍රශ්නේ. වයසට යනකොට ඉබේටම වගේ කොලැජන් අඩුවෙනවා. ඒක ඉතින් මොන සක්කරයටවත් නවත්තන්න පුළුවන් වැඩක් නෙමේ. අවුරුදු 30-35 වෙනකොට අපේ ස්වාභාවික කොලැජන් ටිකෙන් ටික අඩුවෙන්න පටන් ගන්නවා. හැබැයි හරි විදිහට රැකබලාගත්තොත් මේ තත්ත්වය ප්‍රමාද කරන්න අපිට පුළුවන්.

කොලැජන් ලොක්කට වින කටින ප්‍රධාන දුෂ්ඨයෝ දෙන්නෙක් ඉන්නවා. ඉන් එක්කෙනෙක් තමයි සූර්යයාලෝකයේ අඩංගු අල්ට්‍රා වයලට් කිරණ (UV). ඉතින් හිරුඑළියට නිතර නිරාවරණය වෙනවා නම් සම ඉක්මනටම රැළි වැටෙන එක ගැන පුදුම වෙන්න එපා.

ඉතින් එහෙමයි කියලා අව්වේ ගමන් නොයා ඉන්නද කියන්නේ...? නෑ... නෑ එහෙම නෙමෙයි. අව්වේ ගමන් බිමන් යනවා නම් අනිවාර්යයෙන්ම හිරු ආවරණ ආලේපනයක් ආලේප කරන්න, අව් කණ්ණාඩි පළඳින්න. එතකොට කුඩ, තොප්පි වගේ දේවල් පාවිච්චි කරන්න.

කොලැජන්වල දෙවැනි සතුරා තමයි ඔයාලගේ අතිජාත මිත්‍රයා සීනි. කොලැජන් නිෂ්පාදනය අඩාල කරන්න වගේම කොලැජන් අතර බන්ධන බිඳලා දන්නත් සීනිවලට පුළුවන්. ඉතින් සීනි නොකා ඉන්න තරමට තරුණ බව රැකගන්න ලේසියි. ඒක කරන්නම බැරි වැඩක් නම් සීනි භාවිතය ටිකක් හරි අඩු කරන්න බලන්න. අපි මුලින් කතා කරපු ලියු යෙලින් කියන්නෙත් ඇය අවුරුදු පහළොව වෙද්දි සීනි භාවිතය මුළුමනින්ම වගේ නතර කළා කියලයි.

ඊළඟ කාරණාව තමයි මානසික ආතතිය. මේ ආතතිය එක්ක අපේ ශරීරයේ කෝර්ටිසෝල් කියන ස්ට්‍රෙස් හෝර්මෝනය වැඩිපුර ස්‍රාවය වෙනවා. කොලැජන්වලට හානි කරන්න මේ හෝර්මෝනයටත් පුළුවන්. ආතතියට පත්වුණාම ගොඩක් දෙනා නින්ද ගැන හිතන්නේ නැහැ. ප්‍රමාණාත්මක නින්දක් ලබානොගන්න එකත් කොලැජන් හානි වෙන්න හේතුයි. මේ හේතුව නිසා විශේෂයෙන්ම හානි වෙන්නේ ඇස් වටා සමේ කොලැජන්වලට. ඒකනේ නොනිදා හිටියම ඇස් යට කළු වෙන්නේ. ඒ නිසා දවසට පැය හතක්වත් නිදාගන්න බලන්න. මානසික ආතතිය අවම කරගන්න යෝගා, භාවනා වගේ දේවල් කරන්න. ඒ වගේම තමයි හැමදාම අඩු තරමේ විනාඩි විස්සක්වත් ව්‍යායාම කරන්න බලන්න. ඒකෙන් අපේ ශරීරයේ රුධිර සංසරණය ක්‍රමවත් වෙලා කොලැජන් නිපදවීම වැඩිවෙනවා. ඒ වගේම මානසික ආතතිය අඩු කරගන්නත් ව්‍යායාම හොඳ ක්‍රමයක්.



**මානසික ආතතිය එක්ක අපේ ශරීරයේ කෝර්ටිසෝල් කියන ස්ට්‍රෙස් හෝර්මෝනය වැඩිපුර ස්‍රාවය වෙනවා. කොලැජන්වලට හානි කරන්න මේ හෝර්මෝනයටත් පුළුවන්**

ඒ වගේම හිතුමනාපෙට ආලේප කරන ආලේපන නිසාත් මේවට හානිවෙනවා. ඒ නිසා සමට ආලේප කරන ආලේපනවල ප්‍රමිතිය ගැන හිතන්නත් අමතක කරන්න එපා. සමට ආලේපන ගන්නකොට හයලුරොනික් ඇසිඩ්, රෙටිනෝල් වගේ සංඝටක අඩංගු දේ ගන්න. ඒවා කොලැජන් වැඩි කරන රූපලාවණ්‍ය සංඝටක.

කොලැජන් වැඩි කරගන්න උපකාරී වෙන තව උපදෙස් ටිකක් බලමු. ආහාරපානවලින් අපිට කොලැජන් සෑහෙන මට්ටමකින් වැඩි කරගන්න පුළුවන්.

විටමින් C බහුල හැම ආහාරවලටම කොලැජන් උත්තේජනය කරන්න පුළුවන්. ඊට අමතරව සෝයා, මධ්‍යම ප්‍රමාණයේ මාළු, මුහුදු ශාඛ, බිත්තර, බෙල්පෙපර්ස්, නිවිති, කන්කුන්, මුකුණුවැන්න, කුකුල් මස්, සුදුලූනු, කජු, පේර, කොත්තමල්ලි කොළ, හතු වර්ග මේ කියන ආහාරත් නිතරම ආහාරයට ගන්න බලන්න.


සමේ වියළිබව වැඩි නම් සම වගේම කොලැජන් තට්ටුවත් ඇකිලෙන්න බලනවා. ඒ නිසා වියළි සමට ප්‍රමිතිගත මොයිස්චරයිසර් ආලේපනයක් ආලේප කරන්න. අද වෙනකොට වෙළඳපොළේ කොලැජන් වැඩි කරන ආලේපන වර්ග ඕනතරම් තියෙනවා. වෛද්‍ය නිර්දේශ මත එවැනි දේ භාවිත කරන්න පුළුවන්. ගෙදරදි හදාගන්න පුළුවන් කොලැජන් පානයක් ගැනත් කියන්නම්. දෙඩම් ගෙඩියක්, කැරට්, මිදි, නිවිති එකට මිශ්‍රකරලා දිනපතා පානය කරන්න පුළුවන්. ඒ වගේම සත්ත්ව අස්ථිවලින් හදාගන්න සුප්වලිනුත් කොලැජන් වැඩි කරගන්න පුළුවන්. කොලැජන් වැඩි කරන්න කෝමාරිකාවලටත් පුළුවන්. ඉතින් දිනපතාම පුංචි කෝමාරිකා කැබැල්ලක් ආහාරයට ගන්න පුළුවන් නම් හොඳයි.

ඒ වගේම හයිපොතයිරොසිසම් සහ යම් යම් හෝර්මෝන ගැටලු නිසාත් නිසි වයසට පෙර ඇතැමුන්ගේ කොලැජන්වලට හානි වෙනවා. එවැනි තත්ත්වයන්වලදී ආහාර ඇවතුම් පැවතුම්වලින් තත්ත්වය පාලනය කරන්න බැහැ. හොඳම දේ ප්‍රතිකාර වෙත යොමුවෙන එක කියලත් මතක් කරන්න ඕනේ.

**වයසට යනකොට ඉබේටම වගේ කොලැජන් අඩුවෙනවා. ඒක ඉතින් මොන සක්කරයටවත් නවත්තන්න පුළුවන් වැඩක් නෙමේ. අවුරුදු 30-35 වෙනකොට අපේ ස්වාභාවික කොලැජන් ටිකෙන් ටික අඩුවෙන්න පටන් ගන්නවා. හැබැයි හරි විදිහට රැකබලාගත්තොත් මේ තත්ත්වය ප්‍රමාද කරන්න අපිට පුළුවන්**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

# පුතාගේ ඉගෙනීම අඩාළ වෙන්නේ ඒරාෂ්ටක අපලයට කියලයි අපිට මුලින් හිතුනේ



**සමහර නම් වල බැලූ බැල්මට විවිධ විෂයන්ට ඉතා හොඳ පිහිටීම් වැටිලා තියනවා. ඒ වගේම ඒ පිහිටීම තව දෝෂයකින් කැපිලා යනවා. අන්න ඒ වගේ වෙලාවට තත්ත්වය ටිකක් දරුණුයි**

කසුන්ට ගණිතය පාඩම වහකදුරුය. කොයිතරම් කියා දුන්නත් ගණිත ක්‍රම මතක හිටින්නේම නැත. පාසලේ ගණිත ගුරුවරයාගේ ඉගැන්වීමේ වරදක් නිසා මෙසේ සිදුවෙන්නේ යැයි සිතූ දෙමව්පියෝ කසුන්ට ගණිතය විෂය ඉගැන්වීමට බාහිර ගුරුවරුන්ගේ පිහිට සෙවූහ. එහෙත් සියල්ල ගඟට කැපූ ඉනි සේම විය. ගණිතයට ඇති දුර්වලතාව නිසාම කසුන් ගණිතය පාඩම මඟ හැර ගන්නට විවිධ උපක්‍රම යෙදීය. එහි ප්‍රතිපලයක් වශයෙන් පංති වෙලාවේ ඔහු වැඩිපුරම සිටියේ ක්‍රීඩා පිටියේය. නැත්නම් කුමක් හෝ සංගමයකය. නවය ශ්‍රේණියට පා තබද්දීත් කසුන් ගේ මේ තත්ත්වයේ වෙනසක් සිදු නොවීය. හිස ගිනි ගත්තේ දෙමව්පියන්ගේය. **"කොල්ලෙක් ගණං ෆේල් වෙලා මොකක් කරන්නද?"** දෙමව්පියන් දෙස් දෙවොල් තිබ්බේ කසුන්ගේ නොහැකියාවටය.

**"කොල්ලට අපලයක් ලබලාද කොහෙද? හොඳට හිටපු එකාට හිටි හැටියෙ මෙහෙම වුණේ ඒක වෙන්න ඇති නරකද වෙලාව පොඩ්ඩක් බැලෙව්වා නම්."** අලුත් විසඳුමක් ඉදිරිපත් කළේ කසුන්ගේ අත්තම්මාය. "අම්මා කියපු එක හරි කොල්ලට ඒරාෂ්ටකයක් ලබලා." කසුන්ගේ හඳහන රැගෙන ජ්‍යොතිෂ්‍යවේදියෙකු සොයා ගිය අම්මා නිවසට ආවේ එසේ කියාගෙනය. එතැන් පටන් සතියක් බෝධි පූජාය. විවිධ ශාන්තිකර්මය. කසුන්ගේ කරට කළු නූලක සුරයක්ද වැටුණේය.

සෑම සෙනසුරාදාවකම බෝධි පූජාය. ඒ නිසා පවුලේ සෑම නිර්මාංශය. කොතෙක් වත් පිළිවෙත් කලත් කසුන් ගණන් වලට දුර්වලය. ඉගෙනීමට ආසාවක් ඇත්තේම නැත. පාසැලේදී මිතුරු සංගමීය. පාසැලෙන් පසු යාළු මිත්‍රයන් සමඟ පාලම් බෝක්කු මුර කරන්නේය.

කසුන්ගේ හැසිරීමෙන් වැඩිපුරම සිත් වේදනා වින්දේ අම්මාය. තම ඥාති සොයුරා නිසා පුංචි අම්මා විඳින සිත් වේදනාව දරා ගත නොහැකි වූයේ කසුන්ගේ ලොකු අම්මාගේ පුතාටය. තම පවුලේ තිබූ අවුල් බොහොමයක් ඉතා පහසුවෙන් විසඳා දුන් නාම හා ශබ්ද ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක දිනාරංග මහතා ගැන සමීර තම පුංචිඅම්මාට කිව්වේය. ගිලෙන්න යන මිනිහාට පිදුරු ගසත් බොහෝ වටිනා නිසා කසුන්ගේ අම්මා වෛද්‍ය නිවංක සොයා ගියේය.

සමීර පුතාගෙ වචනය විශ්වාස කරලායි මම ඩොක්ටර් නිවංක ලඟට ගියේ. මටම පුදුමයි. ඩොක්ටර් කියපු පලාපල ගැන. අධ්‍යාපනය ගැන කියපු කාරණා හරියටම හරි.

අපි හිතන් හිටියේ ඒරාෂ්ටක අපලය නිසා පුතාගේ අධ්‍යාපන කටයුතු අඩාල වෙනවා කියලා. ඒත් ඩොක්ටර් කිව්වෙ ගණිතය විෂයට දුර්වලයි කියලා. ඒක නමින් ආපු දෝෂයක්ලු. ඒ ගණිත හැකියාවට ඇති දුර්වල කමයි දියුණුවට ඇති බාධාවයි දෙකම නමට වැටිලා තිබුණ නිසා පුතාගෙ අධ්‍යාපනය අඩාල වෙලා තියෙන්නේ. මේ තත්ත්වය නම වෙනස් කරලා හද ගන්න පුළුවන් බව ඔහු කිව්වා.

**කසුන්ට තිබුණේ ගණිතයට හා තාර්කික හැකියාවට නමෙන්ම එන බාධාවක්. ඒ නිසයි ගණිතයට දුර්වල වුණේ**

පුතාගෙ තාත්තගෙනුත් අහලා අපි පුළුවන් තරම් ඉක්මනට නම වෙනස් කළා. ඇත්තටම යන්තර පහක් හයක් දලාත් කර ගන්න බැරි වුණ දේ නම දලා මාස කීපයකින් සිද්ධ වුණා.

පුතා ටිකෙන් ටික අධ්‍යාපනය පැත්තට නැඹුරු වුණා. ඉගැන්නුවෙ එකම ගුරුවරු ඒත් ගණිතය විෂයටත් හොඳ ලකුණු ගත්තා. සාමාන්‍ය පෙළ විතරක් නෙමෙයි උසස් පෙළත් සමත් වුණා. පහුගිය දවස්වල පුතාගේ උපාධි ප්‍රදානෝත්සවය තිබුණා. දැන් එයා හීන දකින්නේ උසස් අධ්‍යාපනයට විදෙස් ගත වෙන්න.

ඒ කසුන්ගේ අම්මාගේ කතාවය. කසුන්ගේ අම්මාට අනුව පුතාට තිබුණේ ග්‍රහ අපලයට වඩා නමේ අපලයයි. ඒ අපලය සඵල කළේ නාම හා ශබ්ද ශාස්ත්‍රඥ වෛද්‍ය නිවංක දිනාරංග රත්නායකය.

නම් වලට අධ්‍යාපනයට බාධා කරන දෝෂ වැටුණු විට ඒ දරුවාගේ අධ්‍යාපනයට බාධා ඇතිවෙනවා. කසුන්ට තිබුණේ ගණිතයට හා තාර්කික හැකියාවට නමෙන්ම එන බාධාවක්. ඒ නිසයි ගණිතයට දුර්වල වුණේ.

දියුණුවට බාධාවන දෝෂයකුත් වැටිලා තිබුණ නිසා ඔහු ටිකෙන් ටික ඉගෙනුමෙන් ඈත් වෙමිනුයි හිටියේ. ඒ දෝෂ ටික ඉවත් කළාට පස්සෙ කසුන්ගෙ අධ්‍යාපනයේ ලොකු වෙනසක් සිදු වුණා. කසුන්ගෙ නම අලුතින් නිර්මාණය කරන විට මම විදෙස් පිහිටීමකුත් දැම්මා.

එහෙම කළේ කසුන්ගෙ අම්මාගෙ උවමනාවට. දැන් ඒ පිහිටීමෙන් ප්‍රයෝජන ගන්නයි කසුන් උත්සාහ කරන්නේ. අනිවාර්යයෙන් ඔහු උසස් අධ්‍යාපනයට හෝ රැකියාව සඳහා විදේශ ගතවෙනවා.

කසුන්ගෙ නමේ තිබුණෙ අධ්‍යාපනයට සම්බන්ධ එක දෝෂයක් විතරයි.ඒත් නමක ඒ වගේ තව දෝෂ කීපයක්ම තියෙන්න පුළුවන්. සමහර නම් වල බැලූ බැල්මට විවිධ විෂයන්ට ඉතා හොඳ පිහිටීම් වැටිලා තියනවා. ඒ වගේම ඒ පිහිටීම තව දෝෂයකින් කැපිලා යනවා. අන්න ඒ වගේ වෙලාවට තත්ත්වය ටිකක් දරුණුයි. ඒ වගේ පිහිටීම් අසුබයි. ගණිතයට, තර්කනයට, කලාවට, විද්‍යාවට මේ ආදී වශයෙන් විවිධ විෂයන්ට ගැලපෙන පිහිටීම් තියනවා. වෛද්‍යවරුන් ගේ නම් පරීක්ෂා කළොත් බොහෝ දෙනෙක්ට ඔය විද්‍යා විෂයන්ට අදාල පිහිටීම බලා ගන්න පුළුවන්.

අලුත උපන් දරුවෙක්ට නමක් හදද්දී අනිවාර්යෙන් ඒ දරුවාගේ අධ්‍යාපනයට සුබ පිහිටීම් දන්නම ඕනෑ. අම්මයි තාත්තයි වෛද්‍යවරයෙක් වුණාම තමන්ගෙ දරුවත් වෛද්‍යවරයෙක් කරන්න කැමතියි.

ඒවගේ වෙලාවට විද්‍යා විෂයන්ට සුදුසු පිහිටීමක් දලා නම බලවත් කළාම ඒ අරමුණට යන්න දරුවට පහසුයි. ඒක වැරැද්දක් නෙමෙයි. දරුවාට කරන යහපතක්. ඊට අමතරව දරුවාගේ සහජ දක්ෂතා තියනවා නම් ඒවාට හානියක් වෙන්නෙත් නෑ.

හැබැයි වෘත්තිය වෙන්නේ බලවත් කරන ක්ෂේත්‍රය. උදහරණයක් විදියට ඔය සිංදු කියන වෛද්‍යවරු ඉන්නේ. වෘත්තිය වෛද්‍ය වුණාට හැකියාවට බාධාවක් වෙලා නැහැනේ.

විවිධ භාෂා ප්‍රවීනතාව ලබා ගන්න වගේම අධ්‍යාපනය ලබන ක්ෂේත්‍රයෙන්ම ඉහලට යන්න පිහිටීම් තියනවා. ආචාර්ය මහාචාර්යවරු වෙලා ඉගෙන ගත්ත ක්ෂේත්‍රයේම උගන්වන්නේ ඒ පිහිටීම් තියන අය.

ඒ විතරක් නෙමෙයි ලංකාවෙ අධ්‍යාපන ක්‍රමය හැටියට එකවරම විශ්ව විද්‍යාල වරම් ලබා ගන්න පුළුවන් පිහිටීම් පවා නමකින් හදන්න පුළුවන්.

අපිට බොහොම සැහැල්ලුවට පෙනුනට ශබ්ද ශාස්ත්‍රය කියන්නේ හරි විශාල ක්ෂේත්‍රයක්. එහි ප්‍රතිඵල හරි හැටි නෙලාගන්න නම් ඒ ගැන හොඳ අවබෝධයක් තියෙන්නම ඕනෑ. ශබ්ද ශාස්ත්‍රයෙන් හරියට වැඩක් ගත්තොත් කෙනෙක්ගෙ ජීවිතේ කණපිට හරවන්න පුළුවන්.



නාම හා ශබ්ද ශාස්ත්‍රඥ
**නිවංක දිනාරංග රත්නායක**

**හිමේෂා සවන්තී රාජපක්ෂ**

# ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

66 කොටස

ඕවා ඔහොමයි. මට පුරුදු දේවල්. සමහරදාට බත් එක කකා ඉඳලා දාලා දුවනවා. මොන ජීවිතයක්ද මේ කියලා මට හිතුණාට ඔය ගොහොරුවට වැටිච්ච මිනිස්සුන්ට තේරෙන්නෙ නෑ

**මෙතෙක් කතාව**

*විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය සිටි නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. ඒත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරගයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සේපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවලු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරි වුණේය. ඒ අවස්ථාවේ කාටත් රහසින් සෙනෙහෙලතා මැණිකේ ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට නිවසක් මිලදී ගන්නට දුන්නාය. ඔහු නිවසක් මිලට ගත්තද එය අංජනාට සැඟවූයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට සේපාලිකාගේ බලාපොරොත්තුව විය. මේ අතර තේනුකගේ කේන්දරයේ සිකුරුගේ බලය වැඩිවූවා සේ ඔහු නොදැන මංගල යෝජනා දෙකක් පැමිණ තිබුණි. එකක් බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයාගේ සහෝදර ඇමතිවරයෙකුගේ දියණියකි. අනෙක තේනුකගේ මාමාගේ දියණිය චතුමිණිය. ඒ කිසිත් නොදැන තේනුක අංජනාව සමන් දේවාලය වන්දවන්නට කැඳවා ගියේය. විදේශයක සිට ලංකාවට පැමිණ සිටි චතුමිණි දෙමාපියන් සමඟ ඔහු බලන්නට ඒ අතරවාරයේ ඇමති නිල නිවසට පැමිණියාය.*

**අද එතැන් සිට**



# ඔයා ළඟ මගේ අන්තිම කාලෙ ගෙවන්න තියෙනවනම් මං ආසයි

ඉක්මනින් පොහොසත් වන්නට පුළුවන් කියන ක්‍රමය දැනගන්නට තේනුක පියාගේ කට දෙස බලාගෙන සිටියේය. ඇමතිවරයා ඒ ගැන කියන්නට පෙර හරි බරි ගැහී ඉඳ ගත්තේය. සිම්බා ඒ ඇසිල්ලේ එතැනින් පැන ගෙතුළට දිව්වේය. සමහර විට ඒ අම්මා සොයා වන්නට ඇතැයි තේනුකට සිතුණි.

**“පුතා දන්නවනෙ විසෙන්තිආරච්චි ඇමතිතුමාව. දේශපාලනේට එන්නත් කලින් ඉඳලා කෝටිපතියෙක්.”**

තේනුක හිස වැනුවේය.

**“මිනිහට ලංකාවෙ විතරක් නෙවේ, ඩුබායිවලත් බිස්නස් තියෙනවා...”**

**“අපරාදේ...”**

තේනුකට කියැවුණේ ඒ දේශපාලනඥයා ගැන අප්පච්චිගේ වර්ණනා කිරීම අසා සිටින්නට බැරුවය.

**“ඇයි අපරාදේ වෙන්නේ... මිනිහට ඒවයින් සල්ලි ගලනවා...”**

එහෙව් සල්ලි ඇත්නම් මේ දේශපාලන පොර පිටියට වැදී සිටින්නේ ඇයිදැයි කියා අසන්නට තේනුකගේ කට නලියැව්වේය. ඒත් ඔහු ඉවසුවේය. තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා කතා කරන්නට කට ඇරියා පමණි. ඔහුගේ දුරකතනය නාද වන්නට ගත්තේය. කතාව නවතා දුරකතනය ඇසට ළං කොට බැලූ ඔහු දුරකතනය කන තබාගෙනම කලබලයෙන් සේ නැගිට්ටේය.

**“ඔව් සර්...”**

**“පුළුවන් සර්...”**

**“හා සර්...”**

**“දැන් එනවා සර්...”**

තෙන්නකෝන් බණ්ඩාරගේ කටින් කියවුණේ ඒ වාක්‍ය හතර විතරක් වුණාත් ඇමතුම එන්නට ඇත්තේ කාගෙන්දැයි තේනුක තේරුම් ගත්තේය.

ඔහු සර් කියන්නේ නායකතුමාටය.

**“අපි පස්සෙ කතා කරමු පුතා. පොඩි හදිස්සියකට මට යන්න වෙනවා...”**

තෙන්නකෝන් බණ්ඩාර තේනුකගේ උරහිසට තට්ටුවක් දමා කීවේය. සෙනෙහෙලතා මැණිකේ විසිත්ත කාමරයට ආවේ ද ඒ මොහොතේය.

**“කෑම ලෑස්තියි...”**

හදිසියේ ඇතිවූ තත්ත්වය නොදැන ඇය කීවාය.

**“කකා ඉන්න බෑ මැණිකේ. නායකතුමා කතා කළා. මං යන්න ඕන. රෑට කමු...”**

අම්මාගේ මුහුණේ එක්වරම ඇතිරුණ අඳුර ඔහු හොඳින්ම දුටුවේය. ඒ නිසා ඔහු කෑම කා යන්නට තීරණය කළේය. අම්මා අප්පච්චි හා පසු ගමන් ගියද තේනුක එසේම සිටියේය. ඔහු හිතුවේ අප්පච්චි කියන්නට ගිය කතාව මොකද්ද කියාය.

සමහරවිට විසෙන්තිආරච්චි ඇමතිවරයා හා එක්ව ව්‍යාපාර කටයුතු කරන්නට යෝජනාවක් ගෙනෙන්නට ඔහු සිතන්නට ඇත. තේනුක ඒ කතාව එතෙකින් අමතක කළේ එවන් යෝජනාවක් අප්පච්චි ගෙන ආවත් කවදාවත් එය සිදු නොවන බව ඔහුගේ හිත දැන සිටි නිසාය. ඒ ඔහු සාර්ථක ව්‍යාපාරිකයෙක් වුවත් දේශපාලනඥයෙක් වන බැවිනි.

**“ඕවා ඔහොමයි. මට පුරුදු දේවල්. සමහරදාට බත් එක කකා ඉඳලා දාලා දුවනවා. මොන ජීවිතයක්ද මේ කියලා මට හිතුණාට ඔය ගොහොරුවට වැටිච්ච මිනිස්සුන්ට තේරෙන්නෙ නෑ. අර ළමයි දෙන්නටත් කන්න බැරිවුණා. වෙලාවට කෑම පෙට්ටි දෙකකට කෑම ටික දාලා දුන්නා...”**

මොහොතකින් පැමිණි සෙනෙහෙලතා මැණිකේ කීවේ පශ්චාත්තාපයෙනි.

**“අම්මා කෑම කාලද?”**

තේනුක මෘදුව ඇසුවේ ඇගේ සිත රිදී ඇති බැව් දැනුණ නිසාය.

**“මං ඉතින් කන්නෙ කොහොමත් ගෙදර අය කෑවමනෙ දරුවො.”**

තේනුක ඉඳ සිටි තැනින් නැගිට්ටේය. ඔහු සෙනෙහෙලතා මැණිකේ ළඟට ගොස් ඇගේ උරහිසට උඩින් අතක් දැම්මේය. මොකක්දෝ හේතුවකට ඔහුගේ හිත ඈ ගැන සංවේදී වී තිබිණි.

**“යමු... අපි දෙන්නා කමු. මාත් කාලා ඉක්මනට යන්න ඕන අම්මා. කඩේ අර දෙන්නා විතරයි...”**

තේනුක හා කෑම කාමරය දෙසට යන අතරේ සෙනෙහෙලතා මැණිකේගේ දෙනෙත් පෙඟුණේය. පොඩි පුතු ඉන්නේ දුරින් වුවත් ඔහු ළඟ ඇත්තේ සැබෑ සෙනෙහෙවන්තකමයි. මේ ආදරය මේනක ළඟ නැත. මේනක වැඩිමල් පුත්‍රයා වුවද ඔහු ළඟ ඇති කපටි, අවස්ථාවාදී ආදරය සෙනෙහෙලතා මැණිකේ හඳුනාගෙන තිබුණාය.

**“අලුත් ගෙදර කොහොමද පුතා...? මටත් ඒ වගේ තැනක ඉන්න තියෙනවනම් හොඳයි කියලා නිතරම හිතෙනවා...”**

**“මං ආසයි ඔයා ළඟ මගෙ අන්තිම කාලේ ගෙවන්න තියෙනවනම්... ඒ ගෙදර හරි නිදහස්. ඒත් මට තව කාලෙකට මේ ජීවිතෙන් ඈත් වෙන්න අමාරුයි...”**

සෙනෙහෙලතා මැණිකේගේ හඬේ වූ සෝබර බව තේනුක ඇඳින්නේය.

**“ඉතින් අම්මා එන්න... ඕන වෙලාවක එන්න. මාත් ආසයි අම්මා මං එක්ක ඉන්නවනම්...”**

තේනුක කීවේ ඇත්තටමය. අම්මෙක් ළඟ ඉන්නට ඇත්නම් එය වාසනාවකි. දෙදෙනා කෑම මේසයට වාඩිවී කෑම ගනිද්දී සෙනෙහෙලතා මැණිකේගේ දුරකතනය නාද වුණේය. ඈ මේසයේ පසෙක තිබූ දුරකතනය අතට ගෙන එහි තිරය බලා තේනුක දෙස බැලුවාය.

**“ඇයි අම්මා...?”**

ඇගේ බැල්ම තේරුම් ගත නොහැකිවූ නිසා ඔහු ඇසීය.

**“කමල්ගෙන් කෝල් එක...”**

**“ගන්න...”**

අම්මාට ඇමතුම ගන්නැයි කීවද කමල් අම්මාට කතා කරන්නේ ඇයි කියා එක්වරටම ඔහු සිතේ ප්‍රශ්නයක් විය. ඔහු බත් ඇට එහා මෙහා කරමින් අම්මා ඇමතුමට කතා කරනු අසා සිටියේය.

**“මෙහෙ ආවා. ඇයි ටෙලිෆෝන් එක වැඩ නැද්ද?**

**ආ... එහෙමද... මං දන්නෙ නෑ. බැට්‍රි බැහැලා වෙන්න ඇති. ඉන්නකො මං දෙන්න...”**

සෙනෙහෙලතා මැණිකේ දුරකතනය තේනුක වෙතට දිගු කරද්දී කමල්ගේ ඇමතුමට හේතුවද ඔහුට වැටහී අවසන්ය. චතුමිණීගේ දුරකතන ඇමතුම නිසා ටෙලිෆෝනය නිවා දැමුවත් එය ක්‍රියාත්මක කරගන්නට මතක් වූයේ නැත.

**“කමල්... හදිස්සියක්ද?”**

තේනුක ඇසුවේ නොඑසේ නම් ඔහු කතා නොකරන බව දන්නා නිසාය.

දෙදෙනාගේම කෑම නැවතී ඇත. සෙනෙහෙලතා මැණිකේ බලා සිටියේ තේනුකගේ මුහුණ දෙසයි.

**“මහත්තයාගේ මාතලේ යාළුවා කතා කළා. දවලුත් හම්බවුණාලු. පණිවිඩයක් කියනවා කිව්වලු. ෆෝන් එක වැඩ නෑ කිව්වා.”**

කමල් කීවේ, සෙනෙහෙලතා මැණිකේට නොතේරෙන්නට අංජනාගේ පණිවිඩයකි. ඒත් මේ මොහොතේ ඇයට කතා කරන්නට බැරිය. අම්මා ළඟින් මෑත්වූ විගස ඇයට ඇමතුමක් දෙන්නට ඔහු සිතා ගත්තේය

**“මං යාළුවෙක් හම්බවෙන්න ඇවිත් ඉන්නෙ කියන්න. මං කෝල් එකක් දෙන්නම් කියන්න...”**

මං යාළුවෙක් හම්බවෙන්න ඇවිත් ඉන්නෙ කියන්න. මං කෝල් එකක් දෙන්නම් කියන්න

දුරකතනය පසෙක තබා දෙදෙනාම උදෑසන ආහාරය ගෙන නිම කළහ.

**“මං ආයෙත් එන්නම්.”**

තේනුක කෑම මේසයෙන් නැගිට්ට ගමන් අම්මට කීව්වේ දුරකතනය ක්‍රියා කරවමිනි.

**“චතුමිණී එක්ක ප්‍රශ්න ඇතිකරගන්න එපා. එහෙම වුණොත් මාමලත් අමනාප වෙයි...”**

ඔහු පසුපසින් යමින් සෙනෙහෙලතා මැණිකේ කීවාය.

**“ඉතින් ඒ නෑකම් තියාගන්න අම්මට තමයි පුළුවන්.”**

**“කොහොමද?”**

**“අම්මා කියන්න, මං ගෑනු ළමයෙක් එක්ක යාළුවෙලා ඉන්නෙ කියලා...”**

විහිළුවෙන්ම වාගේ කියන්නට ඕනෑ දෙය තේනුක කීවේය.

ලබන සතියට...

**එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධව සිට පුනරුත්ථාපනය වූ කතුන්ගේ සුඛිත මුදිත ජීවිත කතා පෙළ - 06 වැනි කොටස**

# කොටි අලිමංකඩ අල්ලපු දවසේ LTTE ලොක්කියෙකුට හාල්ෆ් ෂීට් වලට ආස හිතිලා

යුද්ධය අවසාන වන විට අත්අඩංගුවට පත් වූ හා යටත් වූ අඩු වයස් එල්ටීටීඊ සාමාජික සාමාජිකාවන් රඳවා සිටිනු ලැබුවේ වව්නියාව පූන්තෝට්ටම් පුනරුත්ථාපන මධ්‍යස්ථානය තුළයි. ඒ වන විට මධ්‍යස්ථාන කිහිපයක 12,000 ක් පමණ වූ එල්ටීටීඊ සාමාජිකයන් පුනරුත්ථාපනය වෙමින් සිටිය අතර එම සියළු කඳවුරු සම්බන්ධීකරණ කාර්යාලය වව්නියාව පූන්තෝට්ටම් මධ්‍යස්ථානයේ පිහිටුවා තිබුණි. එමෙන්ම 12,000 ට වැඩි හිටපු එල්ටීටීඊ සාමාජිකයන් පුනරුත්ථාපනය කිරීම පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කරන ලද්දේ බ්‍රිගේඩියර් (එවකට ලුතිනන් කර්නල්) මංජුල ගුණසිංහ විසිනි.

මගේ මතකයේ හැටියට 2009 ඔක්තෝබර් 23 පස්වරුවේදී ගුණසිංහ මහතාගෙන් මට දුරකථන ඇමතුමක් ලැබිණ.

**“සනත් හෙට අපේ මධ්‍යස්ථානයේ හොඳ වැඩසටහනක් කෙරෙනවා. ඇවිත් මාධ්‍ය ආවරණයක් කරන්න පුළුවන්ද?”**

**“මොකක්ද සර් වැඩසටහන.”**

**“මෙතන ඉන්න වැඩි පිරිසක් එල්ටීටීඊ සංවිධානයට බලෙන් බඳවා ගත්ත බාල වයස්කාර ළමයි. බලෙන් බඳවා ගත්ත නිසා අධ්‍යාපනය බිඳවැටිලා. දැන් රජය මැදිහත් වෙලා මේ ළමයින්ව පාසල් යවන්න කටයුතු යොදලා තියෙනවා. රත්මලාන හින්දු විදුහලට අධ්‍යාපනය සඳහා ඇතුළත් කරන්න හෙට උදේ 8.30 ට ගමන පිටත් වෙනවා.”**

ගුණසිංහ මහතා මගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේය.

**“හරි සර් මම උදේට එන්නම්.”**

පසුදින එනම් 2009.10.24 දින මා පූන්තෝට්ටම් මධ්‍යස්ථානය වෙත ගියෙමි. ඒ වන විටත් ලංගම බස් රථ කිහිපයක් එක පෝළිමට නවතා තිබුණි. තවත් ස්ථානයක පොත් බෑග්, ඇඳුම් බෑග් අතින් කරින් එල්ලාගත් ගැහැනු පිරිමි ළමයින්ද පෝලිම් ගැසී සිටියහ. තවත් ස්වල්ප මොහොතකින් නම් කතා කර ළමුන් බස් රථ වෙත නංවමින් ගමනේ කටයුතු සංවිධානය කෙරෙමින් තිබිණ. ඒ අතර පුනරුත්ථාපන සම්බන්ධීකරණ නිලධාරී මංජුල ගුණසිංහ මහතාව හමු වී කතා කළෙමි. ඔහුද ළමුන්ගේ භාරකරු ලෙස රත්මලාන බලා යෑමට සූදානම්ව සිටි බැවින් කාර්යබහුලව සිටියේය.

**“සර් මේ ළමයි අතරේ විශේෂ ළමයි ඉන්නවාද?”** මා ඇසීමි.

**“ඔව්. විශේෂිත ළමයි කිහිප දෙනෙක්ම ඉන්නවා. මගේ මතකයේ හැටියට වයස 13 ක වගේ ළමා සොල්දාදුවෙකුත් ඉන්නවා.”**

‘කාර්යබහුලතාව මැද්දේ වුවද ගුණසිංහ මහතා පිළිතුරු දුන්නේය. එම කතාබහ එතෙකින් අවසන් විය. පසුව මෙම ලිපි මාලාව ලියන විට බාල වයස්කාර ළමා සොල්දාදුවා පිළිබඳ කපිතාන් ජයනි මහත්මියගෙන් විමසීමි.

**“ඔව්. පුනරුත්ථාපන මධයස්ථානයේදී මට වයස 13 ක ගැහැනු ළමයෙක් වගේම එල්ටීටීඊයේ වයස්ගත සාමාජිකාව වූ අවුරුදු 68 ක කෙනෙකුත් හමු වුණා. මේ දෙන්නා එක්කම මම කතාබහ කරලා තියෙනවා. ඉස්සරවෙලාම මම බාල වයස්කාර ගෑනු ළමයාගේ විස්තර කියන්නම්කෝ”** කියමින් කපිතාන් ජයනි සිය කතාව ආරම්භ කළාය.

**“එතන හිටපු බාලම ළමයා සිවලිංගම් රාධිකා. ළමයව දකිද්දිම මට හිතුණේ මේ ළමයා සෑහෙන දුක් විඳපු ළමයෙක් කියලා. මොකද ළමයා කළුවෙලා. කෙට්ටුවෙලා හිටියේ. ශරීරයේ කිසිම පෘෂ්ටිමත් බවක් දකින්න ලැබුණේ නැහැ. මම ළමයා එක්ක විස්තර කතා කළා. ඒ ළමයා දුප්පත් පවුලක ළමයෙක්. කොටි සංවිධානයේ අනිවාර්යය යුද සේවා නීතිය නිසා තමයි සංවිධානයට බැඳිලා තියෙන්නේ. මේ ළමයට සහෝදර සහෝදරියෝ හිටියත් රාධිකා ඉදිරිපත් වෙලා තියෙන්නේ පොඩි නිසා යුධ පුහුණුව දෙන එකක් නැහැ, යුද්ධයට යවන එකකුත් නැහැ කියලා හිතලා”**

වසර 2008-2009 එළඹෙන විට එල්ටීටීඊ සංවිධානය උග්‍ර පිරිස් අර්බුදයකට මුහුණ දී සිටියේය. එලෙස වූයේ යුද හමුදා ප්‍රහාර හමුවේ විශාල වශයෙන් සාමාජිකයන් මියයෑම හා තුවාල ලැබීමයි. මියයෑම් හා තුවාල වූවන්ගේ ඉවත්වීම් නිසා ඇතිවන හිඩැස පිරවීම සඳහා සාමාජිකයන් යෙදවීම ප්‍රශ්නයක් වී තිබිණ. එම නිසා සාමාජිකයකු වීම සඳහා සුදුසුකම පණ ඇති පුද්ගලයකු වීම පමණක් ප්‍රමාණවත් වී තිබිණ.




පුනරුත්ථාපනය කිරීම පිළිබඳ සම්බන්ධීකරණය නිලධාරියා ලෙස කටයුතු කළ බ්‍රිගේඩියර් මංජුල ගුණසිංහ



සංගීත ගුරුවරියක් මෙන්ම ක්‍රීඩිකාවක ලෙසද දස්කම් දක්වා ඇති කපිතාන් ජයනි හේරත් කලක් අධ්‍යාපන අමාත්‍යංශයේ ක්‍රීඩා සංවිතයේත් රාජකාරි කර ඇත. 1996දී දෙවන ලුතිනන්වරියක ලෙස ජාතික ශිෂ්‍ය භට බළකායට එක්වූ ඇය 2006 වසරේදී සක්‍රිය හමුදා සේවයට එක්වී ඇත. පසුව ඇය යුද සමයේ අවසාන කාලයේදී හමුදා භාරයට පත්වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකාවන්ගේ පුනරුත්ථාපන රාජකාරියටද එක්වූ අතර එලෙස පුනරුත්ථාපනය වූ කොටි සාමාජිකාවන් ගැන කපිතාන් ජයනි හේරත් කියන කතා පෙළයි මේ.



එල්ටීටීඊ සංවිධානයේ ළමා සොල්දාදුවන්



එල්ටීටීඊ සංවිධානයේ වයස්ගතම කාන්තා සාමාජිකාව තමිල්කවි

**“රාධිකාව එක්කරගෙන ගිහින් මූලික යුද පුහුණුව දීලා තියෙනවා. මූලික පුහුණුව කියන්නේ ටී 56යේ ඒ.කේ. 47 ස්වයංක්‍රීය රයිෆලයක්, වෙඩි තැබීමේ පුහුණුව තමයි දීලා තියෙන්නේ. රාධිකා නම් කීවේ පුහුණුව දුන්නා. නමුත් සටනට යවන්න උනේ නැහැ කියලා. එහෙම කීවේ ඇත්තටද බොරුවටද කියලා දන්නේ නැහැ. මොකද සමහර එල්ටීටීඊ සාමාජිකාවෝ හමුදාවට විරුද්ධව සටන් කළා. ප්‍රහාර එල්ල කළා. ඒ ප්‍රහාරවලින් හමුදාවේ අය මැරුණා වගේ දේවල් කියන්න අකැමැතියි. අපි ඒවට පළිගනියි කියලා. නමුත් අපි නම් කවදාවත් එවැන්නක් කළේ නැහැ.**

**කොටි ගුවන්විදුලිය හා කොටින්ගේ රූපවාහිනියේ වැඩසටහන් නිෂ්පාදකවරියක් විදිහටත් ඇය වැඩ කරලා තියෙනවා. කොටින්ගේ වේදිකාවේ කොච්චර ජනප්‍රිය චරිතයක් වුණත් සමහර කොටි සාමාජිකාවන් නිසා සිත් රිදවීම් ඇති වුණා කියලත් ඇය කීවා**

**අධ්‍යාපනය ගැන අහද්දී 6 ශ්‍රේණියට තමයි ඉගෙන ගත්තේ කීවා. පස්සේ කොටි සංවිධානයට එක්වීම නිසා පාසල් ගමන නැවතුණා කියලා කීවා. හිටපු ළමයි ගොඩක් දෙනෙක්ගේ වගේ රාධිකාටත් අධ්‍යාපන සහතික නැහැ. ඒ නිසා රත්මලාන හින්දු විදුහලේ 6 පංතියට රාධිකාව ඇතුළත් කළා. ඒ වගේම යුනිසෙෆ් හා රතුකුරුස සංවිධාන සහයෝගය අරගෙන එයාගේ අම්මවයි, තාත්තවයි හොයලා දුන්නා. ඒ අය පස්සේ තමන්ගේ දුව බලන්න ආවා. අවුරුද්දක වගේ කාලයක් ඇතුළත රාධිකාව නිදහස් කරලා දෙමවුපියන්ට භාර දුන්නා. ඊට පස්සෙ නම් එයා ගැන තොරතුරක් හොයලා බලන්න බැරි වුණා”** යැයි කපිතාන් ජයනි පැවසුවාය.

**“එතකොට කොටි සංවිධානයේ වයස්ගතම සාමාජිකාවගේ තොරතුරු මොනවද?”**

**“මම දන්න විදිහට අවුරුදු 72 ක පිරිමි එල්ටීටීඊ සාමාජිකයෙක් පුනරුත්ථාපනය වුණා. ඒ වගේම වයස්ගතම කාන්තාව විදිහට හිටියේ තමල්කවි කියලා කාන්තාවක්. අපිට හමුවෙද්දී එයාගේ වයස අවුරුදු 65-68 ක් වගේ. එයා කොටි සංවිධානයට බැඳල තියෙන්නේ වයස අවුරුදු 45-50 දි විතර. එයා කියපු විදියට කොටි නායක ප්‍රභාකරන් එක දවසක කාන්තා කොටි කඳවුරක් නිරීක්ෂණය කරන්න ගිහිල්ලා තියෙනවා. එතැනදී ප්‍රභාකරන් දැක්කලු කොටි සාමාජිකාවන් ලියපු නිසදැස්, කවි, චිත්‍ර එහෙම. ඒ ගැන අහද්දී කාන්තා නායිකාවක් කියලා තියෙනවා කලා හැකියාවන් තියෙන අය ඉන්නවා, එයාලගේ නිර්මාණ කියලා. ප්‍රභාකරන් එවලේම නියෝග කරලා තියෙනවා එල්ටීටීඊ කාන්තා බලකාය වෙනුවෙන් සංස්කෘතික අංශයක් නිර්මාණය කරන්න කියලා. ඒ වෙද්දී ‘තමිල්කවි’ කියන කෙනා උතුරේ ගුවන්විදුලි වගේම පුවත්පත්වල කිවිඳියක් විදිහට ජනප්‍රිය කෙනෙක්. ඊට පස්සේ තමයි තමිල්කවිට කොටි සංවිධානයට බැඳෙන්න කියලා ආරාධනා ඇවිත් තියෙන්නේ. එල්ටීටීඊ කාන්තා සංස්කෘතික අංශයේ ප්‍රධානියා විදිහට ආපු තමිල්කවි මුලින්ම කරලා තියෙන්නේ සුදන්දිර පරවෙයි (නිදහස් කිරිල්ලියෝ) කියලා කලා පුවත්පතක් මුද්‍රණය කරපු එක. එල්ටීටීඊ සංවිධානයේ වගේම පිටස්තර කාන්තාවන්ගේ නිර්මාණ එකතු කරලා මේ පුවත්පත මුද්‍රණය කරලා තියෙනවා. ඒ වගේම ඒ කාලේ උතුරේ ජනප්‍රිය වෙලත් තියෙනවා. ඒකේ ප්‍රධාන කර්තෘ විදියට වැඩ කරලා තියෙන්නේ තමිල්කවි. ඊට අමතරව කොටි ගුවන්විදුලිය හා කොටින්ගේ රූපවාහිනියේ වැඩසටහන් නිෂ්පාදකවරියක් විදිහට වැඩ කරලා තියෙනවා. කොටින්ගේ වේදිකාවේ කොච්චර ජනප්‍රිය චරිතයක් වුණත් සමහර කොටි සාමාජිකාවන් නිසා සිත් රිදවීම් ඇති වුණා කියලත් ඇය කීවා.**

**එහෙම කියපු එක සිදුවීමක් මගේ මතකයේ විදිහට කියන්නම්.**

**අලිමංකඩ කඳවුර කියන්නේ හමුදාවේ 10,000 ක විතර හමුදා සංකීර්ණයක්. මේ කඳවුර 1999-2000 දී වගේ එල්ටීටීඊ ප්‍රහාරය නිසා අතහැරලා හමුදාව පසුබසිනවා. ජීවිත හානිත් සිදු වෙනවා. කොටි සංවිධානය යුද ජයග්‍රහණයක් ලැබුවම උතුරේ ඊළඟට සිදුවන දේ තමයි යුද්ධයට සෘජුවම සහභාගි නොවන සාමාජිකයන් වගේම එහේ සාමාන්‍ය වැසියන් මේ ජයග්‍රහණය බලන්න යන එක. තමිල්කවිත් එයාට සංවිධානයෙන් ලැබිලා තිබුණ Super cub වර්ගයේ කුඩා යතුරුපැදියෙන් කොටි අත්පත් කරගත්ත අලිමංකඩ කඳවුර බලන් ගිහින් එතැනදී දැකලා තියෙනවා හමුදාව අත්හැරපු කාර්යාලයක තිබුණ “හාෆ්ෂීට්” කියලා හඳුන්වන සුදුකොළ සැලකිය යුතු ප්‍රමාණයක් තියෙනවා.**

**“කොටි පාලන ප්‍රදේශයේ ඒ කාලේ ලිපිද්‍රව්‍ය හිඟ නිසා එතැනින් හාෆ්ෂීට් බණ්ඩල කිහිපයක් අරගෙන තියෙනවා. එහෙම අරගෙන තියනනේ මෙයාගේ නිර්මාණ වැඩවලට ගන්න. ඒක දැකපු සන්නද්ධ සාමාජිකාවක් මෙයාට බැනලා. කේන්ති ගිය තමිල්කවි හාෆ්ෂීට් බණ්ඩලේම පොළොවෙ ගහලා ඇවිත්. තමිල්කවි කීවේ කොටි සංවිධානය තුළ උගත්කමට වඩා වැඩි සැලකිල්ල තිබුණේ ආයුද බලයට කියලා. ඒ නිසා සාමාන්‍ය රාජකාරි නිල ඇඳුමට වඩා කැලෑ ඇඳුමට (Combat) වැඩි සැලකිල්ලක් ලැබුණා කියලා.”**

“දැන් තමිල්කවි කොහේද?”

**“සම්බන්ධයක් නැහැ. මුද්‍රණය කළ එයාගේ කෘති කිහිපයක් උත්සව තියලා එළිදැක්වූවා කියලා ආරංචියි.”** කපිතාන් ජයනි කීවාය.

**සනත් ප්‍රියන්ත**

# නැතුවට දිගම දිග බූල් එයා හරිම කූල්

ඒ ගිය අවුරුද්දේ පෙබරවාරියේ දවසකි. ඉන්දු රණවීර පස්යාල බලා පිටත් වුණේ ඇය සේවය කරන බැංකුවේ රාජකාරී කටයුත්තක් සඳහාය. හැමදාමත් එළියට බසිද්දී පාරේ දුක් විඳින සතුන් ඇස නොගැසේවායි ප්‍රාර්ථනා කළත් එදාද ඉන්දුගේ දෑස් අවාසනාවන්ත වී තිබුණේය. එල්ලක්කල පෙදෙසේදී ඇගේ ඇස ගැසුණේ අතේ කෑල්ලක් එල්ලා වැටෙමින් තිබියදී යන එන මිනිසුන් දෙස බයෙන් බයෙන් ඇස් කරකවමින් බලන මාස දෙක තුනක පුංචි බලු පැටියෙකි. දුඹුරු පැහැති ඒ බලු පැටියා දෑසට හසුවූ එක බැල්මකින්ම සතා විඳින පීඩාව, වේදනාව, බඩගින්න සහ අසරණකම කොතෙක්දැයි ඉන්දුට දැනුණි. ඒත් වෙනදා සේ යන වාහනයෙන් බැස අසරණයාට පිහිටවන්නට ඇයට එය අවස්ථාවක් නොවුණේය. ඒ නිසා ඇය මොහොතක් පමා වී අසරණයාගේ ඡායාරූපයක් දුරකතනයට හසු කරගත්තාය. ඒ ඡායාරූපය සමඟ සටහනක් තබා ඇය එය මුහුණුපොතට එක් කළේ කවුරුන් හෝ ඒ පැටවාට පිහිට වෙනු ඇතැයි කියා සිතමිනි. ආපසු එන ගමනේදී බලු පැටවා සිටි දිහාවට ඇස් යොමු කළද ඌ පෙනෙන්නට සිටියේ නැත. තමා දැමූ පෝස්ට්ටුවට ප්‍රතිචාර ලැබී ඇත්දැයි බැලූ කල ඇයට මහා දුකක් දැනුණි. සතාට පිහිට වීමට කිසිවෙකු ඉදිරිපත් වී තිබුණේ නැත. ඒ නිසා ඉන්දු රාජකාරී නිමවා ගෙදර නොගොස් යන්නේ බලු පැටවා දුටු පස්යාලේ එල්ලක්කලටයි.

**"එයා හිටපු තැන හිටියේ නෑ. මට ඇඬුණා. මොකද එයා හරිම අසරණ වෙලා හිටියෙ. මං අඬ අඬාම ගොඩක් වෙලාවක් හෙව්වත් හොයාගන්න බැරි වුණා. පහුවදා උදේ වැඩට ගිහින් හවස එයාව හොයන්න ගියා. ගමේ අයත් උදව් කළා. ඒත් හොයාගන්න බැරි වුණා. තුන්වැනි දවසේ ගියාම ඒ වෙලාවෙ**



කූල් ඉතා අසරණව පාරේ වැටී සිටි අවස්ථාව

**ළමයි ටිකක් හම්බ වුණා. ඒගොල්ලන්ට මම කිව්වා බලු පැටියා හොයලා දෙනවා නම් සල්ලි දෙන්නම්, ඔයාලා මට පණිවිඩයක් දෙන්න කියලා. ඊට පහුවදා යන්න බැරි වුණා. ඊටත් පහුවදා ඒ කියන්නෙ පෙබරවාරි පස්වෙනිදා මට කෝල් එකක් ආවා අර ළමයින්ගෙන්. අපි බලු පැටියා වටකරගෙන ඉන්නේ, අල්ලන්න බෑ, ඉක්මනට එන්න කියලා. ඒ වුණාට මං එදා උදේ වැඩට ඉන්නම ඕන. මට යා ගන්න විදිහක් නෑ. මං වත්තල කසුන් මල්ලිට කතා කරල විස්තරේ කිව්වා. කසුන් කියන්නෙ ඕන කෙනෙක්ට විශ්වාසයෙන් සතෙක් බාර දෙන්න පුළුවන් කෙනෙක්. එයා ගිහිල්ලා බලු පැටියාව අල්ලගෙන නිට්ටඹුවෙ ඩොක්ටර් ගාවට අරන් ගියාම නවත්තගෙන බෙහෙත් කරන්න කැමතිවෙලා තිබ්බෙ නෑ. සතා හොඳටම දුර්වලයි කියලා තිබ්බා. ඊට පස්සේ කඩවත ඩොක්ටර් පෙට් එකට යැව්වා. එහෙන් කිව්වා සතාට බඩඑළිය යනවා, අතේ කැඩුණ කෑල්ලෙන් ඇතුළටත් පණුවෝ කාගෙන යමින් ඉන්නේ. ප්‍රතිකාර කරමු කියලා. ඒත් එයාට පාවෝ වගේ නිසා, රෝහලේ නවත්තගෙන ප්‍රතිකාර කරන්න බෑ කිව්වා. නවත්තලා ඉන්න අනිත් අයටත් බෝවෙන්න ඉඩ තියෙනවා කියලා. ඉතින් හවස වැඩ ඇරිලා එන ගමන් කඩවතට ඇවිත් පැටියාව අරගෙන ගෙදර ගියා. හොස්පිටල් එකෙන් දුන්න බෙහෙත් දිදී එයාව දවස් දෙකක් ගෙදර තියාගෙන හිටියා. ඒත් සතා එන්න එන්නම දුර්වල වෙනවා කියලා මට දැනුණා."**

ඉන්දු රණවීර ඒ නිසා ඊට පසු ඉරිදා බලු පැටවාව පේරාදෙණිය පශුවෛද්‍ය රෝහලට රැගෙන ගියාය. ඒ වනවිට පැටවාගේ



ඉන්දුගේ අනෙක් බලු සුරතලුන්

> **ඉස්සර මං පොඩි කාලේ සෙල්ලම් බඩුවලට අම්මා මට ගෙනත් දුන්නෙත් ඇත්තම බලු පැටව් පූස් පැටව්**

අත ඉවත් කර ප්‍රතිකාර ලබාදී තිබුණත් ඉන්දුට ඕනෑවූයේ සතා පේරාදෙණියේ නවතා ප්‍රතිකාර ලැබ දෙන්නටයි. ඒත් එතැනද සතා නැවතීමට බැරි වුණේය.

**"එදා බෙහෙත්වලට වියදම් වුණේ රුපියල් හයසීයයි. ඒත් පේරාදෙණියේ එක්ක ගිහින් එක්ක එන්න රුපියල් හත් දහස් ගණනක ත්‍රීවිල් බිලක් ගියා. ඔය අතරෙ මට ඩොක්ටර් පෙට් එකෙන් කතා කරලා ආයෙ එයාව ගේන්න කියලා කිව්වා. එතකොට නම් බඩේ අමාරුව තරමක් සුව අතට හැරිලා තිබුණේ. මම පැටියාව එහෙ අරන් ගියා. ඒ වෙලේත් කිව්වෙ උදේ හවස එක දිගට බෙහෙත් කරන්න ගේන්න කියලා. මං වැඩට යන සිද්ධියයි, ඉන්නේ දුරයි නිසා මං මුහුණුපොතෙන් උදව් ඉල්ලුවාම ඉසුරින්දි රාමසිංහ සතාව නවත්තගෙන ප්‍රතිකාර කරලා දෙන්න කැමති වුණා. එයින් දවස් තුනකට පස්සෙ එයාව ඩොක්ටර් පෙට් එකේ නවත්තගත්තා. මං ඊටපස්සේ පෝස්ට් එකක් දැම්මා එයා හොඳ වුණාම කාට හරි දෙනවා කියලා. ඒ වෙලාවේ නුවර ගෑනු ළමයෙක් බලු පැටියාව ගන්න පොරොන්දු වුණා. එදා මං සතුටු වුණා. මං කිව්වා තුවාලෙත් හොඳටම සනීප කරලා දෙන්නම් කියලා."**

අත සුව කරන්නටත් හොඳ සෞඛ්‍ය තත්ත්වයක් දෙන්නටත් ඉන්දු බලු පැටවාව මාසයක් ගෙදර තබාගෙන බේත් කළාය. ඒ කාලය තුළ ඇය පුදුමාකාර ලෙසින් පැටවාට බැඳුනාය. පාරෙන් ගෙනෙනාවිට අන්තිම දුර්වල තත්ත්වයේ සිටි පැටවා මාසයක් හොඳ සත්කාර මැද වැඩෙද්දී ලස්සන වුණේය. සතා ගෙන යන්නට එනවා කී දිනයද දවසින් දවස ළං විය. ඒ ගැන හිතද්දී ඉන්දුට දැනුණේ පපුව කඩාගෙන යන දුකකි. ගන්නට පොරොන්දු වූ කෙනාද විටින් විට සතාගේ විස්තර ඇසුවාය. ඒත් බලු පැටවා දෙන්නට බැරි ලෝබ සිතුවිල්ලකින් ඇගේ හිත පිරී තිබිණි. තම දෑතින් කරනා සාත්තුව හොඳම සාත්තුව ලෙසත් තම හිතේ ඇති ආදරය හොඳම ආදරය බවත් ඇයට විටින් විට සිතුණේ දෑසට කඳුළු පුරවමිණි.

**"එයාව ගෙනියන්න එන්නෙ හෙට කියන දවසත් ආවා. එදා නම් මට හොඳටම ඇඬුණා. මගේ මහත්තයා ඇහුවා ඔය බලු පැටියා දෙන්නම ඕනද කියලා. පොරොන්දු වුණ හින්දා දෙන්න වෙනවා කියලා මං කිව්වා. එයා කිව්වා, ඒ ගොල්ලන්ට මොනවා හරි කියන්න, ඔයා බලුපැටියා තියාගන්න කියලා. අම්මෝ.. මට දැනුණ සතුටක්. එයා එහෙම කිව්වම මට ඒක ලොකු හයියක් වුණා, ඉතින් මං ඒ ගොල්ලන්ට එහෙම කියලා මෙයාව තියාගත්තා. එයා තමයි මගෙ කූල්."**

ඉන්දු මේ තරමට කූල් දෙන්නට ලෝබකම් කරමින් කඳුළු සැලුවේ නිවසේ තවත් බල්ලන් තුන් දෙනෙක් සිටියදීය. ඉන් එක් අයෙක් පැංචිය. කූල් වැනිම පාරෙන් ගත් සතෙකි. අනෙක් දෙන්නා ග්‍රේඩ්ඩේන් වර්ගයේ බල්ලන් දෙන්නෙකි. ඒ ටීනු සහ රෑනිය.

**"පොඩි කාලේ ඉඳලා දිගටම අපි බලූලයි පූසොයි හැදුවා. ඉස්සර මං පොඩි කාලේ සෙල්ලම් බඩුවලට අම්මා මට ගෙනත් දුන්නෙත් ඇත්තම බලු පැටව් පූස් පැටව්. ග්‍රේඩ්ඩේන් දෙන්නා හදන්න ගත්තෙ අපි දෙන්නා බැඳලා වෙනම ජීවත් වෙන්න පටන් ගත්තට පස්සෙ ආසාවට මිසක් පැටවු හදලා විකුණන්න එහෙම නෙවෙයි.**

**එහෙමයි කියලා අනිත් අය අමතක කළේ නෑ. ඒ දෙන්නා හදන්න ගත්තට පස්සෙ තමයි මං පැංචි හදන්න ගත්තෙත්. පැංචියි, බංචියි දෙන්නත් පාරෙන් ගත්තෙ. බංචි ලස්සන වුණ නිසා, පොඩි කාලෙම එයාව කෙනෙකුට දෙන්න පුළුවන් වුණා.**

**පැංචි මං ළඟ ඉතුරුවුණා. ඊටපස්සෙ තමයි කූල් ලැබුණේ. දැන් මේ හතරදෙනාම පුදුම විදිහට යාළුයි. ඒ දිහා බලලා අපි දෙන්නා සතුටු වෙනවා. සත්තුන්ගෙ බඩවල් පුරවලා එයාලා සතුටින් ඉන්නවා දකින තරම් තව වෙන සතුටක් කොහෙන්ද?"**

ඉන්දු රණවීරගේ හිතේ සතුන් කෙරේ බැඳි ආදරේ වැඩි වනවා මිස අඩු වීමක් නම් නොවන්නේය.

මිනිස්සු සත්තුන්ව වර්ග කර පෙන්නුවාට, ඇත්තටම සතුන්ට ආදරේ දක්වා ඉන්දු සහ මිලාන් ඒ කතා සියල්ල බොරු බව ක්‍රියාවෙන් පෙන්වා ඇත. පැංචිත්, කූල් සහ ටීනු සහ රෑනිත් එකට එක්ව සිටින්නේ ඒ නිසාය.



කූල් සහ ඉන්දු

බියංකා නානායක්කාර

## පාඩම් අංක 17


**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් අද කතා කරන්නේ සෝයා කිරි හදන හැටි.**


## ස්වයං රැකියා

**උණු පානයක් විදියට හරි ශීතකළ පානයක් විදියට හරි පිළිගන්වන්න පුළුවන්.**

**සෝයා කිරි කෝප්පයක් රුපියල් 80කට විතර අලෙවි කරන්න පුළුවන්.**

# ඒරොප්පෙ කට්ටියගෙ ගැලවුම්කාරයා අපෙත් ගැලවුම්කාරයා කරගමුද?




05

එදිනෙදා ජීවිතේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරා ගන්න ගොඩක් අය කිරි පානයට යොමු වෙලා. හැබැයි ඉතින් බොන්න තියා ඇහැට දකින්නවත් මේ දවස්වල රටේ කිරිපිටි නැහැනේ.

අනිත් එක අපි කොච්චර ආසාවෙන් බිව්වත් කිරිපිටි ශරීර සෞඛ්‍යයට අහිතකරයි කියලා තමයි වෛද්‍යවරුන් කියන්නේ.

මේ නොයෙකුත් ප්‍රශ්න නිසා පාරිභෝගිකයෝ දැන් කිරිපිටි වෙනුවට විකල්ප ක්‍රම භාවිතා කරන්න පටන් අරන්. ඒ නිසා මේ දවස්වල සෝයා කිරිවලටත් වෙළඳපොළේ හොඳ ඉල්ලුමක් තියෙනවා.

සෝයා කිරිවල ප්‍රෝටීන විතරක් නෙමෙයි විටමින්, යකඩ, මැග්නීසියම් වගේ පෝෂ්‍ය පදාර්ථත් බහුලයි.

හෘදරෝග, ඔස්ටියෝපොරෝසිස්, පිළිකා වගේ තත්ත්වයන් අවම කරන්නත් සෝයා කිරි හොඳයිලු. ඒ වගේම කාන්තා සිරුරේ ඊස්ට්‍රජන් නිපදවන්නත් සෝයාවලට පුළුවන්.

සෝයාවල තියෙන මේ විශේෂත්වය ගැන මුලින්ම හොයාගෙන තියෙන්නේ චීන ජාතිකයෝ ක්‍රිස්තු වර්ෂ 25 කාලෙදී. ඉතින් ඒ කාලෙ ඉඳලම ඔවුන් සෝයා කිරි පානය කළා කියලා චීන ගල්පුවරුවල ලියලා තියෙනවලු.

චීන්නු හොයාගත්තු සෝයා කිරි පස්සේ යුරෝපයෙත් ජනප්‍රිය පානයක් වෙලා. අපිට කිරිපිටි බොන්න පුරුදු කරපු එංගලන්ත මහත්තුරු අදටත් නිතරම සෝයා කිරි බොනවලුනේ.

පෝෂණ අවශ්‍යතා සපුරන ගමන් සත්ත්ව හිංසනයත් වළක්වන නිසා යුරෝපීය රටවල සත්වවේදීන් සෝයාවලට කියන්නේ 'ගැලවුම්කාරයා' කියලා. ඇත්තටම කිරි ප්‍රශ්නෙන් බැටකන අයට සෝයා කිරි මේ වෙලාවේ ගැලවුම්කාරයෙක්. ඒ නිසා ඉතින් සෝයා කිරි අලෙවි කරලත් තමන්ගේ ජීවිතේ ගැලවුම හොයාගන්න පුළුවන්.

අපි අද හදාගන්න මේ නිෂ්පාදනය ශීතකරණයේ දවස් තුනක කාලයක් තියාගන්න පුළුවන්. ඒ නිසා පළාතේ උදවියට මේවා බෝතල් කිරි විදියට අලෙවි කරන්න පුළුවන්. ප්‍රවාහනය කරන්න ක්‍රමවේදයක් තියෙනවා නම් දැන් අන්තර්ජාලය හරහාත් සෝයා කිරිවලට හොඳ ඉල්ලුමක් තියෙනවා. එතකොට වෙළඳ ව්‍යාපාරයක් කරන කෙනෙක්ට එවෙලේම බොන්න සෝයා කිරි අලෙවි කරන්නත් පුළුවන්නේ.

මේ වැඩේට අවශ්‍ය වෙන්නේ සෝයා ඇට විතරයි. අපි මුලින්ම සෝයා ඇට 250gකින් කිරි හදලා බලමු.


01


03


02


04

### පියවර 1

**සෝයා ඇට ටික පැය 12ක් විතර පොඟවගන්න.**

### පියවර 2

**දැන් වතුර ටික ඉවත් කරලා ඒකට අලුත් වතුර ටිකක් එකතු කරලා පිටපොතු ඉවත් වෙලා යන විදියට අතුල්ලන්න.**

### පියවර 3

**පස්සේ සෝයා ඇටවලට වතුර කෝප්ප බාගයක් වතුර එකතු කරලා හොඳට බ්ලෙන්ඩ් කරන්න.**

### පියවර 4

**ඊට පස්සේ ඔය මිශ්‍රණයෙන් කෝප්ප එකකට කෝප්ප තුනක් වෙන්න වතුර එකතු කරලා විනාඩි විස්සක් විතර මද ගින්නේ උණු කරගන්න.**

### පියවර 5

**පස්සේ මස්ලින් රෙද්දකින් පෙරලා සෝයා රොඩ්ඩ ඉවත් කරගන්න. ඔය රොඩ්ඩත් රෝල්ස්, පැටිස්, පිට්ටු, වඩේ වගේ කෑමවලට එකතු කරන්න පුළුවන්.**

### පියවර 6

**අර පෙරාගත්තු කිරි ටිකට ලුණු ටිකක් එකතු කරලා විනාඩි කිහිපයක් රත් කරගන්න.**

මේ කිරි එකට අවශ්‍ය නම් සීනි, වැනිලා, චොක්ලට් පවුඩර් වගේ දේවල් එකතු කරලා රස කරගන්න.

උණු පානයක් විදියට හරි ශීතකළ පානයක් විදියට හරි පිළිගන්වන්න පුළුවන්.

සෝයා කිරි කෝප්පයක් රුපියල් 80කට විතර අලෙවි කරන්න පුළුවන්.

මේ ගැන තවත් මොනවා හරි දැනගන්න අවශ්‍ය නම් 0714766819 අංකයට කතා කරන්න.



06




**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**


**සෙව්වන්දි හෙට්ටිආරච්චි**


# වෙල්බෝන් සහිත ප්‍රින්සස් ලයින් සාරි හැට්ටය (අත් සහිත)








ඉහත රූපසටහනේ පරිදි ඉදිරිපස පලුව ඇඳගෙන, සියලු darts නවා රේඛා නැවත කෙළින් කර ඇඳගත් පසු මැහුම් වාසිය තබා කපාගන්න. යටට මැහුම් වාසිය 1 1/2ක්ද, අංශයට 1ක්ද තබා කපාගන්න.



ප්‍රවීණ ඇඳුම් මෝස්තර නිර්මාණ පුහුණු දේශක
සහ බතික් කලාව පිළිබඳව පුහුණු දේශක
චමින්ද කුමාර
*You tube - Smart Fashion Lanka*

වාණිජ බැංකු ඇබෑර්තු
★ බැංකු ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් තනතුරු කිහිපයක අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ. ★ වැටුප් සමග පුහුණුව. ★ රැකියාව තම ප්‍රදේශයටම.
රු. 35,000/- 18/40 ගැ/පි (මැන් පවර් නොවේ)
0702 231 694 | 0702 725 731
0742 916 140 | 0774 024 155
0718 853 997 | 0712 564 715

උකසට තබා ඇති රන් භාණ්ඩ
ඔබ විසින් උකසට තබා ඇති රන් භාණ්ඩ සින්න වීමට නොදී පැමිණ බේරා දී වැඩිම මිලට ගනු ලැබේ.
ඔබගේ වටිනා රන් භාණ්ඩ සින්න වීමෙන් පසු ඔබගේ අතට මුදල් නොලැබේ.
මේ අනගි අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න
හිරුෂිනි
අමතන්න: 076 706 27 10 / 071 497 74 43

ආතරයිටීස් විශේෂ ප්‍රතිකාර
දණහිස් ඉදිමුම වේදනා සියලු සන්ධි රෝග, වාත රෝග, හිරිය, කශේරුකා ඇත් වීම, ළංවීම, ඉපැරැණි නිල ප්‍රතිකාර මගින් පළමු ප්‍රතිකාරයේ සිටම සුවය.
කැඩුම් බිඳුම් ප්‍රතිකාර.
පාරම්පරික වෛද්‍ය ආර්. බී. පියතිස්ස
රත්න වෙද මැදුර
163/1, නිල්පනාගොඩ හන්දිය, මිනුවන්ගොඩ.
0776 060 950

සමීර ගජකේෂරි කරල්
තාරුණ්‍යයේ චමත්කාරය
ලිංගික ශක්තිය වර්ධනයට සහ ස්නායු දුබලතාවයට ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම සුදුසුයි
කරල් 40 රු. 500
ලිංගික රෝග පිළිබඳ සායන
බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා (පෙ.ව. 9.00 - ප.ව. 3.00)
නොමිලේ පැවැත්වේ.
දින වෙන්කරගෙන පැමිණෙන්න.
සුගත රසායනාගාරය (පුද්) සමාගම
E-Mail: suensuherbals@gmail.com
138/6, අඟුරුවාතොට පාර, හොරණ
034-22 61 306

බජාජ් / TVS යමහා ස්කූටර්
ඇතුළු යතුරුපැදි ලීසිං ඇති/ නැති මිලදී ගනු ලැබේ.
0772 357 347

පාඩම් අංක 31

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 24 - 190,000/-
කැරට් 22 - 170,000/-
කැරට් 21 - 150,000/-
කැරට් 20, 18,14, 09.
074 281 93 70

උකස් රත්තරං
ඔබ උකස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ
රන් පවුමකට 175000/=
0773109112

රංගනයට වරම්
වෙළඳ දැන්වීම් සඳහා පෙනී සිටිමට වයස 18-25 අතර සුරූපී යෞවනියන් අවශ්‍යයි.
41/12, මුදුන්ගොඩ, ගම්පහ
0770-630000 / 033-2257771

උකස් රත්තරං
උගසට තබා සින්නවීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරාදී වැඩි මිලකට මිලදී ගනුලැබේ.
දිවයිනපුරා සේවය
පවුම 233,000/-
077 - 609 38 70

ඔබත් කෙට්ටුද?
ස්ත්‍රී / පුරුෂ
ඔබගේ කෙට්ටුව නැතිකර පැහැපත් පිරිපුන් පෙනුමක් ලබා ගැනීමට අපගේ ආරක්ෂාකාරී ප්‍රතිකාර
පැමිණ හෝ තැපැල් මගින් ලබාගන්න
විමසීම් - 077 42 27 503 / 071 41 94 464
අධික තරබාරුව, පොතුකබර, අර්ශස්, දද කුෂ්ඨ, අකලට හිසකෙස් පැසීම, තට්ටය පැදීම, ඇතුළු සන්ධි රෝග සඳහා විශේෂ ප්‍රතිකාර
දේශීය ඖෂධාලය
කොළඹ නුවර පාර, මිරිස්වත්ත, ගම්පහ. (WK 7653)
(කොළඹ දෙසට යන බස් නැවතුම්පල අසල ඇති ෆාමසිය ලඟ)
(පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා) පෝය, සිකුරාදා නිවාඩු

## ධරණී මේ ඔබටයි!

ලස්සන කඳුන් තරුවක් නිල් අඹර කොනේ
පායා තිබේ දිවි ගමනට එළිය ගෙනේ
සසරේ පුරුද්දට ඔබ මුණ ගැසුණු දිනේ
මතකයි සඳ මට පෙම්බර කුමරියනේ

පුරවා දෙතොල් අග සුසිනිඳු හසරැල්ල
එමගින් ලබා දෙන මා හට සැනසිල්ල
මගේ හද ගැබෙහි මතු කළ සිතුවිල්ල
දිගුකල් දිනේවා 'ධරණී' සුදු කෙල්ල

- ඒ.හෙට්ටිආරච්චි
කළගෙඩිහේන

## අහිමි සෙනෙහස

ලියූ පදවැල් රස කරන්නට නොලී පදවැල් හදේ තිබුණා
කියූ දහසක් වදන් අතරේ නොකී රස රහසකුත් තිබුණා
පතන පැතුමන් පොදිය අතරේ සෙනේ පිරි පැතුමකුත් තිබුණා
නුඹට නොදැනුණ මහද ප්‍රේමය හමන මදනල දැනත් තිබුණා

සැබෑ නොවෙනා පැතුම් පුරමින් නෙත නිඳ නොනිඳම තිබුණා
නුඹේ හද පුදසුනෙ පුදන්නට මහද පෙම් මල් පිරී තිබුණා
සසරෙ කොතැනක හමු වුණාදෝ සිත මගෙන් විමසමින් තිබුණා
අනේ! මට පෙන්නුවේ නැති මුත් නුඹේ සෙනෙහස දැනී තිබුණා

- නිරෝෂා ලක්මාලි පතිරගේ
මාදුලාව

## තාත්තා

සුදු රැවුල්කොට දෙස බලා නුඹ
සිනාවුයේ කෙලෙස ඇසුවිට ඔබේ පිළිතුර
මගේ රන්කඳ දිලිසෙද්දි අද
මගෙ රැවුල ගැන තැවුල් කුමකට

නොවිඳි දුක් විඳ දෙඅත් පාකමල
කළුගල් පතුරු ලෙස රලුය පෙනුමට
බෙහෙත් කළගෙඩි හිස හොවා ගෙට
ගත් දිනය මගෙ
ඔබේ රළු පපු ගැඹුර දුටුවෙමි යන්තමින්
දෙඇස් අග මුතු කඳුළකින්
වචනයක්වත් පිට නොවූ විට ඔබගෙ මුවගින්
දෑස පමණක් පැවසුවා
හදේ ගැඹුරේ මා සිටින තැන

මළ පොතේ අකුරු නොදත් මහ පඬි
හරිහම්බ කළ සේසතම
දුන්නෙ ඒ ගුරු පඬුරු විලසට
ලෝබ නැතිදැයි ඇසූ විට හිනැහුණා මහ හඬින්
මගේ දෝණියා වැජඹෙද්දි දිනයක
කුමක් අවැසිද තවත් සැනසුම්

කුලගෙයින් නික්ම ගියදු කුවින්
මඟුල්බෙර ගැහුවේ ආඩම්බරෙන්
දණක් නොනැමූ හස්ති ගිරි රජ
පහත් ස්වරයෙන් ඇමතුවේ පුතුනි,
දුකක් දෙන්නට එපා කෙල්ලට
මලක් වගෙ මම් හැදුවෙ ඒකිව
උඹට වැඩිනම් එපා ගින්දර
ගෙනැත් දපන් මගේ රන්කඳ

- චචී

## සිරගෙදර පුතනුවනි

මේ ලොව පුතුනේ නුඹහට සිටියේ
ලේ කිරි කර පෙව් අම්මා පමණයි
ඒ අම්මාගේ හදවත රිදවා
නුඹ සිරගත වුණෙ වරදක බැඳිලයි

බාල වියේ මා නුඹ තුරුලට ගෙන
නැලවූ ගීතයෙ අරුත බිඳී යයි
තරුණ වියේ නුඹ සිර කුටියක විය
මවකට හිමිවුණෙ කඳුළක් පමණයි

කටුකොහොලින් පිරි මංමාවත්වල
පුත නුඹ යනෙනා මාවත සෙව්වා
නුඹේම මිතුරන් මා නෙත රවටා
මහ ගන අඳුරක නුඹ සැඟවූවා

තිඹිරි ගෙදර මහ දෙරටුව අබියස
අම්මා වැලපෙන හඬ නොඇසේවා
නිදහස ලැබගෙන නුඹ ගෙට එනතුරු
සතර වරම් දෙවි නුඹ රැකදේවා

- නිලන්ති ප්‍රනාන්දු
දුන්කන්නාව

## ජීවිතයක අරුත

පිපිලා රෝස කුසුමක්
ගෙමිදුලේ ඉස්සරහ පඳුරක
ඉගිළ ඇවිදින් පියාසලා
සියොත් කැල රොන් උරයි විගසින්

අනේ පසුදින මිදුල බැලූ මට
දිස් වුණේ පෙති හැලුණ නටුවක්
ඊයේ සුවඳින් පෙති විහිඳ වූ
නටුව ළඟ කෝ සියොත් කැළ දැන්

ජීවිතයෙ අර්ථයත් මෙය නම්
වටහ ගන්නට හැකිය මට නම්
ඇති හැකි විටෙක නම්
සිටිති සැම දෙන ළඟට වී ළං

- ජී.ජී.නාලනි අශෝකා
දික්හේන

## නුඹවන් කෙනෙක්

නුඹ තරම් අනුකම්පා කළ කෙනෙක්
නුඹ තරම් දයාබර වූ කෙනෙක්
නුඹ තරම් සෙනෙහස දුන් කෙනෙක්
තවත් නැ මට මේ ලෝකයේ


නුඹ තරම් මා සැක කළ කෙනෙක්
නුඹ තරම් මා රිද වූ කෙනෙක්
නුඹ තරම් මා හැඬවූ කෙනෙක්
තවත් නැ මට මේ ලෝකයේ

- දිල්රුක්ෂි පෙරේරා
මණ්ඩාවල

## කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත
ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න
සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක



## මගේ කුසට වඩිනු දෝණියේ

වීත්ත මල් ගවුම ඇඳන්
කොණ්ඩ කරල් දෙක වන වන
මා යන මග මල් වැට ළඟ
ඉන්න දෝණියේ
මගෙ නොවුණත් මගෙ වාගේ දැනෙයි දෝණියේ

මල් නො පිපුණ මල් ගස වගේ
දුවෙක් නොමැති මගේ ගෙදර
මේ භවයේ අහිමි වුණත්
එන භවයේ මගේ කුසට
වඩිනු දෝණියේ

අවිහිංසක කොමල බවත්
ලැජ්ජා බය හැඳුන කමත්
මලක් ලෙසට ලැබුණ රුවත්
මේ හැම දෙය මිට මොලවන්
එන භවයේ මගේ කුසට
වඩිනු දෝණියේ

- සඳකාන්ති කල්දේරා
කෝට්ටේ

## සිතට දැනෙන දෑ

හද රිදෙයි නෙතු පෙඟෙයි
නමුත් ඉවසුම් ගෙනෙයි
ගල් බොරලු කටු පඳුරු මතින් ආ
දිගු ගමන විඩාදේ

දෙපා මගෙ රිදුම් දේ
ආ මග දුරයි ඇති දුර කෙටියි
මාවතේ පිපුන කුසුම්
දිරිය දුනි දිවි මගට

දැනෙන මේ සතුට හා සිත්තැවුල්
මිහිරි ලෙස සිතට ගම්
වැරදි ඇති අයට නැති අයටත්
එක සේ මෙත් වඩමි

කෙදිනක හෝ යා යුතුය
අතට ගත් දේ අතහැර
සිතට ගත් දේ පමණි
මතුවට ගෙන යා හැකි
එය තමා සොබාදම

- බී.ඇඩ්ලින්
මීගහතැන්න

## ගුරු සිත

හිඳ ගනිමි මම හෙමින් උඳුපියලි පලස මත
අදත් හුරුපුරුදු ලෙස සොයමි මම ඔබෙ දෙනෙත
ඔබෙ සිනා රැළි අතර දකිමි මම ඔබේ සිත
පුංචි දියණියේ අපි කියවමුද හෝඩි පොත

හිරුගෙ රැස් බාල වී මැකී යන වෙලාවේ
මද පවන හෙමින් දඟකාරකම් කලාවේ
ඉන්න බැහැ මට තවත් මෙවන් හුදෙකලාවේ
දියණියේ ලියමු අපි අකුරු වැලිතලාවේ

- ආරියවතී වාගීස්
කුරුණෑගල

## පෙම්බර අම්මා

පෙම්මා ගුණ සිසිල ඉහළම දක්නයකි
නම්මා ගත් කුසල කරුණා විස්මයකි
නිම්මා නැති සෙනෙහෙ සුවඳැති පද්මයකි
අම්මා කියන්නේ ඉස්තිරි රත්නයකි

තැවුලට පත් නොවී දරු පෙම නම්මාය
අවුලට තිබුණු දේ පිළිවෙල දැම්මාය
හවුලට උරුමකම නිසි ලෙස පෙම්මාය
පවුලට සොඳුරු බව දුන්නේත් අම්මාය

කළ පින් බොහො තිබේ බව ගමනට පෙම්මා
මැනවින් ලබා ගෙන බුදු සරණය සම්මා
සවනින් දම් අසා දුක කරමින් නිම්මා
නිවනින් නිවේවා මගෙ පෙම්බර අම්මා

- චන්ද්‍රානි සුහසිංහ
අළුබෝමුල්ල

## නුඹයි ඒ ගැහැනිය

දමා තනිකර මා ගෙපැල තුළ
කඳුළක් තබා නෙතු අග
දුබල මා කය අතහැර
ගොම්මන් අඳුරට අත වනමින්
ඇය ගියා මා මගහැර
පාගා දමන අග හිඟ
පලවා හරින නුඹ ගත
වත මඬල සිනහා පුරවා
හද මඬල සෙනෙහෙ තවරා
අරුණළු කැරළි නැගෙනා අලුයමේ
පැමිණියා මගෙ කුටියට
වත්සුණු සුවඳ නැහැවෙන නුඹ ගත
මත් කළා මා ගිලන් වූ සිත
අසන්නට බැහැ මට
නුඹ ගිය ගමන් මග
මා කුසගිනි නිවන
එකම ගැහැනිය නුඹම වූ නිසා

- ටී.ඒ.ඒ.එදිරිසූරිය
හිඳගොල්ල




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.